
සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2556කේ වූ නවම් මස (ව්‍යවහාරික වර්ෂ 2013 පෙබරවාරි)

16 වෙනි කලාපය



## ලොව අති දුර්ලභ වූ පටිභාන කවීත්වය නැවතත්...

සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය



# උදම් අනන්නට නොව නිවී සැනසෙන්නට.....

රන්වැලි සෑය සහ ජය සිරි මා බෝධී
පින් බිම ජේතවන ථූපාරාමා දී
උන් පෙර සිවූ මුනිඳු දෙසු බණ සිත පෑදී
දැන් යළි මතුව එයි සිරි ලක් දෙරණේ දී

ඇත්තා අමුතු සිරියාවක් අහස් කුස
මෙත්තා ගලයි පුද බිම් පරිසරය පිස
සත්තා දෙව් මිනිස් බඹ දම් දුටුව බස
දත්තා ඇත තවම එදවස නැගුණු යස

සිරිපා මහිම කරුණා සිත නැගෙන වෙලේ
අරි දම් ඇසෙයි හද බැති මෙත් ගඟුලෙ ගිලේ
ගිරිහඹු සෑය පිහිටිය තිරිකුණා මලේ
දිරි දෙයි සිතට වැඳ සක්මන් කරන කලේ

ලෝවා මහාපායේ තෙද එ ගල් කණු
කීවා රහස් පෙර කල එහි සිදුම වුණු
මේවා තමයි නටඹුන් ලෝ දහම තැනු
දේවා නිවන් සුව ඉන් තුන් ලොවම දීනු

සෝමාවතී සෑ රජු මැද වැඩ හිඳිනා
සීමා නොමැති සොම් ගුණ නිති ලෙස රැඳිනා
ලෝ මා දුකින් මිදී මුනිඳුගෙ දා සොඳිනා
බෝමා බැති සිතින් දිවමන් ලෙස වඳිනා

තුන් ලොව එළිය කළ මුනි දම් හඬ රන්දා
සෙන්කඩ පුරවරේ සිට සත සිත බැන්දා
පින් බර හිමි සඳුන් දළඳා වැඩ ඉන්දා
දුන් රැකවරණයට සත හැම කල වැන්දා

මැද දේසයේ රහතුන් වැඩ සිටි පෙදෙසා
අද යළි මතුව එයි දම් පිරෙමින් හිදැසා
සැදැහැව පිරෙන්නට ඇති පුද බිම් මෙදෙසා
මඟ නැත බැතිමතුන් එයි දුර සිට විදෙසා

නොවී උදම් මේ දේවල්වලින් බැඳ
නිවී මිදෙන්නට මෙහි දම් රසින් විඳ
ගෙවී යනෙන හැම දේමත් සිතින් බිඳ
පෙවී දහම් පැන් වේවා නිවන් වැද

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# පින් කිරීම නිවන් මගට බාධාවක් ද?

මා කරන රැකියාව අනුව මට බොහෝ විට අන්තර්ජාලයේ සැරිසරන්න සිද්ධ වෙනවා. ඒ අතර අන්තර්ජාලයේ ඇති දහම් කරුණුත් මුනගැසෙන වාර අනන්තයි. ඉන් මගේ නෙත ගැටුණු ප්‍රධාන කාරණා කිහිපයක් තමයි මේ. "පින් කරන්න එපා, ඒක නිවන් මගට බාධාවක්, ඒකෙන් සසර ගමන තව දික් කරනවා, ඔය බෝධි පූජා තිය තියා ගස් වටේ දුවන එක බෞද්ධකම ද?, පිළිම වන්දනාව, පූජා තියන එක ආමිසයි, බුදු හාමුදුරුවො කිව්වෙ නිවන් දකින්න ඕන නම් ප්‍රතිපත්ති පූජාව කරන්න කියල." මේ ජාතියේ නොයෙක් මතිමතාන්තර තම තමන්ට හිතෙන ආකාරයට කියනවා. ඇත්තටම බුද්ධ දේශනාවේ මෙහෙම දේවල් තියෙනව ද ? මේක හොයල බලන්න ඕන කාරණයක්. මොකද එහෙම නිවන් දකින්න බාධාවක් නම් බුදු පියාණන් වහන්සේ පැහැදිලිවම ඒක දේශනාවේ සඳහන් කරනවා.

එතකොට පින් කියන්නෙ මොනවද?

පුඤ්ඤං චෙ පුරිසො කයිරා, කයිරා ථෙනං පුනප්පුනං, තම්හි ඡන්දං කයිරාථ, සුඛො පුඤ්ඤස්ස උච්චයො. (බුද්දක නිකාය * ධම්මපද පාළි * පාප වර්ගය * 52 පිටුව)

ඉහත ගාථා කොටසේ සරල සිංහල තේරුම නම්, යම් කිසි පුරුෂයෙක් (උතුමෙක්/උත්තමාවියක් පිනක් කළේ නම් ඔහු එය නැවත නැවත කරන්නේ ය. මක් නිසාද යත් ඔහු එයට ඇලුම් කරන නිසාය. ඇලුම් කරන්නේ එය සැප ගෙන දෙන නිසාය.

මෙයින් පැහැදිලි වන කාරණය නම්, පින නිසා සැප ගෙන දෙන බවයි, යම් කිසි සුවයක් ගෙන දෙන බවයි. කොහොමද මේකෙන් සුවයක් ලැබෙන්නේ? සරල උපමාවක් අරගෙන බලමු.

අපි හිතමු හිඟන්නෙක් ගෙදරකට එනව කියල. මේ මනුස්සයා පුදුම බඩගින්නකින් ඉන්නේ. ඉතින් ගෙදර ඉන්න කෙනෙකුගෙන්, අනේ මට හොඳටම බඩගිනියි, කන්න මොකුත් දෙන්න පුළුවන්ද කියල ඉල්ලනවා. ගෙදර ඉන්න කෙනත් ගුණ යහපත් කෙනෙක් නම් ඔහු ඒ හිඟන්නාට කන්න මොනව හරි ගෙනත් දෙනවා. දැන් අර හිඟන්නා තමන්ගෙ බඩ පුරවගෙන නොවඳිනා වැඳුම් වැඳලා, ඒ කරපු උදව්වට ස්තුති කරල යනවා. දැන් ගෙදර මනුස්සයාට හිතේ සතුටක්, සංතෝසයක් එනවා, අනේ මම ඒ මනුස්සයගෙ බඩගින්න මොහොතකට හරි නිව්ව නේද කියල. මේ සතුට පිනා යෑමට තමයි පින කියන්නේ.





ඒ වගේම හිතට පිනා යෑම එන ක්‍රම දෙකක් තියෙනවා. අලෝභයෙන්, අද්වේශයෙන් සහ අමෝහයෙන් කරපු ඉහත ක්‍රියාවෙන් එන පිනා යෑම එකක්. ඒකෙන් තමයි පුණ්‍ය කර්මයක් කියන ගොඩට දාන්න පුළුවන් ක්‍රියාවක් සිද්ධ වෙන්නේ.

අනෙක් ක්‍රමය නම්, "මම දුන්නා උගේ කෙහෙල් ගහට වැඩක් ! දැන් ඕකා බලනව ඇති කවුද මගේ කෙහෙල් කැන කැපුවෙ කියල, හැහ් හැහ් හැහ් !" මෙහෙම කියල හිනාවෙන අයත් ඉන්නවා. ඒකෙනුත් යම් පිනා යෑමක් වෙනවා. හැබැයි ඒ පිනා යෑම පිනක්, පුණ්‍ය කර්මයක් කියල ගන්න බෑ. ඊට හේතුව ඒක කෙනෙකුට අවැඩක්, අසාධාරණයක් කරල ගත්ත පිනා යෑමක් නිසා. ඒක සම්පූර්ණයෙන්ම පාප කියන කොටසට වැටෙන එකක්. මේ වෙනස තේරුම් ගත යුතුයි.

ඉහත සඳහන් කළ පින යම් කිසි පෘථජ්ජන මනුස්සයෙකුට කරපු උපකාරයක් හෝ යම් දුන් දෙයක් අනුව කර ගත්ත පිනක් වෙනවා. ඒ ඒ මට්ටමෙන් ඒ උපකාරය හෝ දුන් දේ ලබන කෙනා අනුව කරපු පිනේ බලවත්කම අඩු වැඩි වෙනවා. උපරිමයෙන් ලැබෙන්නේ ශාසනය උදෙසා කරපු පින්වලින්. ඒවා මහත්ඵලයි මහානිසංසයි. ඒ ඒ මට්ටම් ගැන මනා විග්‍රහයක් මජ්ජිම නිකායේ තුන්වැනි පොතේ එන <u>දක්ඛිණා විභංග සූත්‍රයේ</u> සඳහන් වෙනවා.

**ඒවගේම පිනක් කිරීමේදී එන වැදගත් කරුණක් තමයි, ඒ පින කරන්න හිතට ආපු මොහොතේම ක්‍රියාත්මක වීමේ වටිනාකම.** සල්ලි හම්බ වෙච්ච දවසක කරනවා, පස්සෙ කරනවා..... ආදී වශයෙන් කල් දැමීම එහි ඇති ලැබීම බාල කරනවා. පහත ධම්මපදට්ඨ කතාවෙන් උපුටා ගන්නා ලද බුද්ධ දේශනය මීට කදිම උදාහරණයක්.

"මහණෙනි, යම් හෙයකින් මේ ඒකසාටක තෙම (එකම සළුවක් තිබුනු කෙනා) ප්‍රථම යාමයෙහි (ඔහුට සිතුන මොහොතේම) මට ඒ සාටකය දීමට පුළුවන් වූයේ නම් සියල්ල සොළස බැගින් ලැබෙන්නේය. යම් හෙයකින් මධ්‍යම යාමයේ දීමට හැකි වූයේ නම් සියල්ල අට බැගින් ලැබෙන්නේය. උදෑසනම දීගත හැකිවූ හෙයින් සියල්ල හතර බැගින් ලැබීය. යහපත් වැඩ කරන්නහු විසින් උපන් සිත නොනසාගෙන එකෙණෙහිම කළ යුතුය. පසු වෙවී කළ කුසලයෙහි විපාකද පසු වෙවී අඩු වෙවී ලැබෙයි."

මේ තාක් පෙන්වා දුන් කරුණුවලින් පැහැදිලි වූ වැදගත් කරුණ නම් පින නිසා ලැබීම ඇති කරන බවයි.

එහෙනම් බුදු පියාණන් වහන්සේ පින් කරන්න එපා කියල කිව්වද?

මහණෙනි, පුණ්‍යයනට නහමක් (නොවව්) බිය වවු. මහණෙනි, යම් මේ පුණ්‍ය යන ශබ්දයෙක් වේ නම් තෙල සුඛයට නමෙකි. මහණෙනි, මම දීර්ඝ රාත්‍රයෙහි(බොහෝ කලක්) කරන ලද පුණ්‍ය කර්මයන්ගේ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ දීර්ඝ රාත්‍රයෙහි පුන පුනා විඳිනා ලද විපාක මොනවට දනිමි. අං.නි(4) 413 පිටුව - <u>මාපුඤ්ඤභායි සූත්‍රය</u>

ඉහතින් සඳහන් කළේ සියල්ල දත් බුදු පියාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාට දුන් අවවාදයි. මේකෙ සරල සිංහල අදහස අරගෙන බලමු. "මහණෙනි, නුඹලා කිසිවෙකු පිනට

බය වෙන්න එපා. පින කියන්නේ සැපයට කියන තව නමක්. මේ දීර්ඝ වූ සංසාරයේ මා කරන ලද පින්වල ඉෂ්ට වූ සැප ගෙන දෙන වින්ද විපාක මම හොඳින් දනිමි."

ඉතින් මේ පින්වලින් සසර ගමන හදනව නම්, උන්වහන්සේ මෙහෙම දේශනාවක් කිසිවිටෙකත් කරන්නෙ නෑ. උන්වහන්සේ පෙන්වූ ආකාරයට **පිනෙන් ලද ලැබීම නිවන් කරා යන්න මහත් උපකාරයක්, පහසුවක් වෙනවා.** ඒක හරියට ගමනක් යන කෙනෙක් ඒ ගමනට අවශ්‍ය බඩුබාහිරාදිය කලින්ම මල්ලකට දමා ගෙන ලෑස්ති වෙනව වගේ. දත් බුරුසුව, සබන් කැටේ, තුවාය, වැඩිපුර ඇඳුම් කීපයක්, මුදල්.... ආදිය උදාහරණ විදියට ගන්න පුළුවන්. මේනිසා ඔහුට ගමන යන්න පහසුයි. "අයියෝ දත් බුරුසුව දාල ඇවිල්ලනේ, මේ හරියෙ ගන්න කඩේකුත් නෑ" මේ වගේ අනවශ්‍ය අපහසුතාවලට මුහුණ දෙන්න වෙන්නෙ නෑ.

එහෙනම් පින උපකාර වෙනව කියල බුද්ධ දේශනාවක් තියෙනවද?

සැවැත් නුවර හිටපු සුමනා නම් සිටු දුවක් බුදු පියාණන් වහන්සේගෙන් අහපු ප්‍රශ්න කීපය මේ ගැන වැදගත් සාක්ෂියක් විදියට ගන්න පුළුවන්. මේ සිටු කුමරිය අහපු ප්‍රශ්න ටිකට උන්වහන්සේ දුන් පිළිතුරු අනුව, පින නිවන් මගට කොච්චරනම් උපකාර වෙනවද කියන කාරණය සම්බන්ධයෙන් අපට නිගමනයකට එන්න පුළුවන්. (අංගුත්තර නිකාය (3) සුමනා වර්ගය - සුමනා සූත්‍රය)

සුමනා සිටු දුව - ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මේ බුද්ධ ශාසනයේ ශ්‍රද්ධාව තියෙන, සීලය තියෙන, ඒ වගේම ප්‍රඥාව තියෙන ශ්‍රාවකයෝ දෙන්නෙක් ගනිමු. නමුත් එක්කෙනෙක් දන් දෙනවා, පින් කරනවා. අනෙක් කෙනා එහෙම දන් දෙන්නෙත් නෑ, පින් කරන්නෙත් නෑ. මේ දෙන්නා මරණින් පස්සෙ දෙව් ලොව ඉපදුනාම, මේ දෙන්නගෙන් පින් කළ කෙනා හෝ පින් නොකළ කෙනා කියල වෙනසක් ඇති වෙනවද ?

බුදු පියාණන් වහන්සේ - ඔව් සුමනාවනි, එහෙම ලොකු වෙනසක් තියෙනවා. මේ දෙන්නම දෙව් වූවානම්, දිව්‍ය ආයුෂයෙන්, දිව්‍ය වර්ණයෙන්, දිව්‍ය සැපයෙන්, දිව්‍ය යසසින් සහ දිව්‍ය ආධිපත්‍යයෙන් කියන කාරණා පහෙන් දන් දුන් පින් කළ කෙනා, දන් නොදුන් පින් නොකළ කෙනා අභිබවා යනවා.

බුදු පියාණන් වහන්සේ දුන් මේ පිළිතුරෙන් කරුණු දෙකක් පැහැදිලි වෙනවා. වැදගත්ම කාරණය නම් **පින අනුව ඉපදෙන තැන තීරණය නොකරන බවයි.** කොහොමද එහෙම කිව්වේ? සුමනා සිටු දුව අහපු ප්‍රශ්නය තුල වැදගත් කොටස් තුනක් තියෙනවා. එනම් ශ්‍රද්ධාව, සීලය, ප්‍රඥාව කියන මේ කාරණා තුන. ඒක කෙළින්ම අලෝභ, අදෝස, අමෝහ වෙනවා. ඒකෙන් තමයි උපදින තැන තීරණය කරන්නේ.

එතකොට **දන් දීමෙන්, පින් කිරීමෙන් ඒ උපන් තැන ලැබීම ඇති කරනවා.** ඉහත පුද්ගලයන් දෙන්නාම දෙව්ලොව ඉපදුනා. නමුත් ලැබීම අතින් දන් දුන් කෙනා, නොදුන් කෙනාට වඩා ආයුෂ, වර්ණ, සැප, යසස සහ බලය අතින් අභිබවා ගියා.

දැන් එහෙනම් මේ ටික කොහොමද නිවනට උදව් වෙන්නේ?

නිවන් මග යන කෙනාට ආයුෂ වැදගත් කාරණයක්. බණ පදයක් අහන්නත් කලින් හෝ අහන්න සුදුසු කාලයක් එන්න කලින් හෝ අකාලයේ මියගියොත් මොකක් වෙයිද? මේ නිසා ආයුෂ තියෙන්න ඕන. ඒ වගේ තමයි වර්ණය. හැබැයි මේ කියන්නේ ඇගේ පාටක් ගැන නෙවෙයි. මෙයින් කෙනෙක් තුල ඇතිවන ප්‍රබෝධය විස්තර කරනවා. ප්‍රබෝධය නැතිව කම්මැලිකම, කුසීත බව තිබුනොත් බණක් අහනවා තියා අහලකටවත් යන්න හිතෙන්නෙ නෑ. සැපය කියන්නේ තමන් ඉන්න තැන සුවසේ ඉන්න ලැබීමයි. යන යන තැන දුක් විඳින්න වෙනව නම්, මදුරුවො කකා ඉන්න වෙනව නම්, හිරිය තැනත් තෙමෙන, අව්වට පිච්චෙන තැනක් නම් ඒකත් බණ අහන්න බාධාවක්. ඊළඟට යසස. බණ කියන තැනට යන්න අතේ සතයක් නැත්තම්, තව කෙනෙක් එක්ක යන්න වෙනවා. ඔහු එනකල් ඉන්න වෙනවා. ඒකත් බාධාවක්. එතකොට බලය අවශ්‍ය මොකටද? මේ කියන්නෙ අනෙකා තලා පෙලා ඉන්න බලයක් ගැන නෙවෙයි. කාටවත් යටහත් පහත් නොවී ඉන්න එකක්. කාගෙ හරි දාසයෙක් නම්, ඒ ස්වාමියා අවසර දෙනකල් බණක් තියා වැසිකිලියට යන්නත් බලන් ඉන්න වෙනවා.

ඉතින් ඔය වැදගත් කාරණා පහ පින නිසා ලැබෙනවා. එහෙනම් පිනෙන් ලැබුනු දේ නිවන් මාර්ගය වඩන්න පහසුවක් මිසක් බාධාවක් නොවන බව මේ වෙනකොට වැටහිලා තියෙන්න ඕන.

එතකොට මේ කාරණා එක්ක නිවන් මාර්ගයේ ගමන් කිරීමේ වෙනසක් තියෙනවද? ඔව්, පැහැදිලි වෙනසක් තියෙනවා. ඉහත සඳහන් කළ සුමනා සූත්‍රයේ අවසන් කොටසින් ඉතා වැදගත් කරුණු අනාවරණය කරගන්න පුළුවන්.

සුමනා සිටු දුව - ස්වාමීනි, ඉහත දෙවියන් දෙදෙනා ඒ දිව්‍ය ලෝකයෙන් චුත වෙලා මනුස්ස අත්බැවක් ලැබුව කියල හිතමු. දැන් ඒ දෙන්නා ගිහි ගෙය අතහැරල පැවිදි වුනා කියල හිතමු. එතකොටත් මේ දෙන්නගේ එනම්, දන් දීල පින් කරපු කෙනාගෙයි, දන් නොදුන් පින් නොකළ කෙනාගෙයි විශේෂත්වයක් තියෙනවද ?

බුදු පියාණන් වහන්සේ - ඔව් සුමනාවනි, පැහැදිලි වෙනසක් තියෙනවා. දන් දුන් කෙනාට බොහෝ වශයෙන් සිවුරු පිරිකර භාවිතා කරන්න ලැබෙනවා, නොදුන් කෙනාට අඩුවෙන් ලැබෙන්නේ. දන් දුන් කෙනාට බොහෝ කොට පිණ්ඩපාතය ලැබෙනවා, නොදුන් කෙනාට අඩුවෙන් ලැබෙන්නේ. දන් දුන් කෙනාට බොහෝ කොට සේනාසන ලැබෙනවා. නොදුන් කෙනාට ලැබෙන්නේ අඩුවෙන්. දන් දුන් කෙනාට බොහෝ කොට ගිලන්පස බෙහෙත් ආදිය ලැබෙනවා, නොදුන් කෙනාට ලැබෙන්නෙ අඩුවෙන්. දන් දුන් කෙනාට මනාප උපහාර ලැබෙනවා, අමනාප උපහාර අඩුවෙන් ලැබෙන්නේ. නොදුන් කෙනාට ඒකෙ අනෙක් පැත්ත. ඔය විදිහට දුන් කෙනා නොදුන් කෙනා අභිබවා යනවා.

දැන් පැහැදිලි වෙනවා, බුද්ධ ශාසනයේ පැවිදි වුවත් පෙර කරපු පින්වල ඵල කිසිම අඩුවක් නැතිව ලැබෙනවා කියල. දැන් ප්‍රශ්නයක් එන්න පුළුවන් (සුමනා සිටු දේවියට ඒ ප්‍රශ්නය තිබුනා) ඔය **සුඛ මාර්ගයේ පෙර පින් ඵල භුක්ති විඳිමින් නිවන් පූර්ණ කරපු කෙනාගෙයි, දුක් විඳගෙන නිවන් පූර්ණ කරපු කෙනාගෙයි වෙනසක් තියෙනවද** කියල.

එතකොට බුදුන්වහන්සේ දුන් පිළිතුර තමයි මේ. "සුමනාවෙනි, මේ කාරණය ගැන නම් කිසිම වෙනසක් මම කියන්නෙ නෑ. දන් දුන් පින් කළ කෙනා පූර්ණ කළ අරිහත් ඵලය සහ දන් නොදුන් පින් නොකළ කෙනා පූර්ණ කළ අරිහත් ඵලය අතර කිසිම වෙනසක් නෑ. ඒ විමුක්තිය එකමයි."

අවසානයේ බුදුන්වහන්සේ මෙහෙම දේශනා කරනවා. "සුමනාවනි, දන් දිය යුතුමය, පින් කළ යුතුමය, දෙව් වූවන්ටත් පින උපකාරි වේ, මිනිස් වූවන්ටත් පින උපකාරි වේ, පැවිදි වූවන්ටත් පින උපකාරි වේ."

දැන් පැහැදිලියි සසර ගමන නිමා කර ගන්න පින උපකාරයක් වෙනවා මිසක් බාධාවක් නොවෙන බව.

එතකොට බුදු පියාණන් වහන්සේ මාර දිව්‍ය පුත්‍රයාට, අලුයම හෙලන කෙල පිඬක් සේ මම ඔය පින ප්‍රතික්ෂේප කරනවා කියල කිව්වෙ මොකද කියන ප්‍රශ්නය එනවා. ඇත්තටම උන්වහන්සේ ප්‍රතික්ෂේප කළේ පිනද? බුද්ධ දේශනාවේ කිසිම විටකත් පරස්පර තැන් තියෙන්න බෑ. මෙතන එකක් කියල තව තැනක තව එකක් කියන ක්‍රමයක් උන්වහන්සේ ළඟ නෑ. තුන් කල් දැකල සියල්ල සියලු ආකාරයෙන් දැකල දේශනා කරපු උත්තමයෙක් එහෙම කියන්නෙ නෑ.

එදා බුද්ධත්වයට පත්වෙන්න උත්සාහ කරපු මොහොතේ උන්වහන්සේ ළඟට මාර දිව්‍ය පුත්‍රයා ඇවිත්, "ස්වාමීනි, ඔබට සක්විති රජ වෙන්න පුළුවන් කිසිම ප්‍රශ්නයක් නැතිව. එහෙම කරන්න තවත් පින් දහම් කරන්න. මාත් ඔබ වහන්සේට උදව් කරන්නම්" කියල කිව්වම, එතකොට තමයි උන්වහන්සේ කිව්වේ, මට ඔය පිනෙන් ලබන සක්විති රජකමෙන්

වැඩක් නෑ කියල.

එතනදී මාරයා යම් කිසි පැවැත්මක් වර්ණනා කළා. ඒ පැවැත්ම වෙනුවෙන් පින් දහම් කරන්න කිව්වා. පැවැත්ම මුලිනුපුටා දමන්න උත්සාහ කරන වීරිය කරන උතුමෙකුට පැවැත්මක් වර්ණනා කරල හරි යනවද? එහෙම උතුමෙක් ඒක ප්‍රතික්ෂේප නොකර වෙන මොනව කරන්නද?

**පින් කිරීමේදී ඇති වන එක්තරා දුර්වල පැත්තක් තමයි පැවැත්මක් බලාපොරොත්තුවෙන් කරන පින් දහම්.** ඒ වගේ දෙයක් නම් බුදු පියාණන් වහන්සේ කිසිම විටක වර්ණනා කළෙත් නෑ, ඒවට අනුබල දුන්නෙත් නෑ. එක්තරා දෙවි කෙනෙක් බුදු පියාණන් වහන්සේ ළඟට ඇවිත් මෙහෙම අහනවා.

''ස්වාමීනී, ආයුෂ කෙටියි, ජීවිතය මරණය කරා යනවා. වයසට යන එකෙන් තවත් මරණයට ළං වෙනවා. මේ බය තුන තියෙන කෙනා යම් කිසි සැපයක් බලාපොරොත්තුවෙන් පින් කරන්නම ඕන.''

එවිට බුදුන් වහන්සේ දෙවියන්ට මෙහෙම පිළිතුරු දෙනවා.

''ජීවිතය මරණය කරා යනවා, ආයුෂ කෙටියි, ජරාව මරණය කරා ළං කරනවා. මේ බය තුන තියෙන කෙනා නිවන් දැකීම කළ යුතුයි. ඒ පුද්ගලයා ලෝක විෂය දුරු කරනවා.'' (දේවතා සංයුක්තිය සං.නි (1) 5 පිටුව උපනියති සූත්‍රය )

අනෙක් දුර්වල පැත්ත තමයි ඒ පිනෙන් ලැබෙන සම්පත්තියට ඇලුම් කිරීම. මෙන්න මේ ඇලුම් කිරීම තමයි සසර ගමන හදන්නේ. ඒකට තණ්හාව කියල කියනවා. තණ්හාව නම් දුටු තැන පහ කරන්න කියලයි දේශනාවෙ තියෙන්නේ.

පින නිවන් මගට උදව්වක්. ඒක පැහැදිලියි. ඒත් පින් කරන්න එපා කියන දෘෂ්ටිය කොහෙන්ද ආවේ?

"පුණ්‍යාපාප පහීනස්ස" කියල දෙයක් තියෙනවා. මේ අරිහතුන් වහන්සේ හඳුන්වන යෙදුමක්. සරල තේරුම නම් පින් පව් ප්‍රහීන කළ තැනැත්තා කියන එකයි. මෙන්න මේ කාරණය තමන්ට තෝරගන්න බැරුව, තමන්ගේ මත ප්‍රකාශ කරන්න ගිහින් කරගත්ත විකෘතියක් තමයි, ආර්ය මාර්ගය වඩනව නම්, ඔය පින් පව් දෙකම අතහරින්න ඕන, ඒක පූර්ණ කරන්න පින් එක්ක බැහැ කියන කාරණය.

හැබැයි මෙතන පව් අත්හැරීම කියන කොටස නම් හරි. ඒක කළ යුතුම දෙයක්. සබ්බපාපස්ස අකරණං කියන තැනට එන්න නම්, දස අකුසලයෙන් වෙන් වෙලා යන මාර්ගයක් ඕන. ඒක පාපය තුලින් යන ගමනක් නෙවෙයි. නමුත් ඉහත කාරණය පින් අතහරින එකට ගැලපෙනවද?

පහත බුද්ධ දේශනාවෙන් ඒකත් ලිහා ගන්න පුළුවන්. එක්තරා දෙවි කෙනෙක් බුදුන්වහන්සේ ළඟට ඇවිත් ගාථාවක් කියනවා. මේ තමයි ඒකෙ සිංහල තේරුම,

යමෙකින් යමෙකින් සිත වලක්වන්නේද එයින් එයින් ඔහුට දුක් නො පැමිණෙයි. සියල්ලෙන් සියල්ල සිත වලක්වන්නේද, ඔහු සියලු දුකෙන් මිදෙයි.

මේ කතාව හරියට ඉහත කියපු දෘෂ්ටියට සමාන කතාවක්. එනම් සියල්ල (පින් පව්) අතහැරියොත් නිවන් දකිනවා කියන දෘෂ්ටිය. මේකට බුදු පියාණන් වහන්සේ දුන්න පිළිතුර බලමු.

සියල්ලෙන් සිත නොවලකන්-නේය. සංයතභාවයට (නැතිනම් කුසලයට, පිනට බර වූ සිත) නොවලකන්නේය. යමෙකින් යමෙකින් අකුසල් වේ නම් එයින් එයින් සිත වලකන්නේය. (දේවතා සංයුත්තය සං.නි. (1) 27 පිටුව මනෝ නිවාරණ සූත්‍රය )

දැන් අපි කල්පනා කරල බලන්න ඕන පින් කරන්න එපා, ඒක නිවනට බාධාවක් කියල කියන උදවිය, බුදු පියාණන් වහන්සේ කියපු එකද කරන්නේ නැත්තම් අර දෙවියො කියපු එකද කරන්නෙ කියල.

එතකොට රහතන්වහන්සේට ඇයි පින් පව් ප්‍රහීණ කළා කියල කියන්නෙ? උන්වහන්සේ පව් කරන්නෙ නෑ කියන එක පැහැදිලියි. පින් කරන්නෙ නෑ නෙවෙයි, උන්වහන්සේට කරන්න පිනක් නෑ. ඒ කිව්වේ පිනක් (පිනා යෑමක්) කියල කරන්න පුළුවන් උපරිමය වුන අරිහත් ඵලය ලබපු උත්තමයෙකුට ඊට වඩා කරන්න දෙයක් නෑ. අන්න ඒකයි උන්වහන්සේ පිනත් ප්‍රහීණ කළා කිව්වෙ. පින් කරන්නෙ නෑ කියන එක නෙවෙයි. සැරියුත් මහරහතන් වහන්සේ සංඝයා වහන්සේලාට දන් දී එක්තරා ප්‍රේතයෙකුට පින් අනුමෝදන් කරපු අවස්ථාවක් ගැන ධර්මයේ සඳහන් වෙනවා. (ජේතවත්ථු, විමානවත්ථු)

දැන් එහෙනම් නිවන් මගට යොමුවෙන ආකාරයේ පිනක් කරගන්නෙ කොහොමද ?

**දැන හෝ නොදැන ශාසනය උදෙසා කරන සියලු පින්කම්වල මාවත සැකසිලා තියෙන්නේ නිවන් මග කරායි.** එහෙම කොහොමද වෙන්නෙ කියන ප්‍රශ්නයක් දැන් එනවා. මුලින් අපි බලන්න ඕන ශාසනය කියන්නෙ මොකක්ද කියල. ශාසනය කියන්නේ බුද්ධ, ධම්ම, සංඝ කියන ත්‍රිවිධ රත්නයයි. එතකොට අපි පැහැදෙන්නේ ත්‍රිවිධ රත්නයටයි. බුදුන්, දහම්, සඟුන් උදෙසා කරන පින් කවදාවත් අපතෙ යන්නෙ නෑ. කවදා හෝ නිවනින්ම කෙලවර වෙනවා. නමුත් තමන් පතන පැතුම අනුව දීර්ඝ කාලයක් සසරේ සැරිසරන්න පුළුවන්.

මේ ධම්මපද අට්ඨකතාවෙන් උපුටාගත් කොටසක්. සුමන මාලාකාරයා තම දිවි පරදුවට තබා බුදු පියාණන් වහන්සේ වෙනුවෙන් පූජාවක් කළා. ප්‍රාර්ථනාව වුනේ සැප සම්පත් නමුත්, ඔහු ආර්ය උතුමෙක් කෙරෙහි පැහැදීමෙන් කරපු පූජාවක් නිසා කවදා හෝ ඔහුටත් ගැලවීමක් තියෙනවා. ඒ ගැන බුදුන් වහන්සේ ආනන්ද තෙරුන් අමතා මෙහෙම දේශනා කරනවා.

"ආනන්ද, මේ මාලාකාර විසින් කුඩා දෙයක් කරන ලදැයි නොසලකව. මොහු විසින් මා වෙනුවෙන් දිවි පුදා මේ පූජාව කරන ලදී. (රජතුමාට ගෙනිච්ච මල් රජතුමාට නොදී රාජකාරිය පැහැර හැර බුදුන්ටයි පූජා කළේ. ඒක රාජ උදහසට ලක්වී හිස ගසා දමීමටත් හේතු විය හැකියි.) හෙතෙම මෙසේ මා කෙරෙහි සිත පහදවා කළ පිනෙන් කල්ප ලක්ෂයක් දුගතියට නොයයි. දෙවි මිනිසුන් අතර මේ හේතුකොටගෙන මහත්ඵල ලබා පසුව සුමන නමින් පසේ බුදුවරයකු වන්නේය.

මම මේ පින කරන්නේ උන්වහන්-සේලා උදෙසායි. උන්වහන්සේලා අවබෝධ කරගත් මාර්ගය මටත් අවබෝධ කරගන්නයි. ඒ මාර්ගය දුක් විඳගෙන යන්න මට උවමනාවක් නෑ, සැප හරහා ගමන් කරන ක්‍රමයකුත් තියෙනවා. එහෙම දැන දැනත් මට බොරුවට දුක් විඳින්න ඕන නෑ. මට සුවසේ ආර්ය මාර්ගය සම්පූර්ණ කිරීමට මේ පින උපකාර වේවායි කියන පැතුමෙන් කරන පින කවදා හෝ මහත්ඵල (සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අරිහත්) මහානිසංස (මහා ආනිසංසය වූ නිවන) වෙනවාමයි. වැඩේ බාල වෙන්නෙ, අනේ මට දෙවියෙක් වෙන්න තිබුණනම්, සක්විති රජ කෙනෙක් වෙන්න තිබුණනම් කියන හැඟීම ගත්තොත් තමයි.

අවසාන වශයෙන් **මොන සැප සම්පත් ලැබුවත් ඒ ලැබූ සැප සම්පත්වලට උරුම ලක්ෂණය වූ කැඩී බිඳී යෑම, එහෙම නැත්නම් කවුරු හෝ ඒවා කඩල බිඳල දැමීම අපට වලක්වන්න බෑ.** ඉතින් එවැනි දෙයක් "මම" කරගන්න "මගේ" කරගන්න එක සුදුසුද? ඒව රකින්න යන මහන්සියේ හරයක් තියෙනවද? මේ කාරණා තමන් තුලින්ම වටහා ගත්ත දාට, මට ඔය පිනෙන් කරන ලෝක පැතුමෙන් වැඩක් නෑ, පව් කරන්නෙත් නෑ කියන තැනට එන්න පුළුවන්. එතෙක් ලෝවැඩ සඟරාවේ එන මේ කාව්‍යමය අනුශාසනාවත් හිතට ගැනීම වැදගත්.

බණ නම් තිබොරුය මුනිවරයන්නේ
කය නම් නොතිරය අදහා ගන්නේ
පණ නම් තණ අග පිනි බිඳු වැන්නේ
පින නම් නොපමාවම කරගන්නේ

*වෑරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ෆික්රි ඉස්මයිල්**
පරිගණක ඉංජිනේරු
ගොතටුව

# භාෂාව පරිණාමය වුණත් දහම් අදහස නොවෙනස්ව ගත හැකි මාගධී ප්‍රාකෘත ක්‍රමය

*(පසුගිය කලාපයෙන් - උපමා උපමේය සංසන්දනයෙන් අඩි වචනවල නිරුක්ති සොයාගන්නා හැටි)*

බුදුන් වහන්සේ පෙන්වා දුන් පද නිරුක්ති කියන ඒවා ව්‍යවහාර භාෂාවෙන් ගොඩනැගිච්ච දෙයක් මිසක් භාෂා නීති රීතිවලින් හදපු එකක් නෙවෙයි. නමුත් භාෂාවක තියෙන වේද ශාස්ත්‍ර පැත්ත මුල්කරගෙන, හදාගත්තු භාෂාවකින් තමයි අපි අද කතා කරන සිංහල භාෂාවත්, අනෙක් හැම භාෂාවක්මත් සංස්කරණය වෙලා තියෙන්නේ. ඒවා හැදුණු හැටි කෙටියෙන් දැනගන්න එක හොඳයි. මොකද බුදුන් වහන්සේ පෙන්වා දුන් මාගධී ප්‍රාකෘත ක්‍රමය අතහැරලා ඒකට උමතු ප්‍රාකෘත කියල ඒ නියම ක්‍රමය වෙනස් කරල, පසුව හදාගත් මේ භාෂා විශාරදයන් ලෙස පෙනී හිටපු අය ඒ සඳහා යොදා ගත්තේ එදා තිබූ බමුණන්ගේ වේදයයි. දැන් තියෙන වට අකුරු ශාස්ත්‍රය හදා ගත්තේ මේ ප්‍රශ්නය මුල්කර ගෙනයි. ඒ වගේම බුදුන් වහන්සේත් පෙන්වා දුන්නා ධර්මය සංස්කෘත භාෂාවට නගන්න එපා කියන කාරණය. මේ නිසා එදා හිටපු බමුණන්ගේ ආචාර්ය-වරුන් ඒ සඳහා වෙනත් උපක්‍රමයක් යොදා ගත්තා.



එදා සංස්කෘතයට පරිවර්තනය කළේ එදා තිබුණු සංස්කෘත අකුරුවලින්. ඒක එපා කිව්වම දැන් අපි සංස්කෘත අකුරුවලින් නෙවෙයි දෙන්නේ වෙනත් අකුරු වර්ගයකින් කියල, ඒකට උපක්‍රම ලෙස වට අකුරු හැදුවා. ඒ හදපු වට අකුරු පසුකාලීනව, මේව උඹලගෙ ඒවයි කියල සිංහලයන්ට දුන්නා. පාලිවලටත් ඒ අකුරුමයි කියල එතැනත් රැවැට්ටුවා. ඉන් පසු පාලි අකුරුයි, සිංහල අකුරුයි, සංස්කෘත අකුරුත් මේවයි කියල අලුත් සංස්කෘතියක අකුරු හදා ගත්තා. ඊළඟට මොකද වුණේ සංස්කෘත භාෂාවයි, සිංහල භාෂාවයි, පාලි කියන ලිඛිත භාෂාවයි මේ තුනම වට අකුරින් ලියන්න ගත්තා. දැන් මේ තුනම එකයි. වෙනසකට තිබුණේ එදා ''අ'' යන්න ලියන්න යම් කිසි ආකාරයක සංස්කෘත අකුරක් ගත්ත නම් පසුව ඒක වට අකුරෙන් ''අ'' යන්න විදියට ලියන්න ගත්තා. අනෙක් අකුරුත් මේ විදියට වට අකුරුවලට වෙනස් කළා. එතකොට ඒක තමයි සංස්කෘත භාෂාවේ ලිඛිත භාෂාව කරගත්තේ. නමුත් පරිවර්තනය කරල පොත්වලට ගන්න එපා කිව්වෙත් මේකෙන්මයි. ඒකට උපක්‍රමයක් විදියට ''අ'' යන්න වෙනුවට වෙන හැඩයකුත්, ''ආ'' යන්න වෙනුවට වෙනත් හැඩයකුත් ආදේශ කරල, මේ ආදී ලෙස අකුරුවල ඇලපිලි පාපිලි හැඩගහලා වෙනත් ක්‍රමයක් කෘතිමව හැදුවා. ඒ හදපු එකම තමයි ක්‍රමානුකූලව ඇවිදින් දැන් තියෙන වට අකුරු ශාස්ත්‍රය බවට පත් වුණේ.

දැන් ඉතින් කැලයකින් කැලයකට මාරු කළා වගේ වැඩක් තමයි කරල තියෙන්නේ! කැලෙන් කැලේට පැන්නට කොටියගෙ පුල්ලි මාරු වුණේ නෑ. පුල්ලිය එහෙමමයි. මේ වගේ තමයි එදා හිටපු භාෂාවේදීන්ගේ තිබුණු ව්‍යාකරණ රටාවන්, නිරුක්ති රටාවන්, පද බෙදන රටාවන් ආදී භාෂා ප්‍රාකෘත ක්‍රමවේදයක් තිබුණ ද, ඒ සියල්ලම අපේ භාෂාවට ඇඳුවා. එහෙම ඇඳලා මෙන්න සිංහල භාෂාවේ ව්‍යාකරණ, පද බෙදීම්, මෙන්න පාලි භාෂාවේ ව්‍යාකරණ ක්‍රමය, පද බෙදීම්, නිරුක්ති ක්‍රමය ආදී ලෙස කියමින් ඒ අයගේ එදා තිබුණු රටාවම මේ භාෂාවලටත් දුන්නා. එහෙම දීලා මේක සිංහල ක්‍රමයයි, මේක පාලි ක්‍රමයයි කිව්වා. නමුත් මේක බුදුන් වහන්සේ දීපු ක්‍රමයක් නෙවෙයි. එදා හිටපු භාෂා ආචාර්යවරු දීපු ක්‍රමයක්මයි. එහෙම දීපු එකට මාගධී නිරුක්ති කියන්න පටන් ගත්තා, බුදුන් වහන්සේ පෙන්වපු ක්‍රමයට උමතු ප්‍රාකෘත කියන්නත් පටන් ගත්තා. නමුත් මේ අය හඳුන්වා දුන් භාෂා ක්‍රමයේ මාගධී නිරුක්තිය අහලකවත් නෑ. මේ තමයි බුදුන් වහන්සේ පෙන්වා දුන් ක්‍රමවේදය පටලවන්න යොදපු උපක්‍රම. ඉතින් ඒ පටලවා ගැනීමයි අද වෙනකොට සිද්ධ වෙලා තියෙන්නේ.

අනෙක් කරුණ **තමයි දැනට භාවිතා කරන** වට අකුරු **ශාස්ත්‍රය** යොදාගෙන කරන **මේ** ලිඛිත **භාෂාව** අවුරුදු දාහකටත් **මෙහා** **හදාගත්තු එකක් මිසක්, ඉන් පෙර පාවිච්චි කළයි කියන්න කිසිම සාක්ෂියක් තවමත්** හමුවෙලා නෑ. හැබැයි මේ කියන්නේ වට අකුරු ශාස්ත්‍රය ගැන. මේ නිසා **දැනට පවතින පොත්පත්වල තියෙන ධර්මය ග්‍රන්ථාරූඪ ගත කරල තියෙන්නේ මේ කියන වට අකුරු ශාස්ත්‍රය හැදුනටත් පසුවයි.** ඊට පෙර වට අකුරු භාවිතා කළ බවට කිසිම සාක්ෂියක් හමුවෙලා නෑ. අවුරුදු දාහකින් මෙහා හරි අහුවුණොත් පුස්කොළ පොතක් තමයි. හැබැයි ක්‍රි.ව. 500 වැනි කාල සීමාවල දී ලියවුණු මහායානාදී වෙනත් පොත් නම් කෞතුකාගාරවල තියෙනවා. ඒත් සිංහල වට අකුරු නෙවෙයි. නමුත් බුදුන් වහන්සේ පෙන්වා දුන් මූල මාගධී භාෂාව කියන එක අද තියෙන සිංහල භාෂාවටවත්, ☞

පාලි භාෂාවටවත් ගළපන්න බෑ. මොකද අපි අද කතා කරන භාෂාව හෝ වට අකුරු ශාස්ත්‍රය හෝ අවුරුදු 1000 කින් එහා තිබුණයි කියල ඔප්පු කරන්න කිසිම සාධකයක් නෑ. සෙල් ලිපි නම් තියෙනවා, ඒත් වෙනත් භාෂාවකින්. දැන් තියෙන වට අකුරු සහිත සිංහල භාෂාවෙන් අකුරක්වත් ලියවෙච්ච සෙල් ලිපියක් නෑ. ඔක්කෝම වගේ තියෙන්නේ බ්‍රාහ්මීය අක්‍ෂරවලින්. එහෙම නැත්නම් නාගර අක්‍ෂරවලින්. ඒවායේ තියෙන වචනත්, අකුරුත් ශබ්දත් දැන් තියෙන අපේ භාෂාවට වඩා වෙනස්.

උදාහරණ විදියට ''අගත අනගත චතුදිස සගස දිනේ'' කියන වැකිය ගල් ලෙන් ආශ්‍රිත බොහෝ සෙල් ලිපිවල සඳහන් වුණත් ඒ භාෂා රටාවත්, ශබ්දයත් අපි දැන් භාවිතා කරන එකට වඩා වෙනස්. ''පැමිණි නොපැමිණි සිව් දිගින් පැමිණෙන සංඝයා උදෙසා පූජා කරන ලදී'' යනුවෙන් අද අපි අපේ භාෂාවෙන් මේක කිව්වත්, දැනට අවුරුදු දාහකට පමණ එහා හදපු ගල් ලෙන් ආශ්‍රිත සෙල් ලිපිවල පෙන්වන්නේ අර කියපු බ්‍රාහ්මීය හෝ නාගර අක්‍ෂරවලින්. මේ අදහස අද තියෙන පාලි භාෂාවෙන් කියනව නම් ''ආගතා නාගතස්ස - චාතුද්දිසස්ස සංඝස්ස දේම'' ලෙස විය යුතුයි. නමුත් එදා ඒක තිබුණේ ''අගත අනගත චතුදිස සගස දිනේ'' කියලයි. අකුරු සහ පදවැල් දෙකම වෙනස්. එතකොට සීගිරි කුරුටු ගීවලත් තිබුණේ එදා හිටපු මිනිස්සු ව්‍යවහාර භාෂාවෙන් ලියපු ගීවැල්. ඒවායේ තියෙනවා ''නිල් කට්රොල් මලෙක ඇවුණු වැට්කොල් මල් සෙයි'' කියල. එතකොට අද කටරොඩු මල් කියන එක එදා කට්රොල් මල් කියල භාවිතා කළා. අපි අද වැටකොලු කියන එකට එදා වැට්කොල් කියල භාවිතා කළා. එහෙනම් එදා භාවිතා කරපු භාෂාවෙන් පෙන්වා තිබුණේ අද භාවිතා කරන භාෂාවට වඩා වෙනස් ශබ්ද අර්ථයක්. නමුත් එකම අදහසයි පෙන්වන්නේ. ඒ භාෂාව දැන් තියෙන සිංහල භාෂාවට අනුකූල භාෂාවක් වුණත් එදා ලිඛිත භාෂාවක් වශයෙන් භාවිතා කරල තියෙන්නේ ජන වහරේ සම්මත කරගත් භාෂාවක්. එතකොට ඒ භාෂාවේ අදට වඩා අකුරුත් වෙනස් වුණා, ශබ්දයත් වෙනස් වුණා.

එහෙනම් අද අපට කවුරු හරි කිව්වොත් අවුරුදු 2500 කට පමණ පෙර බුදුන් වහන්සේ දේශනා කරපු හෝ ඒ කාලයේ මිනිස්සු භාවිතා කරපු හෝ භාෂා මොනවද කියල ඔප්පු කරන්න කියල, අවුරුදු තුන් හාරසියයකින් මෙහා ලියපු පොත් ටිකක් හැරෙන්න ඔප්පු කරන්න වෙනත් මොනම සාක්ෂියක්වත් නෑ. අවුරුදු දෙතුන් සියයක් පමණ පැරණි පොත් ටිකක් හැරෙන්න එයින් එහා තිබුණු නිධන් කරපු පුස්කොළ පොතක් හෝ තියෙනව නම් ඒවායේ තියෙන්නෙත් නාගර අක්ෂර හෝ බ්‍රාහ්මීය අක්ෂරවලින්. වට අකුරුවලින් නෑ. අඩු තරමින් අපි දැන් ''නමෝ බුද්ධාය'' කියල කියන ගල් පුවරු ආදියක්වත් වට අකුරුවලින් නෑ. ඉතින් ''නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස'' කියල නමස්කාරය මෙහෙමයි කියල අපට ඒ අදහස එන්නේ ත්‍රිපිටකයෙන්. නමුත් ඒ නමස්කාරයවත් ගහපු සෙල් ලිපියක් කිසිම තැනක පෙන්වන්න නෑ. එහෙනම් මේ ඉතාම මෑත කාලයක තමයි ඒ වගේ වැකි පවා භාවිතා කරල තියෙන්නේ.

මෙතනදී නාගරක්ෂර (නාග ආර හෙවත් නාගයාගේ ආකාරය) කියන්නේ ඒවා නාගයින් භාවිතා කරල හදපු නිසයි.



හීලෑ කරල කීකරු වෙච්ච නයි තමයි මේකට යොදා ගත්තේ. ඒ කියන්නේ නයාට යම්කිසි ශබ්දයක් දුන්නම ඒ ශබ්දයේ කම්පන තරංග අනුව ඌ කය හැඩගස්ස ගන්නවා. උදාහරණ විදියට ග....... ග....... ග...... ආදී ලෙසින් කියන කොට නයා තමාගේ ශරීරය යම් කිසි හැඩයකට සකස්කර ගන්නවා. ඒ නයාගේ ආසන්න හැඩය තමයි 'ග' යන්න විදියට එදා මූලිකව සම්මතකර ගත්තේ. ය...... ය...... ය...... ආදී ලෙසින් කියන කොට ඌ තමන්ගේ ශරීරය ඊට අනුකූලව යම්කිසි හැඩයකට සකස්කර ගන්නවා. ඒ එන හැඩය තමයි ආසන්න වශයෙන් 'ය' යන්න විදියට එදා තිබුණු හැඩයෙන් මූලිකව සම්මතකර ගත්තේ. මේ විදියට අතීත් අකුරුත් ශබ්ද නගල කියන කොට ඒ කම්පන රටාවන්ට අනුව ඌ තමන්ගේ ශරීරය සකස්කර ගන්නා හැඩය ආසන්නව අරගෙන තමයි එදා තිබ්බෙ නාගරක්ෂර කියන ඒවා හැදුනේ. ඒවා කාලයත් සමග පරිනාමය වෙලා තමයි අද තියෙන වට අකුරු ශාස්ත්‍රය ගොඩනැගුනේ. (මේ සිද්ධිය සමාධියටත් ගෝචර වෙන දෙයක්) ඉතින් එදා ඒ ජාතියේ හදාගත්ත ක්‍රමයකින් තමයි අද අපට එදා තිබුණු අදහස පෙන්වල තියෙන්නේ. ඒ අදහස අරගෙන ඇවිදින් ඒක භාෂා පරිවර්තනයකට අරගෙනයි තියෙන්නේ. නමුත් සමහර තර්කවාදී භාෂා විශාරදයන් අද අපට පෙන්වන්න හදන්නේ අද තියෙන ඒ භාෂා ශබ්දයෙන්ම, ඒ දේශනා රටාවෙන්ම එදා බුදුන් වහන්සේ දේශනා කළා කියන එකයි.

නමුත් එදා, අද කියන භාෂා ශබ්දයන්මයි භාවිත කළේ, අද තියෙන අක්ෂර රටාවමයි අවුරුදු 2500 ක මුල් කාලයේ ඉඳන් තිබුණේ, ඒකමයි ඒ විදියටම රහතන් වහන්සේලාගේ පරම්පරාවෙන් හරියටම ශබ්දයත්, අකුරුත් වෙනස් නොවෙන්න ගෙනාවේ කියන කාරණා කාටද ඔප්පු කරල පෙන්වන්න පුළුවන්? ඒ සඳහා තියෙන සාක්ෂි මොනවද? හැබැයි **බුදුන් වහන්සේ පෙන්වල දීල තියෙනවා, භාෂා නීති රීති පැත්තකට දාලා අදහස පමණක් ගන්නෙයි කියන කාරණය.** ඒ නිසා අක්ෂර, පද මාලා වෙනස් වුණාට දැනට තියෙන ත්‍රිපිටකයේ වුණත් අදහස එකයි. හැබැයි අදහස මිසක් වචන මාලාවක් ඒ කාලයේ ඉඳන් ගෙනාවයි කිව්වොත්, ත්‍රිපිටකය තුළින් ඒ කාරණය තේරුම් ගන්න අපට හේතු නෑ. දැන් අද මේ කතා කරන ශබ්ද රටාවමයි ඒ කාලයේ ඉඳන් ගෙනාවේ, ඒකමයි මේ පොතේ තියෙන්නෙ කියල ගන්න ගියොත් ඒකට හේතු පෙන්වන්න බෑ. අනෙක ඒ කාරණය එහෙම නම්, බෞද්ධ පූජනීය ස්ථානවල විශේෂයෙන් ඒවායින් එකක් හෝ සටහන් වෙන්න ඕන. නමුත් එහෙම දෙයක්වත් නෑ. හැබැයි යම් යම් කාලවල දී ගෙනාපු අදහස තමන්ගේ හිතට ආපු හැටියට, හරි හෝ වැරදි හෝ වේවා ඒ ආපු අදහස තමයි දැන් මේ නවීන භාෂාවට පරිවර්තනය කරල තියෙන්නේ.

ඉතින් නවීන භාෂාව අරගෙන තර්ක කරන්න ගියාම කොයිතරම් දුරට සාර්ථක දැයි සිතා බැලිය යුතුයි. ඒක නවීන භාෂාවේ නිරුක්ති රටාවක් අරගෙන, ඒ විදියට බලන්න ගිහින් හදා ගත්තු රටාවක් මිසක් බුදුන් වහන්සේ පෙන්වපු එකක් නෙවෙයි. පටිසම්භිදා මග්ගප්‍රකරණයෙන් පෙන්වන්නෙත්, අදහස් කරල

තියෙන්නෙත් යම් කිසි අදහසක් ලෝකයාට ප්‍රකාශ කරන්න, ඒ ඒ කාලයේ ඒ ඒ ප්‍රදේශයේ තියෙන භාෂා විලාසයෙන් යම්කිසි ක්‍රම රටාවක් හරියට අනුගමනය කිරීමේ දක්ෂතාවක් තියෙනව නම්, ඒ අදහස් පෙන්වන්න තියෙන හැකියාවට නිරුක්ති හැකියාව කියා හඳුන්වනව කියලයි. මේ කාරණය අරණ විභංග සූත්‍රයෙත් ඒ ආකාරයෙන්ම සඳහන් වෙනවා. නමුත් නිරුක්තිය කියල අද භාවිතා කරන්නේ ඒක නෙවෙයි. උක්ත, කර්ම, ආඛ්‍යාත ආදී පද සම්බන්ධයෙන්, විභක්ති සම්බන්ධයෙන්, භාෂා ව්‍යාකරණ ආදී ඒවා තමයි බොහෝ අය නිරුක්ති කියල හිතාගෙන ඉන්නේ. නමුත් **යථාර්ථයෙන් නිරුක්ති කියල බුදුන් වහන්සේ දේශනා කළේ, පදයක් හැදෙන්න භාවිතා කරපු අදහස් එකතුවෙලා කැටිවෙලා ඒ පදය හැදිච්ච හැටියි.** ඒක පටිච්ච සමුප්පන්නයි, ධර්මානුකූලයි. ඒ කාරණය ඔප්පු කරන්න තමයි මීත් පෙර කලාපවලින් යම් යම් සාධක ටිකක් සමග නිරුක්ති ටිකක් පෙන්නුවේ. නමුත් සියලුම වචනවල නිරුක්ති බුදුන් වහන්සේ පෙන්වන්න ගියේ නෑ. ඒකටත් හේතුවක් තියෙනවා.

උදාහරණයක් ලෙස යම්කිසි ගණිතය උගන්වන ගණිත විශේෂඥයෙක් යම් කිසි ගණිත රටාවක් හෙවත් ගණිත චක්‍රයක් පෙන්වා මේක හදන්නේ මෙහෙමයි කියල ඒ චක්‍රානුසාරයෙන් හදන ගණන් කිහිපයක් පමණක් පෙන්වනවා. එතකොට පොතේ තියෙන්නෙත් පෙන්නුවෙත් එච්චරයි. හැබැයි ඒ ටික විතරක් ඉගෙන ගෙන කටපාඩම් කරගෙන ඉන්න කෙනාට ඒ දුන්න උදාහරණ ජාතියේ ගණන් හැරෙන්න වෙනත් ගණන් හදන්න බෑ. නමුත් ගණන් කියන්නේ එහෙම දෙයක් නෙවෙයි. ඒ අනුසාරයෙන් දැනුවත් වීමයි. ඒ ක්‍රමවේදය ගැන දැනුවත් වුණා නම් කිසිම ප්‍රශ්නයක් නැතිව ඕනෑම ජාතියේ ගණනක් හදන්න පුළුවන්. හැබැයි ඒ ටික පොතේ නෑ. නමුත් ගණන හරි. ඒ දැනුවත් වීම නිසයි. ඉතින් දැනුවත් වෙච්ච නිසා දැනුවත් ආකාරයෙන් පෙන්වනකොට, ඉගෙනීමේ සීමාවේ ඉන්න කෙනාට ඒක රුස්සන්නෙ නැතිව යනවා. මේ නිසා ඒ අය, ඒක කොහෙද තියෙන්නේ ? මොන පොතේද තියෙන්නේ ?......... ආදී වශයෙන් තර්කවාද මතු කරනවා. ඒ අයට කියන්නේ පද පරම කියලයි. පද පරමයාට නිවන් නෑ කියලත් බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා. හේතුව ඔහු පදය පරම කරගෙන සීමාවක් තුළ රැඳිල ඉන්නවා මිසක් ඒක ඉක්මවන්න හැකියාවක් නුවණක් නෑ. ඒ නිසා දැනුවත් වෙන්න බෑ.

මේ වගේ ධර්මයෙත් තියෙනවා චක්‍ර සහ ඒ අනුසාරයෙන් පෙන්වපු නිදර්ශන. මේ නිසා බුදුන් වහන්සේ ඒ සියල්ලම දේශනා කරන්න ගියෙත් නෑ. දේශනා කරපු සියලු ධර්මය පොත්වලට ගන්නත් බෑ. ඒ තරම් විශාලයි. මොකද දවල් බුක්තානුමෝදනාවක් පවා දීඝ නිකාය තරම් දිගයි. එක අනුමෝදනා බණකුත් එච්චර දිග නම් උන්වහන්සේ අවුරුදු 45 ක් තිස්සේ දේශනා කරපු බණ ලියන්න ගියොත් ලෝකයේ පොත් මදිවෙනවා. මේ නිසා ධර්ම සංගායනාවලදී සිදු කරල තියෙන්නේ ඒ අවශ්‍ය කරන්නා වූ මූලික සිද්ධාන්තය අරගෙන ඊට නිදර්ශන වශයෙන් තියෙන්නා වූ රටාවට සකස් කරපු ධර්මස්කන්ධයක් කැටිකර දැක්වීමයි. හැබැයි ඒකට සහභාගි වුණේ අවබෝධයෙන් ඒ දැනීම ලබාගත් සිව්පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා පමණයි. මේ නිසා සීමාවකට කොටුවෙලා ඉඳල යථාර්ථය දකින්න බෑ. සමහර විට ඉගෙන ගැනීමක් තියෙන කෙනෙක් වෙන්න පුළුවන්. නමුත් මාර්ග ඵල ලබා යථාවබෝධය දකින්න නම් දැනුවත් කෙනෙක් විය යුතුයි. ධර්මය තුළින් දැනුවත් වෙච්ච කෙනාට ඒ අනුසාරයෙන් ධර්මය විග්‍රහ කරන්න පුළුවන්. නිරුක්ති පටිසම්භිදා ඥානය ලැබුණ නම් දහම් අදහස කෙනෙකුට අවබෝධ වෙන්න විවිධාකාර උදාහරණ උපමා අරගෙන නිරුක්ති සහිතව කියන්න පුළුවන් ශක්තිය ලැබෙනවා. නමුත් සියලුම වචනවලට නිරුක්ති දෙන්න බුදු පියාණන් වහන්සේ දන්නවා හැර වෙන කවුරුවත් සර්වඥ වෙලා නෑ. යම්කිසි ඥාන ගෝචර මට්ටමක් ඇත්ද ඒ මට්ටමට ඇදෙන ප්‍රමාණයයි කියන්නේ. ඒ නිසා හැම වචනයකටම නිරුක්ති දෙන්න කිව්වට හරියන්නෙ නෑ. නිරුක්ති පටිසම්භිදා ඥානය විවිධ මට්ටම්වලින් පිහිටපු අයට තම තමන්ගේ මට්ටම් අනුව විවිධ වචනවලට නිරුක්ති දෙන්න පුළුවන්. ශ්‍රාවකයෙක් ඒ මට්ටමින් උපරිමයට ගියොත් සෑහෙන ප්‍රමාණයකට නිරුක්ති දෙන්න පුළුවන්. ඒත් සියල්ලටම නෙවෙයි. එවැනි කෙනෙකුට භාෂාවක් ඉගෙන ගන්න අවශ්‍ය නෑ කිව්වෙත් ඒකයි. **ලෝකයේ ඕනෑම කෙනෙක් කතා කරන ඕනෑම භාෂාවක් තේරුම් ගන්න එහෙම කෙනෙක් දන්නවා. ලියනව නම් ලියන එකත් මෙහෙමයි කියල ඒකත් පෙන්වන්න පුළුවන්. ඒක ඥානයත් එක්ක ගෝචර වෙලා එන දහම් හැකියාවක්.** ඒ හැකියාව පූර්ණ වෙච්ච බුදු පියාණන් වහන්සේලාට තමයි සියලු ආකාරයෙන්ම එහෙම තියෙන්නේ. ඊළඟ මට්ටම සිව්පිළිසිඹියාපත් මහරහතන් වහන්සේලාටයි. යම් කෙනෙක් එක වචනයක් දෙකක් හරි තමන්ට වැටහිලා කියනව නම් ඔහුටත් ඒ වැටහීමේ මාත්‍රයක් හෝ ඥාන මාත්‍රයක් හෝ පිහිටනවා.

මේ විදියට නිරුක්ති දෙන කොටත් මූල අදහස හරියටම එන්නේ මාගධී, සුද්ධ සිංහල වගේ මූල භාෂාවලයි. සුද්ධ සිංහලයේ ඒක ඉතාමත් හොඳින් තිබුනා. නමුත් අද අපි පාලි, සිංහල කියන්නේ ඒ මූල භාෂාවම නෙවෙයි. සුද්ධ සිංහල, මිශ්‍ර සිංහල කියල දෙකක් තිබුණත් සුද්ධ සිංහල කියන එක අද භාවිතා කරන්නෙ නෑ. අද තියෙන්නේ මිශ්‍ර සිංහලයි. උදාහරණ ලෙස බඳුන කියන එකට කෝප්පය කියල කියනවා. ඒකෙන් හදාගෙන කප් කියලත් කියනවා. නමුත් නියම සුද්ධ සිංහල වචනය තමයි බඳුන. සුද්ධ සිංහල කියන ඒ වචනය තියෙන පොත් තියෙන්නෙත් අවුරුදු තුන් හාරසියයක් තරම් මෑත කාලයේදියි. එයින් එහා ලියවෙච්ච පොත්වල එහෙම වචනයක්වත් නෑ. විවිධ කාලවලදී භාවිතා කරන ව්‍යවහාර වචනත් වෙනස් වෙනවා.

බුදුන් වහන්සේ දේශනා කළේ භාෂාව කියල අමුතු දෙයක් නීතිගත කරන්න නෙවෙයි. මොනව හෝ එදා හිටපු මිනිස්සු, භාෂාවෙන් යම් අදහසක් දෙන්න වචනයක් භාවිතා කළා නම්, මනා නුවණින් ඒ වචනය කිව්වෙ මොන අදහසකින් ද කියල තේරුම් ගන්න කියන එකයි. එතකොට ලෝකයේ මොන භාෂාවක මොන වචනය වුණත් අදහස ගැනීමේ දී ප්‍රශ්නයක් වෙන්නෙ නෑ. දේශනා කරන කෙනා තේරුම් ගත යුතුයි, අහවල් වචනයෙන් පෙන්නුවේ මේ අදහසයි කියල. සිව්පිළිසිඹියාවේ එන අර්ථ, ධර්ම කියන තැනටත් මේක ඇතුළත්. ඒ ඥානය පහළ වුණා නම් වට අකුරු ශාස්ත්‍රය නෙවෙයි මොන භාෂා ශාස්ත්‍රයකටවත් කොටුවෙන්න අවශ්‍ය නෑ. **අභිඥාලාභී සිව්පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේ නමක් පහළ වුනොත්, උන් වහන්සේට වෙනත් භාෂා ඉගෙන නොගෙන ලෝකයේ විවිධ භාෂා කතා කරන පිංවතුන්ට දහම් අදහස දෙන්න පුළුවන් වෙන්නෙත් මේ නිසයි.**

(ඉතිරි කොටස ලබන කලාපයෙන් )

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අරුත් සැඟව ගිය අරි අටඟි මග මහා චත්තාරීසක සූත්‍රය ඇසුරෙන්

නිවන් මාර්ගයට පිවිසි අයෙකුට අරි අටගි මග වැඩෙන හැටි මේ සූත්‍රයෙන් අපූරුවට විස්තර කරල තියෙනවා. එමගින් පළමු හංග හත වන සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති යන හංග වැඩුනම අට වන හංගය වන සම්මා සමාධිය ලැබෙන බව පැහැදිලි කරල තියෙනවා. එසේම සම්මා දිට්ඨි, සම්මා වායාම, සම්මා සතිය යන හංග තුන පරිවාර කර පිහිටමින් අනෙකුත් මාර්ග හංග සියල්ල ලැබීමට උපකාර වන බව පැහැදිලිව පෙන්වා තියෙන නිසා, ඒ ගැන විශේෂයෙන් සැලකිළිමත් වීම වඩා හොඳයි. සූත්‍රයේ සඳහන් ආකාරයට සියලුම මාර්ග හංග වැඩෙන හැටි ඉතා සරලව පහත ආකාරයට විස්තර කරන්න පුළුවන්.



(අ) ආර්ය සම්මා සමාධිය ලබා ගැනීමට අනුගමනය කළ යුතු පළමු පියවර .

**සම්මා දිට්ඨිය** - සම්මා දිට්ඨිය ආකාර 02 යි.
1. ලෞකික සම්මා දිට්ඨිය
2. ලෝකෝත්තර සම්මා දිට්ඨිය

ආර්ය මාර්ගයට පිවිසෙන අයෙකුට සම්මා දිට්ඨිය, සම්මා දිට්ඨිය ලෙසත්, මිත්‍යා දිට්ඨිය, මිත්‍යා දිට්ඨිය ලෙසත් පැහැදිලිව වෙන් වෙන්ව වටහා ගැනීමට ඇති අවබෝධය ඔහුගේ සම්මා දිට්ඨිය පිළිබඳ සම්මා දිට්ඨිය වන අතර, ආර්ය මාර්ගයට පිවිසුනාට පසු නිරතුරුව සිහියෙන් ඉඳගෙන මිත්‍යා දිට්ඨි ප්‍රහානය කර ආර්ය සම්මා දිට්ඨි ප්‍රතිලාභය පිණිස දරන වෑයම ඔහුගේ සම්මා දිට්ඨිය පිළිබඳ සම්මා වායාමයයි. ඒ සඳහා නිරතුරුව සිහිය පවත්වා ගැනීම ඔහුගේ සම්මා දිට්ඨිය පිළිබඳ සම්මා සතියයි.

**දස වස්තුක මිත්‍යා දෘෂ්ඨිය** (ලෝකයේ පවතින නරක පැත්ත.) - 1. දන් දීමේ විපාක නැත. 2. ඉෂ්ඨාර්ථ (ඉටු කිරීම්) සිද්ධිවල විපාක නැත. 3. පිදීමේ විපාක නැත. 4. සැප දුක් දෙන ලෙස කර්මවල විපාක නැත. 5. මෙලොව අයට පරලොව නැත. 6. පරලොව අයට මෙලොව නැත. 7. මවට සැලකීමේ විපාක නැත. 8. පියාට සැලකීමේ විපාක නැත. 9. ඕපපාතික සත්වයෝ නැත. 10. මෙලොව පරලොව ගැන ඥානයෙන් දැන පවසන මහණ බමුණන් නැත. මේවා අනුගමනය කරන අය සතර අපා ආදී දුගතියේ උපදින්න හේතු වෙනවා.

**ලෞකික සම්මා දිට්ඨිය** (ලෝකයේ පවතින හොඳ පැත්ත) - 1. දන් දීමේ විපාක ඇත. 2. ඉෂ්ඨාර්ථ (ඉටු කිරීම්) සිද්ධිවල විපාක ඇත. 3. පිදීමේ විපාක ඇත. 4. සැප දුක් දෙන කර්මවල විපාක ඇත. 5. මෙලොව අයට පරලොව ඇත. 6. පරලොව අයට මෙලොව ඇත. 7. මවට සැලකීමේ විපාක ඇත. 8. පියාට සැලකීමේ විපාක ඇත. 9. ඕපපාතික සත්වයෝ ඇත. 10. මෙලොව පරලොව ගැන ඥානයෙන් දැන පවසන මහණ බමුණන් ඇත. මේවා අනුගමනය කරන අය මනුස්ස, දිව්‍ය ආදී සුගතිවල උපදින්න හේතු වෙනවා.

**ලෝකෝත්තර සම්මා දිට්ඨිය** (නිවන් මගට යොමු වන පැත්ත) - ලෝකයට ඇළුම් කිරීම නිසා ගොඩ නැගෙන මානසික පෙළීම ත්‍රිලක්ෂණයෙන් දැක, චතුරාර්ය සත්‍යය වටහා ගැනීමත් සමග ලැබෙන ප්‍රඥාව තුලින් ලෝකයේ පවතින සියල්ලෙහි අසාර ස්වභාවය යථා පරිදිම අවබෝධ කරගෙන, චතුරාර්ය සත්‍යය දැක්කට පසු වෙනත් විකල්පයක් නොමැති බව වටහාගෙන නිවන් මාර්ගයට පිවිසීමට අදිටන් කර ගැනීම. මේවා අනුගමනය කරන අයට නිවන් සැනසීම ලබන්න හේතු වෙනවා.

(ආ) ආර්ය සම්මා සමාධිය ලබා ගැනීමට අනුගමනය කළ යුතු දෙවන පියවර -

**සම්මා සංකප්පය** - සම්මා සංකප්පය ආකාර 02 යි.
1. ලෞකික සම්මා සංකප්පය
2. ලෝකෝත්තර සම්මා සංකප්පය ☞

මිත්‍යා සංකප්පය මිත්‍යා සංකප්පය ලෙසත්, සම්මා සංකප්පය සම්මා සංකප්පය ලෙසත්, වෙන්කර දැනගැනීම සම්මා සංකප්පය පිළිබඳ ඔහුගේ සම්මා දෘෂ්ටියයි. ආර්ය සිත් ඇති, ආර්ය මාර්ගය වඩන අය නිරතුරුවම සිහියෙන් සිටිමින් මිත්‍යා සංකල්ප ප්‍රහානය කර සම්මා සංකල්පය ඇතිකර වාසය කිරීම සඳහා දරන වෑයම ඔහුගේ සම්මා සංකප්පය පිළිබඳ සම්මා වායාමයයි. ඒ සඳහා නිරතුරුව පවත්වන සිහිය ඔහුගේ සම්මා සංකප්පය පිළිබඳ සම්මා සතියයි.

**මිත්‍යා සංකප්පය** - කාම සංකල්පනා, ව්‍යාපාද සංකල්පනා, විහිංසා සංකල්පනා මේවා අනුගමනය කරන අය සතර අපා ආදී දුගතියේ උපදින්න හේතු වෙනවා.

**ලෞකික සම්මා සංකප්පය** - නෙක්ඛම්ම සංකල්පනා, අව්‍යාපාද සංකල්පනා, අවිහිංසා සංකල්පනා. මේවා අනුගමනය කරන අය මනුස්ස, දිව්‍ය ලෝක ආදී සුගතිවල උපදින්න හේතු වෙනවා.

**ලෝකෝත්තර සම්මා සංකප්පය** - වටහාගත් ලෝකයේ පවතින අසාර ස්වභාවය පාදක කරගෙන ඒ බව ප්‍රඥාවෙන් දැන ඉන් අත්හැරීම, මිදීම සුදුසු යැයි තීරණය කර, සියලු සත්වයන් කෙරෙහි ආර්ය ගුණයෙන් මෛත්‍රී සහගතව සිතමින් කටයුතු කිරීම. මේවා අනුගමනය කරන අයට නිවන් සැනසීම ලබා ගන්න හේතු වෙනවා.

(ඇ) ආර්ය සම්මා සමාධිය ලබා ගැනීමට අනුගමනය කළ යුතු තුන්වන පියවර -

**සම්මා වාචා** - සම්මා වාචා ආකාර 02යි.
1. ලෞකික සම්මා වාචා
2. ලෝකෝත්තර සම්මා වාචා

සම්මා වාචා සම්මා වාචා ලෙසත්, මිත්‍යා වාචා මිත්‍යා වාචා ලෙසත් දැනගැනීමේ අවබෝධය සම්මා වාචාවේ සම්මා දිට්ඨියයි. ආර්ය සිත් ඇතිව ආර්ය මාර්ගය වඩන අය නිරතුරුවම මිත්‍යා වාචා ප්‍රහානය කර සම්මා වාචා ප්‍රතිලාභය පිණිස වෑයම් කරනවා. මේ වෑයම ඔහුට සම්මා වාචා පිළිබඳව සම්මා වායාම වන අතර, ඒ සඳහා නිරතුරුවම සිහිය පවත්වා ගැනීම සම්මා වාචාවේ සම්මා සතියයි.

**මිත්‍යා වාචා** - මුසාවාදා, පිසුනා වාචා, පරුසා වාචා, සම්ප්‍රප්පලාපා. මේවා අනුගමනය කරන අය සතර අපා ආදී දුගතියේ උපදින්න හේතු වෙනවා.

**ලෞකික සම්මා වාචා** - මුසාවාදයෙන් වැලකීම, පිසුනාවාචයෙන් වැලකීම, පරුෂා වාචයෙන් වැලකීම, සම්ප්‍රප්පලාපයෙන් වැලකීම. මේවා අනුගමනය කරන අය මනුස්ස, දිව්‍ය ආදී සුගතිවල උපදින්න හේතු වෙනවා.

**ලෝකෝත්තර සම්මා වාචා** - ලෝකයේ අසාරත්වය හොඳින් වටහා ගත් පසුව මිත්‍යා වාචාවලින් තමාට ලබාගත හැකි හරවත් යමක් නැති බව ප්‍රඥාවෙන් වටහා ගෙන එයින් වෙන්වීම ලෝකෝත්තර සම්මා වාචාවයි. මේවා අනුගමනය කරන අය නිවන් සැනසීම ලබන්න හේතු වෙනවා.

(ඈ) ආර්ය සම්මා සමාධිය ලබා ගැනීමට අනුගමනය කළ යුතු හතරවන පියවර -

**සම්මා කම්මන්තය** - සම්මා කම්මන්තය ආකාර 02 යි.
1. ලෞකික සම්මා කම්මන්තය
2. ලෝකෝත්තර සම්මා කම්මන්තය

මිත්‍යා කම්මන්තය මිත්‍යා කම්මන්තය ලෙසත්, සම්මා කම්මන්තය සම්මා කම්මන්තය ලෙසත් වෙන් කර වටහා ගැනීම ඔහුගේ සම්මා කම්මන්තය පිළිබඳ සම්මා දිට්ඨියයි. ආර්ය මාර්ගය වඩන අයෙකු තිලකුණ වඩා, මනා සිහියෙන් සිට මිත්‍යා කම්මන්තය ප්‍රහානය කර සම්මා කම්මන්ත ප්‍රතිලාභය ලැබීමට වෑයම් කරනවා. එය ඔහුගේ සම්මා කම්මන්තය පිළිබඳ සම්මා වායාමයයි. මෙහිදී නිරතුරුවම සිහිය පවත්වා ගැනීම ඔහුගේ සම්මා කම්මන්තය පිළිබඳ සම්මා සතියයි.

**මිත්‍යා කම්මන්තය** - පර පණ නැසීම, අන්සතු දේ ගැනීම, කාම මිත්‍යාචාරය. මේවා අනුගමනය කරන අය සතර අපා ආදී දුගතියේ උපදින්න හේතු වෙනවා.

**ලෞකික සම්මා කම්මන්තය** - පර පණ නැසීමෙන් වැලකීම, අන්සතු දේ ගැනීමෙන් වැලකීම, කාම මිත්‍යාචාරයෙන් වැලකීම. මේවා අනුගමනය කරන අය මනුස්ස, දිව්‍ය ආදී සුගතිවල උපදින්න හේතු වෙනවා.

**ලෝකෝත්තර සම්මා කම්මන්තය** - ලෝකයේ ත්‍රිලක්ෂණය වටහාගත් අය මේ මිත්‍යා කම්මන්ත කිරීමෙන් ලබාගත හැකි හරවත් කිසිවක් නොමැති බව අවබෝධ කරගෙන ඇති නිසා සිල්වතක් මෙන් නොව ප්‍රඥාවෙන් දැන මේ මිත්‍යා කම්මන්ත වැඩපිළිවෙල අත්හරිනවා. එය ඔහුගේ ලෝකෝත්තර සම්මා කම්මන්තයයි. මේවා අනුගමනය කරන අයට නිවන් සැනසීම උදා කර ගන්න හේතු වෙනවා.

(ඉ) ආර්ය සම්මා සමාධිය ලබා ගැනීමට අනුගමනය කළ යුතු පස්වන පියවර -

**සම්මා ආජීවය** - සම්මා ආජීව ආකාර 02යි.
1. ලෞකික සම්මා ආජීවය
2. ලෝකෝත්තර සම්මා ආජීවය

මිත්‍යා ආජීවය මිත්‍යා ආජීවය ලෙසත්, සම්මා ආජීවය සම්මා ආජීවය ලෙසත් දැන ගැනීමට ඇති හැකියාව ඔහුගේ සම්මා ආජීවය පිළිබඳ සම්මා දිට්ඨියයි. ආර්ය මාර්ගය වඩන අයෙකු නිරතුරුවම මිත්‍යා ආජීවය ප්‍රහානය කර සම්මා ආජීවයට අනුව ජීවත් වෙන්න වෑයම් කරනවා. මේ වෑයම ඔහුගේ සම්මා ආජීවය පිළිබඳ සම්මා වායාමයයි. ඒ සඳහා නිරතුරුවම සිහියෙන් සිටීම ඔහුගේ සම්මා ආජීවය පිළිබඳ සම්මා සතියයි.

**මිත්‍යා ආජීවය** - කූට උපක්‍රම මගින් හා චාටු බස් කියමින් අන් අය මුලා කරමින් අයුතු ලාබ ලබමින් ජීවිකාව පවත්වාගෙන යාම. මේවා අනුගමනය කරන අය සතර අපා ආදී දුගතියේ උපදින්න හේතු වෙනවා.

**ලෞකික සම්මා ආජීවය** - මිත්‍යා ආජීවයෙන් වෙන් වී සාධාරණ ලෝක සම්මත ක්‍රම මගින් තම ජීවිකාව පවත්වාගෙන යාම. මේවා අනුගමනය කරන අය මනුස්ස, දිව්‍ය ආදී සුගතිවල උපදින්න හේතු වෙනවා.

**ලෝකෝත්තර සම්මා ආජීවය** - ලෝකයේ පවත්නා යථා ස්වභාවය වටහාගෙන ඇති නිසා, අන් අය රැවටීමෙන් තම ජීවිකාව පවත්වා ගෙන යාමෙන් ලබාගත හැකි කිසිදු හරවත් බවක් නොමැති බව ප්‍රඥාවෙන් වටහාගෙන, බාධාවකින් තොරව ආර්ය මාර්ගය සාර්ථක කර ගැනීමට ප්‍රමාණවත් පරිදි සාධාරණව උපයාගනිමින් ජීවිකාව පවත්වාගෙන යාම. මේවා අනුගමනය කරන අය නිවන් සැනසීම උදා කර ගන්න හේතු වෙනවා.

මේ අනුව සම්මා දිට්ඨි, සම්මා

සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන මාර්ග හංග පහ වැඩීමේදී සම්මා දිට්ඨි, සම්මා වායාම, සම්මා සති යන මාර්ග හංග තුනත් ඒ එක්කම වැඩෙන බව තේරුම්ගන්න පුළුවන්. මේ අනුව මුල් මාර්ග හංග පහ වඩන කොට පරිවාරව වැඩී ඇති මාර්ග හංග තුනත් සමගින් අරි අටඟි මගේ මුල් මාර්ග හංග හතම වැඩී ඇති නිසා ආර්ය සම්මා සමාධියත් ලැබෙනවා.

මේ සූත්‍රයෙන් පෙන්වා දී තියෙන කරුණුවලට අනුව ආර්ය සම්මා දිට්ඨිය ඇති පුද්ගලයාට අරි අටඟි මග වැඩීමට හැකිවන අතර, අනුපිළිවෙලින් සම්මා දිට්ඨියෙන් පටන්ගෙන සම්මා සමාධිය දක්වා වූ ආර්ය මාර්ගය පූර්ණ කරගන්න පුළුවන් . මේවිදිහට මාර්ග හංග අට වැඩූ ආර්යන් ශෛක්ෂ (සේක-අරිහත් ඵලයෙන් මෙහා ඉන්න අය) අෂ්ඨාංග (අෂ්ට+හංග) සමන්වාගත වන අතර, සම්මා ඥාන හා සම්මා විමුක්ති මාර්ග හංග දෙකත් පූර්ණ කරන ලද මහරහතන් වහන්සේ දස හංග සමන්වාගත වෙනවා.

ශ්‍රී සද්ධර්මය ශ්‍රවනය කර දැනටමත් අරි අටඟි මගේ ගමන් කරන අයෙකුගේ අරි අටඟි මග වැඩෙන හැටි සාමාන්‍ය ජීවිතයේදී මුහුණපෑමට සිදුවන අවස්ථාවකට ගලපා පහත දක්වා ඇති උදාහරණය මගින් තේරුම් ගැනීමට උත්සාහ කරමු.

අරි අටඟි මගට පිවිසි අයෙකු විසින් තමන්ට අයත් රියක් පදවාගෙන යන විටදී පිටුපසින් පැමිණි වෙනත් වාහනයක් එහි ගැටුනු අවස්ථාවක් ගැන සිතන්න.

**සැබෑ බොදුනුවෙකුගේ සාමාන්‍ය ජීවිතයේ අත්දැකීම**

(1) ලෝකයේ ඇති සියල්ල තමාට කැමති අයුරින් සිදු නොවන බව හොඳින් වටහාගෙන ඇති නිසා, කෙලෙස් නැගෙන අවස්ථාව ගැන සිහියෙන් සිට නුවණ මෙහෙයවා ක්ෂණිකව නැග එන ද්වේශය හඳුනාගෙන කෙලෙස් තවන වීර්යෙන් යුතුව ද්වේශය යටපත් කරගෙන ඉතා සන්සුන්ව තම රථයෙන් බැසීම.

ධර්මානුකූල විග්‍රහය - මේ අවස්ථාවේ මොහුට සම්මා දිට්ඨිය, සම්මා වායාමය, සම්මා සතිය යන මාර්ග හංග තුනම යම් පමණකට වැඩී තියෙනවා. එසේම එය සතර සතිපට්ඨානයේ ආරම්භය වන, ආතාපි සම්පජානෝ සතිමා විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්ස (මනා සිහි නුවණින් යුක්තව ලෝකයේ දැඩි ලෝභයෙන් හා දොම්නසින් මිදීම) ලෙස දක්වා ඇති ධර්ම විග්‍රහයට අනුව මේ අවස්ථාවේ ඔහුට මනා සිහියත්, මනා නුවණත්, කෙලෙස් තවන වීර්යත් තියෙනවා. ඒ නිසා ද්වේශය මැඩ පවත්වා ගනිමින් ආරවුල් ඇතිකර ගැනීමෙන් වලකිනවා. ඒ ප්‍රමාණයට සරිලන විදියට ඔහුගේ මාර්ග හංග වැඩෙනවා. (මෙම ලිපියෙහි - අ කොටස)

(2) රථයෙන් බැස අනෙක් පුද්ගලයා සමග කිසිම තරහක් ඇති කර නොගනිමින් සන්සුන්ව කථාකර අන් අයට හිංසාවක් පීඩාවක් නොකිරීමේ අදහසින් වාහනය පාරෙන් ඉවතට ගැනීමට කටයුතු කිරීම.

ධර්මානුකූල විග්‍රහය - මේ අවස්ථාවේදී ඔහුට වැඩී ඇත්තේ සම්මා සංකප්ප කියන මාර්ග හංගයයි. මේ වෙලාවේ සම්මා දිට්ඨි, සම්මා වායාම, සම්මා සති යන මාර්ග හංග තුනම පරිවාරව වැඩිල තියෙනවා. මේ පෙන්වන්නේ එබඳු අවබෝධයක් ඇති කෙනෙකුගේ ස්වභාවයයි. (මෙම ලිපියෙහි - ආ)

(3) කිසිම පරුෂ වචනයක් භාවිතා නොකර, ඉතා සුහදව කථා කරනවා. අලාභය ඉතා අධික ලෙස බොරුවට හුවා දැක්වීමට යන්නෙ නෑ.

ධර්මානුකූල විග්‍රහය - මේ අවස්ථාවේදී ඔහුට වැඩී ඇත්තේ සම්මා වාචා කියන මාර්ග හංගයයි. මේ වෙලාවේ සම්මා දිට්ඨි , සම්මා වායාම, සම්මා සති කියන මාර්ග හංග තුනම පරිවාරව වැඩිල තියෙනවා. ඒ බව මේ අවස්ථාවෙන් වැටහෙනවා. (මෙම ලිපියෙහි - ඇ)

(4) අලාභය ඉතා විශාල ලෙස හුවා දැක්වීමට උත්සාහ නොකිරීම හා අලාභය අනෙක් පාර්ශවය විසින් ගෙවිය යුතුමයි කියා තීරණය නොකිරීමත් ආදී කරුණු නිසා ප්‍රශ්ණයක් ඇති නොවන පරිදි සමථයකට පත් කර ගැනීමට උත්සාහ කිරීම.

ධර්මානුකූල විග්‍රහය - මේ අවස්ථාවේදී ඔහුට වැඩී ඇත්තේ සම්මා කම්මන්ත නමැති මාර්ග හංගයයි. මේ වෙලාවේ සම්මා දිට්ඨි, සම්මා වායාම, සම්මා සති කියන මාර්ග හංග තුනම පරිවාරව වැඩිල තියෙනවා. ආර්ය වූ සම්මා කම්මන්තය වැඩී එන අයුරු මෙයින් පේනවා. (මෙම ලිපියෙහි - ඈ)

(5) අනතුරු සිදුවීම ලෝක ස්වභාවය නිසා සම්පූර්ණ වරද අන් අයට නොපැවරීමට උත්සාහ කරනවා. එසේම අනෙක් පුද්ගලයා බිය ගන්වා අලාභය අය කර ගැනීමට තැත් කරන්නෙ නෑ. රක්ෂණය ආදී ලෝක සම්මත ක්‍රම මගින් පාඩුව පියවා ගැනීමට හෝ සිදු වෙච්ච පාඩුව තමා කැමැත්තෙන් විඳ දරා ගැනීමට උත්සාහ කිරීම නිසා ඉතා පහසුවෙන් ප්‍රශ්ණය නිරාකරණය කර ගන්නවා.

ධර්මානුකූල විග්‍රහය - මේ අවස්ථාවේදී මොහුට සම්මා ආජීවය කියන මාර්ග හංගය වැඩෙනවා. මෙහිදී සම්මා දිට්ඨි , සම්මා වායාම, සම්මා සති යන මාර්ග හංග තුනම පරිවාරව වැඩිල තියෙනවා. ආර්ය මාර්ගය වැඩෙන කෙනෙකුගේ සම්මා ආජීවය මෙසේ දිස්වෙනවා. (මෙම ලිපියෙහි - ඉ)

මේ අවස්ථාව වෙනකොට අරි අටඟි මගේ මුල් මාර්ග හංග හතම යම් පමණකට වැඩිල තියෙනවා. ඒ මාර්ග හංග හත වඩපු ප්‍රමාණයට අනුව ලැබුනු සම්මා සමාධියෙන් (අට වන මාර්ග හංගය) නැවත ගමන ආරම්භ කරනවා.


මේ සූත්‍රය ආශ්‍රයෙන් අපි ඉතා හොඳින් දන්නා අරි අටඟි මග බුදුරජාණන් වහන්සේ විසින් ආකාර දෙකකට විස්තර කර දී ඇති බව හොඳින් පැහැදිලි වෙනවා. ඒවා නම්, දෙව් ලොව ආදී සුගතිවල උප්පත්තිය ලබමින් සැප විපාක ලබාදෙමින් වුනත්, මහා දුක් සහිත සසරේ තව දුරටත් ගමන් කිරීමට හේතු වන ලෞකික අරි අටඟි මග හා අසාර වූ සසර දුකින් මිදීමට හැකියාව ලබාදෙන, උතුම් මාර්ගඵල අවබෝධය ලබාදී නිවනින් අවසන් වන ලෝකෝත්තර අරි අටඟි මගයි. මේ පසුව කියපු **ලෝකෝත්තර අරි අටඟි මග විද්‍යමාන වෙන්නේ බුද්ධෝත්පාද කාලයේ මේ බුදු සසුනේම පමණයි.**

*වෑරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**විද්‍යාවේදී ඒ. එම්. ධනරත්න අල්විස්**
**පැපිලියාන**

# ලොව අති දුර්ලභ වූ පටිභාන කවීත්වය නැවතත්...

*(පසුගිය කලාපයෙන් - බුදුන්වහන්සේ පෙන්වා දුන් කවීත්වය සහ අපේ පැරණි කවිවලින් මතුවන සැඟවුණු දහම් අරුත්)*



බුදුන් වහන්සේ පෙන්වා දුන් කවියන් හතර දෙනා අතරින් අත්ථ කවි, සෘත කවි, චින්තා කවි කියන මේ තුන් වර්ගය ගැන පසුගිය කලාපයෙන් විග්‍රහ කළා. මෙතනදී චින්තා කවි කියන ඒවා හැමවිටම ආයාසයෙන් කල්පනා කරලයි ගන්න ඕන. එහෙම නැත්නම් එක දිගට වැලට කියා ගන්න බෑ. මොකද හිත හිතා කියන කොට වෙලාව යනවා. එක පදයක් ගොතලා ඊළඟ පදයට යන කොට සමහර විට කාල වේලාව පනිනවා. මේ නිසා සමහර අවස්ථාවලදී, සෘත කවිවලින් ඉගෙනගත් කෑලි අරගෙන පදයක් දෙකක් ගොතලා, අර කට පාඩම් කරගත් ඒවායේ කෑලිත් ඒකට සම්බන්ධ කරලා කවිය නිර්මාණය කරනවා. එතකොට චින්තා සහ සෘත කවි කියන දෙකම සම්බන්ධයි. මේ නිසා චින්තා කවි වුණත් බොහෝ විට වෙනත් කවි හා තමන්ගේ පළපුරුද්ද ආශ්‍රය කරගෙනයි ගොතන්නේ. ඒ විදිහට එකතු කරලා විහිළුවක්, හාස්‍ය රසයක් ඇති වෙන්න කවි කියනවා.

'ඒ කිව් එකා උඹෙ මාම ද බාප්පද

උදයට කෑවෙ මැද බෙරි වුණු ආප්පද'

මේ වගේ කවිකාරයන් ළඟ තියෙනවා විවිධ පද කෑලි. ඒවා අවස්ථානුකූලව එකතු කරනවා. දැන් මේ කියපු සෘත කවි පදවලට තවත් කෑලි දෙක තුනක් දාලා ගොතල කියනවා. මේ විදිහට කවුරු හරි පළමුවෙන්ම චින්තා කවියෙක් කියපු දෙයක් හොඳට හාස්‍ය රසය දනවනව නම්, ඒක ඉගෙන ගෙන අනෙක් අයත් කෑලි එකතු කරල කියනවා. නැත්නම් සෘත කවියක කෑල්ලක් දෙකක් දාලා චින්තා හැකියාවත් අරගෙන අලුත් එකක් හදනවා. එතකොට කවි රසය වැඩියි. හරියටම හිතල ගන්න බැරි නිසයි එහෙම කරන්නේ.

දැන් මේ කියපු කවිත්වයන් තුනටම වඩා වෙනස් හා වැදගත් කවි වර්ගයක් බුදුන් වහන්සේ විශේෂ කොට පෙන්නුවා. ඒ කවිත්වය කලින් කියපු කවිත්වයන් තුනටම වඩා අති දුර්ලභයි. ඒ තමයි පටිභාන කවිත්වය. මේ කියන පටිභාන කවිත්වය අර කලින් කියපු කවි වගේ ආයාසයෙන් ගොතන කවිවත්, ගොතපු කවිවත්, කටපාඩම් කරගත් කවිවත් නෙවෙයි. **සමාධියේදී නිරායාසයෙන් ගෙතී එන කාව්‍යමය හැකියාවක්.** ඒක අභ්‍යන්තරයෙන්මයි ගලා එන්නේ. හරිම ගැඹුරු දෙයක්. මනස යම් කිසි සමාධියකට පත්වෙලා ඒ සමාධිය තුළින්මයි නැගිල එන්නේ. එතකොට චින්තා කවිවලදී වගේ හිත හිතා ගැනීමක් නෑ. **සමාධියෙන්මයි ශබ්ද විද්‍යානුකූලව ගෙතිල එන්නේ. අක්ෂර, ගණ, මාත්‍රා, එළිසම, එළිවැට කියන මේ සියල්ලම සමාධියේදී ගෙතෙනවා.** ඒක හරිම දුර්ලභ දෙයක්. ගැඹුරු සමාධියක් නැත්නම් එහෙම එන්නෙත් නෑ.

සමාධි කියන ඒවාත් විවිධාකාරයි. යම් කිසි සමාධියක් තියේ නම් ඒක හුරු කරගෙන වැඩිය යුතුයි. කවි සමාධිය වැඩුණොත් තමයි කවිත්වය මතු වෙන්නේ. ඒක වඩා ගන්නා ක්‍රම අද වෙනකොට පොතපතකින්වත් ඉගෙනගන්න නෑ. ඔක්කෝම යටපත් වෙලා. නමුත් කොහොමහරි මේ කාරණය නැවත මතු වෙලා තියෙන නිසයි මේ පෙන්වා දෙන්න හදන්නේ. දිවැස් සමාධිය වගේ දේවල් ගන්න හැටි නම් යම් ප්‍රමාණයකට පොත්පත්වල සඳහන් වෙනවා. උදාහරණ ලෙස කෙනෙකුට පෙරදිග දිවැසින් බලන්න ඕන නම්, චතුර්ථ ධ්‍යානයට ☞

සමවැදිලා ඒක පාදක කරගෙන පෙර දිගට හිත යොමු කරලා පෙරදිග සතුන් බලන්න පුළුවන්. එහෙම හිතලා ඒ පැත්තට අවධානය යොමු කර යළි යළි සිහි කරනවා. එතකොට ඒ පැත්තට සමාධිය වැඩිලා ඒ පැත්තේ සතුන් ආදිය පෙනෙන්න පටන් ගන්නවා. දිවැස් අභූවෙන ප්‍රමාණයට, නොපෙනෙන අමනුෂ්‍ය කොට්ඨාස, දේවතා ආදියත් දකින්න පුළුවන්. ඒක මස් ලේ ඇස්වලින් බලන එකක් නෙවෙයි. මනසට ගෝචර කරල ගන්න කාරණයක්.

මේ විදිහට පෙරදිග බලන කොට පසුදිග පේන්නෙ නෑ. පසුදිග වසන සත්වයන් සිහි කරලයි ඒක බලන්න ඕන. එතකොට ඒකට පෙරදිග බලපු සමාධිය හරියන්නෙ නෑ. ඒක වෙනම සමාධියක්. මේ වගේ දකුණු දිග බලන සමාධිය නම් ඒකට වම් පැත්ත පේන්නෙ නෑ. මේ නිසා දස දිසාවන් වඩනව නම් දිසා දහයට සමාධි දහයක් වැඩිය යුතුයි. එතකොට දස දිසාවේම සත්වයන් බලන්න පුළුවන්. දැන් මේ විදිහට වඩන සමාධියෙන් සත්වයන් පේනවා විතරයි ඇහෙන්නෙ නෑ. ඇහෙන්න නම් සවන ඒ පැත්තට යොමු කළ යුතුයි. ඒක කන් යොමාගෙන බාහිරින් ශබ්ද අහනවා වගේ නෙවෙයි, මනසින් යොමු කළ යුතුයි. එතකොට ඒ ශබ්ද මනසට ඇහෙන්න පටන් ගන්නවා. ඒකත් සමාධියක්. මේ වගේ සමාධියක් සාමාන්‍ය වශයෙන් පොතක විග්‍රහ කරල තියෙනවා මිසක් විස්තර ඇතිව නෑ. මෙවැනි අවස්ථාවකදී සසර පුරුද්දට හෝ නැත්නම් වෙනත් විශේෂිත ප්‍රගුණ ක්‍රමයකින් ලැබිල හෝ ඒ ක්‍රමවේදය හරියට ආවොත් සමාධිය ගන්න පුළුවන්.

මේ කියන කාව්‍යමය සමාධියත් ඒ වගේ හදල ගන්න ඕන එකක්. සසර මොකක් හෝ පුරුද්දක් තිබුණ නම් ඒක බොහෝ විට උපනිශ්‍රය වෙනවා. උපනිශ්‍රය ඇතිවම යොමු කරන කොට ඒ කාව්‍යමය හැකියාව ලැබෙනවා. එහෙම ලැබෙන්නෙත් විවිධ අයගේ සසර පුරුදු හා පාරමිතාවන්ට අනුකූලවයි. මෙතනදී ලෞකික සමාධිවලින් පටිභාන කවිත්වය නැගෙන්නත් පුළුවන්. නමුත් බුදුන් වහන්සේ විශේෂ කොට දක්වූයේත්, ලොව අති දුර්ලභ වන්නේත් ලෝකෝත්තර සමාධිය තුළින් නැගෙන පටිභාන කවිත්වයයි. 'පටි' කියන්නේ බැඳ ගත්තා කියන එකයි. පටියකින් කරන්නේ යමක් තවත් තැනකට බැඳ තැබීමයි. ''භාන'' කියන්නේ ඒ විදිහට බැඳ ගත් දේවල් බිඳ හැර හංග කරනවා කියන එකයි. ඒකෙ ලෞකික පැත්ත ගත්තොත්, යම් කිසි ලෞකිකව බැඳුණු ස්වභාවයක් ඒ තත්ත්වයෙන් බිඳ හැරලා වෙනස් කරන්න පුළුවන්. උදාහරණයක් ලෙස **ලෝක සම්මතයේදී තමන්ගේ යම් වස්තුවක් නැති වීමෙන් ශෝකාකුල තත්ත්වයට පත් වෙලා ඉන්න කෙනෙකුගේ ඒ ශෝකය බිඳහැරීම ලෞකික වශයෙන් කළ හැකි නම් ඒකත් එක්තරා පටිභාන ශක්තියක්.**

තවත් උදාහරණයකින් පහදන-වනම්, පුංචි ළමයෙකුට යම් කිසි සෙල්ලම් පිස්තෝලයක් අරන් දුන්නොත් ඒ ළමයා බොහොම වටිනා දෙයක් විදියට ඒක ආසාවෙන් අරගන්නවා. නමුත් අපි දැන ගත්තොත් ඒක යහපත් දෙයක් නෙවෙයි කියල, ඒ ළමයගෙන් අපි ඒක ඉවතට ගන්නවා. එතකොට ළමයා අඬන්න පටන් ගන්නවා. මෙතනදී වෙනත් හාස්‍ය රසයක් හෝ එබඳු විදියක යම් කිසි ස්වභාවයක් පෙන්වලා ළමයා සනසනවා. එතකොට වෙනත් උපක්‍රමයකින් ඒ වෙනත් රසය දෙසට ළමයා යොමු කර ගන්නවා . දැන් මෙතනදීත් පටිභානයක් තමයි වුණේ. එනම් ලෞකික වශයෙන් බැඳිල හිටපු යම් කිසි ගති ස්වභාවයකින් බිඳ හැරියා. එවැනි බිඳහැරීමක් ලෞකික වශයෙන් හෝ යහපතට හේතුවෙනව නම් ඒකත් ප්‍රඥාවේ නිගමනයක්. නමුත් නිවන් දකින්න නෙවෙයි. හැබැයි යහපතේ බැඳිල ඉන්න කෙනා ඒකෙන් ඉවතට ගන්නත් ක්‍රම තියෙනවා. එතකොට ඒවා අවිද්‍යාවේ නිගමන වෙනවා. උදාහරණ විදිහට යම් කිසි ශබ්දයක් කරලා තාපසයෙකුගෙ සිල් බිඳින්න පුළුවන්. එතැනත් පටි බිඳ හැරීමක්. ඒ ලෞකික වූ අයහපත් පැත්තක්. නමුත් පරමාර්ථ වශයෙන් ලෝකෝත්තර මගේදී පටිභාන කියන්නේ සත්වයා සසරට බැඳ තබන ලද අවිද්‍යා තණ්හාවලින් හටගත් දස සංයෝජන ධර්ම නමැති පටි බිඳහැරීමයි. ඒ තමයි ප්‍රඥාවේ උසස්ම තත්ත්වය. කලින් කිව්ව වගේ තාවකාලික තදංග විෂ්කම්භන වශයෙන් හෝ සමනය කරන්න පුළුවන් හැකියාවක් තියෙනව නම් ඒකත් ලෞකික වශයෙන් පටිභානයක්. ඒක සමුච්ඡේද ප්‍රහාන ඇති කරන්න පුළුවන් හේතු වාසනා ඇති තත්ත්වයක් තමයි පටිභානත්වයේ උපරිමය වන ලෝකෝත්තර පැත්ත.

කොහොම හරි මේ ලෞකික පටිභාන කවිත්වයම කවදාහරි ලෝකෝත්තර පටිභාන කවිත්වය ඔප් නැංවෙන්න හේතු වෙනවා. විශේෂයෙන් පාරමිතා පුරාගෙන එන අයටත්, සසර හේතු වාසනා ඇති අයටත් විශේෂයි. මැණික පොළොවේ තිබුණත් මැණිකමයි. නමුත් ඒක පොළොවෙන් අරගෙන කපා ඔප දැමුවම වටිනාකමත්, හැඩ වැඩත් වැඩියි. ඒකෙන් ගන්න පුළුවන් ප්‍රයෝජනත් වැඩියි. මේ වගේ ලෞකික පටිභාන ශක්තිය තියෙන අය ඉන්නවා. ඒ අය ආර්ය භාවයට පත් වුණොත් ඒ ශක්තිය ඔප් නැංවෙනවා. එතකොට වටිනාකම වැඩියි. උදාහරණ විදිහට අපේ ගෞතම බුද්ධ ශාසනයේ පටිභාන කවිත්වය අතරින් අගතැන්පත් වෙච්ච වංගීස මහරහතන් වහන්සේ ගැන කතා කරන කොට උන්වහන්සේ පෙර බ්‍රාහ්මණයෙක්. එතකොටත් කවි කියන්න පුළුවන්කම තිබුණා. පෙර බුදුවරයන් වහන්සේ නමක් උන්වහන්සේගේ ශාසනයේ රහත් නමකට පටිභාන කවිත්වයේ අග තනතුර පිරිනමනවා දැකලා, ඒ බ්‍රාහ්මණයත් බුදු පා මොක් මහ සඟනට දන් දීලා එවැනිම ප්‍රාර්ථනාවක් කළා. ඒ පැතුම මුල් කරගෙන ගිහි කල සිටියදීත් වංගීස හිමියන්ට කාව්‍යමය හැකියාව තිබුණා. හැබැයි ලෞකික වශයෙන්. ඒ කවි හැකියාව මුල් කරගෙන විවිධ අවස්ථාවලදී විහිළුවට වර්ණනා කරල කවි කියන්න පටන් ගත්තා. මේ නිසා කාන්තාවන් මග තොට ගමන් කරන සමහර අවස්ථාවලදීත් අනුරාගී හැඟීම් එන විදිහට කවි කියන්න පටන් ගත්තා. විශේෂ හැකියාවක් නිසා කවි රසයෙන් මත් වෙලයි හිටියේ. මාර්ගඵල ලැබීමට පෙරත් තිබුණු ඒ හැකියාවත් පටිභානයි. ඒක පාරමිතා බලයෙන් ලැබුණු එකක්. ලෞකික වූ ඒ පටිභාන කවිත්වය මාර්ගඵල ලැබීමත් සමගම බලවත්ව නැගී ඇවිත් නුවණ මුල්කරගත් ලෝකෝත්තර පටිභාන කවිත්වයට පරිවර්තනය වුණා.

මේ නිසා පටිභාන කවිත්වය කිව්වම ප්‍රඥාව මුල් කරගෙන ලෝකෝත්තර පැත්තට ගෙනෙන කවිත්වයකුත් ලෞකිකත්වය මුල් කරගෙන නැගෙන කවිත්වයකුත් ලෙස දෙකක් තියෙන බව තේරුම් ගත යුතුයි. මෙයින් ආර්ය විනයේ පටිභාන කවිත්වය කියන්නේ දස සංයෝජන ධර්ම බිඳ හරින්න පුළුවන් කාව්‍යමය ශක්තියක් දෙන කවි රටාවයි. **සසර නිසග්ග ප්‍රතිභා ශක්තිය වැටහෙන නුවණින් යුතු කවියා පටිභාන කවියා ලෙසයි ධර්මයේ දක්වෙන්නේ.** සංසග්ග කියන්නේ අනුන්ගේ උදව් සහගතව එක්වෙනවා කියන එකයි. නිසග්ග කියන්නේ **අනුන්ගේ උදව්වක් නැතිව සසරේදී තමා විසින් කළ පින් මහිමය හේතුවෙන් නැගෙන ශක්තියයි.** සසරින් වෙන් කරන්න පුළුවන් විදිහේ නුවණ සහිත කාව්‍යමය හැකියාව තියෙන කෙනා ශ්‍රේෂ්ඨ පටිභාන කවියායි. ඒ කියන්නේ දස සංයෝජනයන්ගෙන් ☞

වෙන් කරනවා කියන එකයි. එනම් ධර්මය අවබෝධ වුණාම, තියෙන කවි හැකියාව තුළින් සසරට බැඳ තබන ලද සංයෝජන ධර්ම බිඳ හැරෙන විදිහට අර්ථය එන්න කවියෙන් ක්‍රමානුකූලව දේශනා කරන්න පුළුවන් වෙනවා. මේ නිසා බුදුන් වහන්සේ විශේෂ කොට දක්වූ, ලෝකෝත්තර වූ පටිභාන කවිත්වය ලෝකෝත්තර දහම් අවබෝධ කළ අයට පමණක් පිහිටන හැකියාවක්. මොකද චතු පටිසම්භිදා ඥානවලදී පටිභාන ඥානයේ විශේෂ අවස්ථාවක් තමයි පටිභාන කවිත්වය කියන්නේ. ඒ ඥානවලින්මයි මේ කවි ගෙතෙන්නේ.

මගඵලලාභීන් අතරෙන් මේ පටිභාන කාව්‍යමය හැකියාව විශේෂයෙන් තියෙන අය අති දුර්ලභයි. ඇත්තු අතර ගජමුතු ඇතුන් දුර්ලභ වගෙයි, මේ කවි හැකියාවත් ප්‍රකටව පිහිටන අය දුර්ලභයි. මොකද ඒක විශේෂ පාරමිතා බලයකින් ලැබෙන දෙයක්. කොච්චර දුර්ලභ ද කියනව නම්, මේ ගෞතම බුද්ධ ශාසනයේ පටිභාන කවිත්වය විශේෂයෙන්ම ප්‍රකට වූ අවස්ථා සඳහන්වෙලා තියෙන්නේ හතර දෙනෙකුටයි. ශ්‍රාවකයන් අතරින් වංගීස මහරහතන් වහන්සේ තමයි අගතැන්පත් වුණේ. ඊළඟට සැරියුත් හිමියන්ටත් ඒ හැකියාව තිබුණා. වංගීස හිමියන් සැරියුත් හිමියන්ට කවියකින් යමක් පැවසුවාම උන්වහන්සේ පටිභාන කවියකින්ම ඒකට පිළිතුරු දුන්නා. මේ වගේ අවස්ථා නිසා ඒ හැකියාව දියුණු වුණා. ඉන්පසු මගඵලලාභීත්වයත් සමග විශාල ලෙස ඒ ශක්තිය ලැබුණා. ඊළඟට චුල්ලපන්ථක හිමියන්ට මුලින් එක ගාථාවක පද දෙකක්වත් පාඩම් කර ගන්න බැරිවයි හිටියේ. නමුත් අරිහත්වයට පත්වීමත් සමගම පටිභාන කවිත්වය ලැබුණා. අත්ථ, ධම්ම, නිරුක්ති, පටිභාන කියන සිව්පිළිසිඹියාව ලැබුණු පසු එදාම උන්වහන්සේ ගාථා පන්සියයකින් අනුමෝදනා බණ දේශනා කළ බව ධර්මයේ සඳහන් වෙනවා. එතකොට ඒ ගාථා ගෙතුණේ පටිභාන ශක්තියෙන්. ඒකත් පටිභාන කවිත්වයක්. මීළඟට පටිභාන කවිත්වය ප්‍රකට වූ තවත් විශේෂ පුද්ගලයෙක් තමයි ද්‍රෝණ නම් බ්‍රාහ්මණතුමා. එතුමා අනාගාමී ඵලයට පත් මොහොතේම කවි දොළොස් දහසකින් බුදු ගුණ වර්ණනා කළ බවට බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වෙනවා. ඒක ප්‍රසිද්ධ වෙලා තියෙන්නේ ''ද්‍රෝණ ගර්ජනා'' කියලයි.

මේ වගේ සිව්පිලිසිඹියාව නැගුණු අයගෙන් සමහර අයට පටිභාන කවිත්වය මතු වෙනවා. මේ කියන පටිභාන කවිත්වය අනෙක් අයටත් නැතුවා නෙවෙයි. නමුත් ඒක විශේෂයෙන්ම ප්‍රකටව තිබුණු අවස්ථා හතරක් තමයි මේ පෙන්නුවේ. ඒ අති දුර්ලභ වූ පටිභාන කවිත්වය දන් නැවතත් මතුවෙලයි තියෙන්නේ. නුදුරු අනාගතයේදීම ඒවා නැවතත් ප්‍රසිද්ධියේ අහන්න ලැබේවි.

අනෙක් කාරණය නම් ධර්මානුකූලව නැගෙන පටිභාන කවිත්වය විවිධ මට්ටම්වලින් පිහිටන්න පුළුවන්. ඒකෙ විශේෂම තත්ත්වයේ හිටියොත් තමයි පටිභාන කවිත්වය විශේෂයෙන්ම ප්‍රකටව පිහිටන්නේ. ඒක හරිම බලවත්. එතකොට ඒ ශක්තියත් සමග සමවතින් පටිභාන කවිත්වය නැගෙනවා. එහෙම නැගෙන්නෙත් විවිධාකාරයෙන්. ඒකාකාරීත්වයක් නෑ. **සතර පද පිහිටන විදිහට අවශ්‍ය නම් ඒ විදිහටත්, කැමති කැමති විදිහටත්, සමාධියට අනුව නැගෙන විවිධාකාර විදිහටත් ආදී ලෙස විවිධාකාරයෙන් ගන්න පුළුවන්.** නිසඳැස්වලින් ඕන නම් එහෙමත් පුළුවන්. ඒ වගේම අධිවේගවත්ව ක්‍රමානුකූල ක්‍රම රටාවකට අනුව වචන ගලාගෙන එනවා. හරියට ගඟ ගලනවා වගෙයි. උස් පහත් තැන් නෑ.

**මේ පටිභාන කවිත්වයේ විශේෂ ස්වභාවයක් තමයි ධර්ම දේශනාවකට ගියාම එක දිගටම ධර්මානුකූල අදහස් කවියෙන්ම ගලා ගෙන ඒම.** ඒවා ගොත ගොතා ඉන්න කවි නෙවෙයි. නිරායාසයෙන්ම ගෙතිලයි එන්නේ. හිත හිතා කියන්න දෙයක් නෑ. ඒ තමයි විපාක හිතේ හැටි. විපාක හිත නිරායාසයි. උදාහරණයක් විදිහට අවුරුදු උත්සවයක් වගේ අවස්ථාවකදී කෙනෙක් බොරුවට හිත හිතා අඬන්න පුළුවන්. එතකොට ස්වභාවිකව ශෝකයට සංවේගයට පත් වුණාමත් අඬනවා. නමුත් හිත හිතා අඬන්නෙ නෑ. හැඟීමත් එක්කම ඇඬීම එනවා. ඒ හැඟීම බොහොම සංවේගාත්මකයි. සමහර විට බලන් ඉන්න අයටත් ඇඬෙන්න පුළුවන්. නිකන් විහිළුවට අඬනවා වගේ නෙවෙයි. උත්සවයකදී වගේ තරඟකාරිත්වයට අඬන්නෙ නෑ. ඒ තරමටම සංවේගාත්මකයි. ඒ ශෝක ගතියෙන් එන නිසයි. එතකොට ඒක ශෝක සමාධියක්. මිථ්‍යා සමාධි, සම්මා සමාධි, ආර්ය සමාධි ආදී විවිධ සමාධි තියෙනවා. මොනවා හෝ ගති ලක්ෂණයකට හිත පිහිටපුවම ඒ ගතියෙන් ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නවා. මේ වගේ පටිභාන කවිත්වය තියෙනවනම් ආර්ය සමාධියක ස්වභාවයකට ආවාම, ඊට අනුකූලව කවි නැගෙන්න පටන් ගන්නවා. එතකොට කිසිම ආයාසයකින් තොරව ගඟ ගලන්න වගේ නිරායාසයෙන්ම කවි නැගෙනවා. **එන අදහස් පවා ධර්මයට අනුකූලවමයි ගෙතෙන්නේ. ධර්මයෙන් පිට පනින්නෙ නෑ.** කොහෙන් පටන් ගත්තත් අන්තිමට නිවන අරමුණු කරගෙනමයි කෙළවර වෙන්නේ.

සාමාන්‍ය දේශනාවක් ගත්තත් අත්ථ කවි, සුථ කවි, චින්තා කවි කියන මේ කාව්‍යමය හැකියාවන් සලකා බැලුවත්, මේ සියල්ලටම වඩා පටිභාන කාව්‍යමය දේශනාවක විශේෂත්වයක් ගන්නා ලක්ෂණ කිහිපයක්ම තියෙනවා. අනෙක් අවස්ථාවලදී වගේ නෙවෙයි මෙතනදී **කිසිම වෙහෙස මහන්සියක් දැනෙන්නෙ නෑ. කාල වේලාව පිළිබඳ ප්‍රශ්නයකුත් නෑ. ඕන තරම් වෙලාවක් කවියෙන්ම දේශනා කරන්න පුළුවන්.** සමහර විට පැය දහයක් පහළොවක් වෙන්නත් පුළුවන්. **කොච්චර කිව්වත් කාව්‍යමය රටාවට ගෙතී එන දහම් කරුණු මෙච්චරයි කියල සීමා වීමක් වෙන්නෙත් නෑ.** එකම දහම් කරුණ වුණත් විවිධ උපමා උදාහරණ සහිතව විවිධාකාර රටාවන්ගෙන්, එකිනෙකට වෙනස් කවි පදවලින් විග්‍රහ කරන්න පුළුවන්. හරියට අපි කතා කරනවා වගෙයි. දෙන්නෙක් කතා කරන කොට කතාවට දක්ෂ කෙනාට ඕන තරම් කතා කරන්න පුළුවන්. ආයාසයෙන් හිත හිතා කතා කරන්නෙ නෑ. අදහසට අනුව ගෙතිල ආපු එක කතා කරනවා. පටිභාන කවිත්වයත් මේ වගේමයි. කොච්චර කිව්වත් අමාරුවක් නෑ. ඒ කවිත්වය නිසාම සමාධියත් නැගෙනවා. එන්න එන්නම පහසුත් වෙනවා. ඊට පසු ඕන නම් කවියෙන් කතා කරන්නත් පුළුවන්. ප්‍රශ්න උත්තර මේ ඔක්කොම කවියෙන් ලබා දෙන්නත් පුළුවන්.

සාමාන්‍ය පටිභාන දේශනාවකත් එක්තරා ආකාරයක ගලාගෙන යන ස්වභාවය නිසා කවිත්වය කියන එක තියෙනවා. නමුත් **හතර පද ගැලපිලා එන ක්‍රමය විශේෂත්වයක් ගන්නවා.** මේ නිසා අහගෙන ඉන්න ශ්‍රාවකයන්ගේ හිත ඇදෙන විදිහට ගලාගෙන එනවා. ඒ දේශනාව ධර්මානුකූලව පිහිටියා නම් දහමට අනුවමයි කවි ගෙතෙන්නේ. දාන කතා, සීල කතා, සග්ග කතා, ආදීනව කතා හා නෙක්ඛම්ම කතාවලින් ඒ කාව්‍යමය දේශනාව පරිපූර්ණයි. දාන කතාවෙන් කියන්නේ අල්ලගෙන ඉන්න ☞

ලෝකය අතහැර දැමීම ගැනයි. දාන කියන්නේ දාන්න කියන එකයි. එනම් අල්ලගෙන ඉන්න දේවල් අතහැර දමන්න කියන එකයි. සීල කතාවෙන් කියන්නේ ලෝභ ගිනි, ද්වේශ ගිනි, මෝහ ගිනි නැති වෙලා, සැඩපරුෂ ගති නැති වෙලා ලබන සැනසීම හෙවත් සිසිල්වීම ගැනයි. සග්ග කියන්නේ සුවයයි. සුගති සුවය පිළිබඳ කතාව තමයි සග්ග කතාවෙන් කියන්නේ. ලෝකයේ ආදීනව හෙවත් අනිච්ච, දුක්ඛ, අනත්ත ගැන විග්‍රහ කරන්නේ ආදීනව කතාවෙන්. අවසානයේ කෙරෙන නෙක්ඛම්ම කතාවෙන් කියන්නේ ලෝකයෙන් නික්මීමෙන් ලබන අත්දැකීමයි, නිවන් සුවයයි.

මේ පෙන්වා දුන්නේ ලෝකෝත්තර පැත්තයි. ඒ වගේම මේවායින් පෙන්වන ලෞකික පැත්තකුත් තියෙනවා. එතැනදී දාන කතාවලින් කියන්නේ දන් දීමේ ලෞකික ආනිසංසයි. එනම් සුගතිවල උප්පත්තියට හේතු වන බවයි. ලාභ, කීර්ති, ප්‍රශංසා ආදිය ලැබෙන බවයි. සීල කතා කිව්වම අපි අද ලෝක සම්මතයේ කතා කරන කයින්, වචනයෙන් සංවරවීම කියන බාහිර සංවරත්වය ගැනයි කියන්නේ. සග්ග කතා කිව්වම දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝක ගැන කියවෙන ස්වර්ගය ගැනයි කියවෙන්නේ. ආදීනව කතා, නෙක්ඛම්ම කතා කිව්වම අපි අද ලෝක සම්මතයේ කතා කරන ලෝකයේ තියෙන බාහිරට පෙනෙන ආදීනව ගැනයි, නිවන ගැනයි කියවෙන, අත්දැකීම් නැති ලෝක සම්මත කතාවයි කියන්නේ.

දැන් අර මුලින් පෙන්වපු ලෝකෝත්තර පැත්ත හෙවත් පරමාර්ථ පැත්ත තියෙන්නේ උග්ඝටිතඤ්ඤ (මහා ප්‍රාඥ), විපංචිතඤ්ඤ (මධ්‍යම ප්‍රාඥ) කියන ගැඹුරටම දහම් අවබෝධ කරගන්න පුළුවන් ප්‍රඥා අධිකයන්ටයි. ඤෙයිය (සාමාන්‍ය නුවණ ඇති) කියන පුද්ගලයන්ට ඒ විදිහට එකපාරටම ගැඹුරු දහම් අවබෝධ කර ගන්න බැරි නිසාත්, හුගක් කල් දේශනා කරල අවබෝධ කරගත යුතු නිසාත් මුලින්ම මේ කියන කාරණයන්ගේ ලෞකික පැත්ත පෙන්වා දෙනවා. මේ විදිහට **පටිභාන කාව්‍යමය දේශනාවක් ලෞකික ජීවිතයේ දියුණුවටත්, අවසානයේ ලෝකෝත්තර වූ නිවනටත් හේතු වන ආකාරයෙන්මයි ගෙතිල එන්නේ.** එවැනි කාව්‍යමය දේශනාවකට සමවතින් සම්බන්ධ වෙලා ඉන්න පිරිසගේ ශ්‍රද්ධා, සීල, ශෘත, ත්‍යාග, ප්‍රඥා කියන මේවා වැඩෙන්න හේතු වෙනවා. එමගින් ලැබෙන ආශිර්වාදයත් අනන්තයි අප්‍රමාණයි.

පටිභාන කවිත්වයේ ඇති තවත් ලක්ෂණයක් තමයි නිරායාසවම සමාධියට අනුව, දහම් හැඟීමට අනුව කවි ගෙතීම. එතකොට හිත හිතා ගොත ගොතා ගන්න දෙයක් නෑ. ඒකෙ විශේෂත්වය පැහැදිලිව දැන ගන්න පුළුවන්. මොකද හිත හිතා කියන කොට කෙඳිරි ගගා කියන්න ඕන. අ... කිය කියා කල්පනා කරලයි කියන්නේ. පටිභාන කවිත්වයේදී තියෙන දක්ෂතාව එතැන නෑ. නමුත් පටිභාන කවිත්වයේදී වේගවත්ව පැටලීමකින් තොරව කවි පද ගලාගෙන එනවා. එළිසම, එළිවැට තියෙන ඒවා සාමාන්‍ය කවිවලට වඩා විශේෂත්වයක් ගන්නවා. ඒ වගේම අක්ෂර, ගණ, මාත්‍රා සියල්ලම ක්‍රමානුකූලව ගැළපිලා ශබ්ද විද්‍යානුකූලවයි එන්නේ. පදයෙන් පදයට යන කාල සීමාව, අකුරක් ශබ්ද කරන්න යන වෙලාව ආදියත් ක්‍රමානුකූලවයි එන්නේ. යම් කිසි විදියකින් මේ සියලුම දේවල් අංග සම්පූර්ණ වුණොත් කිසිම අඩු පාඩුවක් නැතිවම ගෙතිල එනවා. හැබැයි ඒක විවිධ අයට විවිධ මට්ටම්වලින් තියෙන්න පුළුවන්. සහමුලින්ම සම්පූර්ණ නම් එක තැනකවත් කෙස් ගහක්වත් වෙනසක් වෙන්නෙ නෑ. ඒ ශක්තිය නැඟුණාට පස්සෙ මොනවා කියන්න ගියත් ඊට අනුකූලවමයි එන්නේ. එතකොට අහන කෙනාට වශීකෘත බවක් ඇතිවෙනවා. ඒක ශ්‍රාවකයාට හොඳ දහම් අවබෝධයක් ලබන්නත්, අර්ථය ඇඳල එන්නත් හේතු වෙනවා.

සමහරවිට පටිසම්භිදා ඥාන තියෙන නිසා විවෘතව (දැනුවත්ව හෙවත් කරන දේ වැටහෙන) වෙන්නත් පුළුවන්, එසේ නැතිව අභ්‍යන්තරයෙන් මතුවෙලා එන ඥානයේ ස්වභාවයෙන් (දැනුවත් නොවී අදහසට අනුව) වෙන්නත් පුළුවන්, **අහන් ඉන්න කෙනෙකුගේ අදහසට අනුව දේශනාව ගෙතිල එන ක්‍රමයකුත් තියෙනවා.** විශේෂයෙන් යම් කිසි කෙනෙකුගේ අදහස දැකල දේශනා කිරීමේ හැකියාව බුදුන් වහන්සේට නම් සියලු ආකාරයෙන්ම පරිපූර්ණයි. උන්වහන්සේ ධර්ම දේශනා කරන කොට අහගෙන ඉන්න හැම කෙනාටම තමන්ගේ භාෂාවෙන් තේරුම් ගන්න පුළුවන් කියන්නෙත් මේ නිසයි. මීට අමතරව කෙනෙකුගේ අදහස දැක්කෙ නැතත් ඔහුගේ අදහසට අනුව ධර්මානුකූලව දේශනාව ගෙතිල එන ක්‍රමයකුත් තියෙනවා. එතකොට අහගෙන ඉන්න අයට හිතෙන්නේ තමන්ගේ හිතේ තියෙන අදහස්වලට අනුව දේශකයාණන් වහන්සේ වෙතින් දේශනාව ගෙතිල එන බවයි. ඒක පැහැදිලිවම අහන් ඉන්න ශ්‍රාවක පිරිසට දැනෙනවා. නමුත් දේශකයාණන් වහන්සේ, අහවල් කෙනා මොකක්ද හිතාගෙන ආවේ, ඒකට මේක කියන්න ඕන කියල හිතාමතාවත්, එහෙම නැත්නම් පරචිත්ත විජානනයකින්වත් නෙවෙයි දේශනාව කරන්නේ. **නමුත් දේශනාවේ අදහස් ගලාගෙන එන්නේ අහන් ඉන්න පිරිසගේ ප්‍රශ්නවලට අනුකූලවයි. ඒක සමාධියට ගෝචර වන ක්‍රමයක්.** පටිභාන කවිත්වයේ ස්වභාවයත් එහෙමයි. මේ හේතුව නිසාම විවිධ අවස්ථාවලදී සිදු කරන පටිභාන කාව්‍යමය දේශනාවල අඩංගු කවි පදවැල් එකිනෙකට වෙනස්. හේතුව විවිධ අවස්ථාවලදී ඒවාට සහභාගී වන පින්වත් පිරිස් හා ඔවුන්ගේ අදහස් එකිනෙකට වෙනස්වීමයි. එතකොට ඒ ඒ අයට ගැළපෙන විදිහට දහම් අර්ථයන් මතු කරන කවි පදවැල් ගෙතිල එනවා.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් පැන නගින්න පුළුවන්, මේ විදිහට පටිභාන වුණත් කවියෙන් දේශනා කරන්න ගියාම ඒ කවිවල තියෙන කාව්‍යමය රසයට, ශෘංගාර රසයට හිත ගිහින් ශබ්ද රාගයෙන් මත් වෙලා ඉන්නවා මිසක් නිවනට හිත පිහිටන්නෙ කොහොමද කියල. ඒ කාරණය මේ විදිහට පැහැදිලි කරන්න පුළුවන්. යම්කිසි කෙනෙකුගේ තියෙන යම්කිසි අදහසක්, දෘෂ්ටියක් උපක්‍රමශීලීව වෙනස් කරන්න අපට වෙනත් අදහසක් යොදා ගන්න පුළුවන් අවස්ථා තියෙනවා. උදාහරණ විදිහට නන්ද හිමියන්ට ජනපද කල්‍යාණිය ලබා ගන්න බොහෝ කාලයක් තිස්සේ තිබුණු මානසිකත්වය වෙනස් කරන්න උපක්‍රමයක් ලෙස බුදුරජාණන් වහන්සේ ක්ෂණික දර්ශනයකින් පරෙවි කකුල් වගේ පාද තියෙන ලස්සන දෙවඟනන් පෙනෙන්න සැලැස්සුවා. ඒ විදිහේ ලස්සන දෙවඟනන් පෙන්නලා ඒ අය ලබා ගන්න ඕනද කියලත් ඇහුවා. ඒ රූපයන්ට වසඟ වෙච්ච නන්ද හිමියන් දෙවඟනන් ලබා ගැනීමේ අරමුණින් සිල් රකින්න පටන් ගත්තා. මේ නිසා අනෙක් භික්ෂූන් වහන්සේලා උසුලු විසුලු කරන්න පටන් ගත්තා, අනෙක් අය නිවන් දකින්න සිල් රකිනවා, නන්ද දෙවඟනන් ලබා ගන්න සිල් රකිනවා කියල. එයින් ඇති වූ ලජ්ජාව නිසා නන්ද හිමියන්ගේ ඒ මානසිකත්වය යහපත් අතට වෙනස් වෙලා නිවනේ වටිනාකම දැකල නිවන් අරමුණු කරගෙන මගඵල ලබන්න පුළුවන් වුණා.

දැන් මෙතනදී බුදුන් වහන්සේ නන්ද හිමියන්ගෙන් දෙවඟනන් ☞

ගැන විමසුවේ ශෘංගාර රසය එන විදියටයි. නමුත් උන්වහන්සේ ඒක එතැනදී යොදා ගත්තේ උපක්‍රමයක් හෙවත් සම්‍යක් ප්‍රයෝගයක් වශයෙන්. ඒ උපක්‍රමය නිසා තමයි නන්ද හිමියන් නිවැරදි මගට යොමු කරන්න පුළුවන් වුණේ. මේ නිසා ශෘංගාර රසය ගැනීමේදීත් අවස්ථානුකූල ක්‍රමයක් තියෙනවා. ඒ නිසා ශෘංගාර රසයත් උපක්‍රමයක් විදිහට යොදා ගන්න පුළුවන්. මේක ලෞකිකව උදාහරණයකිනුත් පැහැදිලි කරන්න පුළුවන්.

චොක්ලට් වගේ පැණි රස දේවල් කන්න පොඩි ළමයි හරි කැමතියි. නමුත් බෙහෙත් වගේ තිත්ත දේවල්වලට හරි අකමැතියි. ඒවා පොඩි ළමයින්ට දෙන්නත් අමාරුයි. මේ නිසා උපක්‍රමයක් විදිහට චොක්ලට් ආවරණයක් සහිත බෙහෙත් පෙත්තක් දෙනවා ගිලින්න පහසු වෙන්න. එතකොට ළමයි පැණි රස බලාගෙන ඒක ගිලිනවා. නමුත් ඒ රසයට බෙහෙතේ තියෙන ප්‍රත්‍යය වෙනස් කරන්න හැකියාවක් නෑ. මේ වගේ බුදුන් **වහන්සේත් සමහර වෙලාවට එබඳු ශෘංගාර රසයක් තියෙන ලෝකය අරගෙන එබඳු පුද්ගලයන් එතැනට නැඹුරු කරලා ගැඹුරු හරයක් ඇති දහම් අර්ථය අරගෙන දුන්නා. නමුත් ඒ ශෘංගාර රසය ගත්තේ උපක්‍රමයක් විදිහටයි.** එක් අවස්ථාවකදී රූපනන්දා බිසව, බුදුන් වහන්සේ රූපයට නිගරු කරනවයි කියමින් ඉන්න කොට උන්වහන්සේ ලස්සන දෙවඟනක් වැනි ස්ත්‍රියක් උන්වහන්සේට පවන් සලන අවස්ථාවක් මැව්වා. ''ලස්සන ස්ත්‍රියක් නේද මේ පවන් සලන්නේ, බුදුන් වහන්සේ රූපයට නිග්‍රහ කරනවයි කියන්නේ බොරු නේද'' යැයි කියමින් රූපනන්දා බිසව ඒ දෙස බලා ඉන්න කොට, ක්‍රමයෙන් අර රූපය ඇකිළිලා මැළවිලා වැහැරිලා වයසට යන අවස්ථාවක් මැව්වා. අන්තිමට පනුවන් ගහල දිරල යන අවස්ථාවත් මැව්වා. මෙතනදීත් මුල් අවස්ථාවේ තිබුණේ ශෘංගාර රසයයි. රූපනන්දා බිසව කැමති වුණෙත් ඒ වගේ දේවල් බලන්න. නමුත් බුදුන් වහන්සේ මෙතනදී ඒක උපක්‍රමයක් විදියට පාවිච්චි කළා. ඒකෙ ප්‍රතිඵලයක් විදිහට පැවිදි වෙලා ඒ බිසවට රහත් ඵලයට පත්වෙන්නත් පුළුවන් වුණා.

හැබැයි හැකියාව තියෙන කෙනෙක් මේ වගේ උපක්‍රම පාවිච්චි කළාට එබඳු ධර්ම හැකියාවක් නැති කෙනෙක් ඒක කරන්න ගියොත් සමහර විට අමාරුවේ වැටෙන්නත් පුළුවන්. එතකොට ඒක වැරදි පැත්තට යනවා. මේ නිසා එබඳු ඥානයක් නැති සාමාන්‍ය පුද්ගලයන්ට ඒක කරන්න බෑ. එහෙම කරන්න ගියොත් අන්තිමට ඒ පුද්ගලයත් ඒ පැත්තට ඇදිල යන්න පුළුවන්. මේ නිසා ථෙර භාවයට හෙවත් ස්ථිරත්වයට පත් වෙච්ච ඒ වගේ මානසික ශක්තියක් ඇති උත්තමයන්ට නම් ඒ ඥානය තියෙන නිසා, එබඳු ශෘංගාර රසයන්ගෙන් පවා ප්‍රයෝජන අරගෙන වෙනත් කෙනෙකුගේ යහපතට පරිවර්තනයක් කරන්න පුළුවන්. හැබැයි ඒ හැකියාව තියෙන අය අති දුර්ලභයි. මේ නිසා **පටිභාන කවිත්වයේදී ශෘංගාර රසයක් මතු වුණත් ඒක යහපත පිණිස ම වන උපක්‍රමයක් වෙනවා.**

ඊළඟ කාරණය නම් පටිභාන කවිත්වය තුළින් පුද්ගලයා විශාල වශයෙන් ධර්මයට නැඹුරු කරන්න පහසු වෙනවා. නිකන් දේශනාවකින් කියනවාට වඩා කවිත්වය තුළින් ශ්‍රද්ධාව භක්තිය ඇති කරවන්න, දහමට නැඹුරු කරවන්න පහසු වෙනවා. හරියට අර චොක්ලට් ආවරණයක් දාපු බෙහෙත් පෙත්ත වගෙයි. හැබැයි ඒ සීමාව ඉක්මවා යන්න බෑ. කාව්‍යමය හැකියාව තුළින් ගීත ස්වරයකට වැටෙන්නෙ නැතිවයි දේශනා කළ යුත්තේ. මොකද බුදුන් වහන්සේ පෙන්වා දීල තියෙනවා <u>ස්වර භඤ්ඤය</u> ගැන. (චුල්ලවග්ග පාලි 11 - ඛුද්දක වත්ථුපකරණය - 13 පිටුව) ඒ කියන්නේ ස්වර ලෙළදෙන ස්වභාවය. එතනදී ස්වර සීමාව ඉක්මවා දීර්ඝ කරන්න බෑ. දීර්ඝ කළොත් ගීත ස්වරයට වැටෙනවා. ගීත ස්වරයෙන් ගායනා කළොත් දුක් කටයුතු තත්ත්වයට පත් වෙන නිසා එහෙම කරන්න එපා කියලයි දේශනා කළේ. මේ නිසා ස්වර භඤ්ඤය අනුමත කළා. එනම් මිහිරි නාදයෙන් කියන එක අනුමත කළා. නමුත් ගීත ස්වරයේදී සිදුවන්නේ නියමිත මාත්‍රා ප්‍රමාණය ඉක්මවා ඇදීමයි. එතකොට විකෘති වෙනවා. ශබ්ද රාගය දනවනවා.

උදාහරණ විදිහට තොටුපල අයිනේ... කියන ගීතයේදී වැඩි ප්‍රමාණයක් එක දිගට යන රටාවක් තියෙනවා. එතකොට ඒ ශබ්ද රාගයට හිත ඇදිල යනවා මිසක් අර්ථයක් සිහියට එන්නෙ නෑ. මේකට තමයි ගීත ස්වරය කිව්වේ. ඒ ක්‍රමය ලෞකිකව මිනිසුන් පිනවන ගීත ගායනාවලදී හරි ගියාට භික්ෂූන් වහන්සේලා ධර්ම දේශනා කිරීමේදී ඒ ක්‍රමය ගැළපෙන්නෙ නෑ. පැහැදිලිව සවන් දෙන්න පුළුවන් ප්‍රියමනාප ශ්‍රවණ මාධූර්ය ඇති වන මට්ටමටයි ප්‍රමාණය කළ යුත්තේ. බේත් පෙත්ත අරගෙන රස බලන්න හප හපා හිටියොත් මොකද වෙන්නෙ තිත්තයි. ඒ නිසා ගිල ගන්න පහසු වෙන ප්‍රමාණයටයි කට තුල තබා ගෙන සිටිය යුත්තේ. මේ වගේ එකක් තමයි ස්වර භඤ්ඤය කිව්වේ. මාත්‍රා ගණන නියමිත ප්‍රමාණයට වඩා ඉක්මවන්න එපා කිව්වෙ ඒකයි. මේ නිසා කවුරු කොහොම කිව්වත් තමන් දැනගන්න ඕන දීර්ඝ අක්ෂරයක් මාත්‍රා දෙකකටත්, කෙටි අක්ෂරයක් මාත්‍රා එකකටත්, හල් අක්ෂරයක් මාත්‍රා භාගයකටත් වඩා නොඇදින්න. මේ ක්‍රමය කවියට, පිරිතට මේ හැම එකකටම බලපානවා. දැන් අපි කතා කරන කොටත් ඒ ක්‍රමය තියෙන්න ඕන. ඒ ක්‍රමය ඉක්මවා ගියොත් ගැළපෙන්නෙ නෑ. එතකොට ශෘංගාර රසයට, ශබ්ද කාමයට, ශබ්ද රාගයට හිත වැටෙනවා. මේ නිසා ඒ ක්‍රමයට අහු නොවෙන්නත් ඕන, දහම් අර්ථයට පලුද්දක් නොවෙන්නත් ඕන. මේ නිසා තමයි ධර්ම දේශනාවකදී රඟපාන්න එපා කිව්වේ.

යම් කිසි දේශකයන් වහන්සේ නමක් ධර්ම දේශනාවකදී වයසක කෙනෙක් හෝ පුංචි ළමයෙක් හෝ එබඳු වෙනත් කෙනෙක් කතා කරන විදිහට රඟපාලා කතා කරන්න පුළුවන්. එතකොට මිනිස්සුත් ඒක අහල සන්තෝසෙන් හිනා වෙන්නත් පුළුවන්. නමුත් ඒක ධර්ම දේශනාවකට ගැළපෙන්නෙ නෑ. මේ නිසා පුද්ගලයෙකුගේ ස්වභාවය රඟපාන්න එපා කියලයි කිව්වේ. සාමාන්‍යයෙන් කතා කරන විදිහටයි අර්ථය දෙන්න ඕන. රඟපාන්න ගියොත් ඒක බුද්ධ දේශනාවට එකඟ නෑ. ගලා ගෙන යන රටාවත් එතන නෑ. සමහර කෙනෙක් දේශනාව හයියෙන් වේගවත්ව කියාගෙන ගිහින් අවසානයේ ඇදලා හෙමින් සීරුවේ කියනවා. එතකොටත් මිනිස්සු අවධානය යොමු කරල හිනාවෙන්න එකක් හදා ගන්නවා. ඒ වගේ දේවල්වලට මිනිස්සු බොහොම ප්‍රියයි. නමුත් ඒක ධර්ම විග්‍රහයට ගළපන්න බෑ. එතකොට ධර්ම අර්ථයට වඩා ශෘංගාර රසයටයි හිත යන්නේ. ඉතින් මේ කියන අඩුපාඩුවලින් තොර, බුදුන් වහන්සේ පෙන්වා දුන් මධ්‍යම ක්‍රම රටාවට යන ශබ්ද විද්‍යානුකූලව ගෙතෙන කවි විශේෂයක් තමයි ලෝකෝත්තරව එන පටිභාන කවිත්වය කියන්නේ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වෑරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

අභයරතනාලංකාරය - 16

# දුර්ලභ ගණයේ සමාධිමය ප්‍රතිකර්මයකට එල්ලවුනු අභියෝග....



(පසුගිය කලාපයෙන් - ගුප්ත ලෝකයේ දුටු අමුතු සත්ත්වයින්....)

- වහරක අභයරතනාලංකාර හිමි

මා ගිහි වතක සිටියදී ආයුර්වේද නිධාන පොතෙන් සමාධියට නැගුනු තවත් සුවිශේෂීය ප්‍රතිකර්මයකට අදාල විස්තරයක් තමයි මේ ඉදිරිපත් කරන්නේ. ඒක සමාධියට ආපු තෙලක්. ඒ තෙල ආවේ රක්ත වාතය කියන රෝගයට. මේකෙ නිධාන කථාව කියන්න ඉස්සෙල්ල මේ රෝගය ගැනත් දැනගෙන ඉන්න එක හොඳයි.

අපේ ශරීරයේ තියෙන වා, පිත්, සෙම් කියන මේ තුන තමයි රෝග හැදෙන්න ප්‍රධාන වශයෙන් මුල් වෙන්නෙ. ඒ කියන්නෙ වා, පිත්, සෙම් විපරීත වීමෙන් . මෙයින් පිත විපරීත වීමෙන් හට ගන්නා රෝගයක් තමයි රක්ත වාතය කියන්නෙ. පිත් විස කියන්නෙ අම්ල විසක්. ශාරීරිකව පවතින අම්ලවල විසවීමෙන් හට ගන්නා රෝගයක්. පිත් විස වීම සමහර වෙලාවට විවිධ හේතූන්ගෙන් හටගන්නත් පුළුවන්. ඒ කියන්නේ ආමාශයික යුෂ වශයෙන් ශරීර ගත වන ජීර්ණ පද්ධතියේ ආබාධයන් මුල් කරගෙන හෝ එහෙම නැත්නම් යම්කිසි තැනක වස විස කැවීමක් මුල් කරගෙන හට ගන්න පුළුවන්. ඒවගේම පිත්තාශයේ ඇතිවන ආපදා ආදී විසවීම් නිසා හටගන්නත් පුළුවන්. මොකක්හරි හේතුවකින් ශරීරයේ අධිකව තියෙන අම්ල උෂ්ණවීම් මුල්කරගෙන මේ රක්ත වාතය හටගන්න පුළුවන්. එයින් හටගන්නා රෝගාබාධයක් වශයෙන් මේ තත්වය ඉහට ගැහුවොත්, නිතර ඔලුවෙ කැක්කුම, ඔල්මාදය, ඇස් රුදාව, කන් නෑසීම වගේ ආබාධ එනවා. ඒ වගේම හිසේ, අත පයේ තුවාල හැදිල ඉස්ම ගලන්න පටන් ගන්නවා. ඊලඟට මේක පයට ගියොත් යටි පතුල් පුපුරනවා. හැබැයි ඒක සාමාන්‍ය මට්ටමක්. ඒ මට්ටම ඉක්මවා ගියොත් කුෂ්ඨ එනවා. ඒකෙන් තුවාල ගොඩක් හැදිල බිබිලි දාල ඒව පුපුරල බොහෝකොටම ඉස්ම ගලන්න පටන් ගන්නවා. මූල වාතය කියන්නේ මේ රක්ත උෂ්ණය බලපාන තවත් ක්‍රමයක්. ඒ තමයි අර්ශස් ගෙඩි කියන අවස්ථාව. ඒකත් ලේ අර්ශස් වගේ විවිධ අවස්ථාවලින් තියෙන්න පුළුවන්.

මේ වගේ අවස්ථාවකදී මා ලඟට ප්‍රතිකර්ම ගන්න පැමිණි කාන්තාවකට තමයි මේ තෙල පළමුවෙන්ම සමාධි ක්‍රමයට ආවේ. ඒ මීට හුගක් ඉස්සර. මට මතක හැටියට 1986 වගේ කාලයක. ඒ කාන්තාව මේ ස්ථානයට ආවේ අතක් සම්පූර්ණයෙන්ම තුවාල වෙලා, අත වටේ තුවායක් ඔතාගෙන සැතපුම් ගණනාවක් දුර ඉඳල. ඒ එනකොට තුවාය මිරිකන්න පුළුවන් තරමට ඉස්ම වැක්කෙරෙනවා. ඒතරම්ම බරපතල වෙලයි තිබුනෙ. මේකට එක්තරා බටහිර වෛද්‍යවරයෙක් තුවාලය වේලෙන්න කියල බේතක් දීල තිබුනා. ඒකෙන් මුලු බඩ පපුව දැවිල්ල හැදිල බොහොම අමාරු වෙලා තිබුනා. ඒත් ඒ තුවාල එහෙම්ම තිබුනා. එහෙම ආපු අවස්ථාවක තමයි මේ තෙල සමාධියට මතු වුනේ. ඒ තෙල මා විසින්මයි පළමුවෙන්ම හින්දෙ. එහෙම හිඳල අවුන්ස කිහිපයක් ඒ කාන්තාවට ලබා දුන්නා.

මේ වගේ අවස්ථාවකදී සාමාන්‍ය මට්ටමේ ප්‍රහල නොවන කුෂ්ඨ ඇවිත් තිබුනොත් නිතර තෙල් ගාල හෝ තවල හොඳ කරගන්න පුළුවන්. නමුත් තත්වය ප්‍රහල නම් , දවස් හතරක් තෙල් ගගා තුවාල පොත්ත ඉබේම ගැලවිලා වැටෙන කල් තියෙන්න ඕන. මීට අමතරව අවශ්‍ය නම් තෙල් ගාල ලේ අරින ක්‍රමයකුත් තියෙනවා. මේ තෙල ක්‍රම දෙකටම යොදා ගන්න පුළුවන්. ඒකත් තවත් ක්‍රම දෙකකට බෙදෙනවා. එනම්, හිසේ රෝග සහිතව දෙවුරෙන් උඩ පෙදෙසේ රෝගවලට කරන්නේ, අත් දෙකේ උරහිසේ සිට ඇඟිලි දක්වා තෙල් ගාලා අතේ මාපට ඇඟිලි තියෙන තැන තුඩු ළං කළාම ඇති නිලවලින් ලේ මිරිකා ඉවත් කිරීමයි. ඒක කරන්නෙ මෙහෙමයි. පළමුවෙන්ම මේ තෙල් ගාන්න බුලත් කොලයක් හෝ ගම්මිරිස් කොලයක් ගන්නවා. රක්ත සැර අධික නම් ඒ අයට ගන්නේ ඉදුනු ගස් බුලත් කොලයක්. සෙම ගතිය වැඩි අධික මහත අයට ගන්නේ ගම්මිරිස් කොලයක්. මොකද ගම්මිරිස් කොලය සැර වැඩියි. සෙම අධික ශරීරයට ඒක ඔරොත්තු දෙනවා. මේ නිසා ගස් බුලත් කොලයක් හෝ ගම්මිරිස් කොලයක් ගන්නේ තැනට ගැලපෙන විදිහටයි. එතකොට මේ බුලත් කොලය හෝ ගම්මිරිස් කොලය තෙල්වලින් පොඟවල, අතේ උරහිසේ සිට අත් කෙලවර දක්වා ගානවා. ඉන් පසු පොල්කටු අඟුරුවලින් කබලක් හදාගෙන රත්කරගෙන ඒක උඩින් අර තෙල් තවරපු බුලත් හෝ ගම්මිරිස් කොලය අල්ලල රත් කරගෙන ඒකෙන් විනාඩි පහක් විතර අත තවනවා. තෙල් ටික මදිනම් තව ටිකක් දාගන්න පුළුවන්.

මේ විදියට තවල විනාඩි පහක් පමණ ගියාට පස්සෙ තමයි නිල විදල මිරිකල ලේ ඉවත් කරන්නෙ. අත් දෙකේ මාපට ඇඟිලි දෙක සමාන්තරව ළං කළාම නියපොතු දෙක එකට එකතු වෙන තැනට ටිකක් පිටු පසින් ඇඟිලි දෙකම ගෑවෙන තැන තමයි මේ නිල පිහිටන්නෙ. ඒක හරියටම හොයාගන්නෙ මෙහෙමයි. ඇඟිලි දෙක ළං කළාම එකට ගෑවෙන දෙපොලට කනුමහ කියල කියනවා. ඒක තියෙන්නෙ ඇඟිලිවල නියපොත්ත දෙපැත්තෙ. මෙතනදී වම් මහපට ඇඟිල්ල ගත්තොත් ඒකෙ දකුණු පැත්තෙ කනුමහ තියෙන තැන තමයි මෙහිදී යොදා ගන්නෙ. එනම් නියපොත්ත මසට හාවෙන කෙලවර. ඊට පොඩ්ඩක් මෙහායින් ඇඟිල්ලෙ අල්ල වගේ සුදු කොටසක් තියෙනවා. ඒ සීමාවේ තමයි මේ නිලය පිහිටන්නෙ. ඒවගේම දකුණු අතේ මහපට ඇඟිල්ල ☞

ගත්තොත් ඒකෙ වම්පස කනුමහ තියෙන තැනට මෙහායින් තමයි ඒ නිලය පිහිටල තියෙන්නෙ. මේ කියන නිල දෙක පිහිටල තියෙන්නේ ඇඟිලි දෙක එකට ගත්තම එකට ගැවෙන තැනයි. මේ නිල දෙකෙන් තමයි විස ඉවත් කරන්නෙ. මේ තෙලට කියන්නෙත් විස අරින තෙල කියල. මේ කාරණා මට කවුරුවත් කියල දීපුව නෙවෙයි. සමාධියට පෙනිච්ච දේවල්.

පළමුවෙන්ම අර විදියට තෙලෙන් තවා ගත්තට පස්සෙ මේ නිල ස්ථාන දෙකෙන් තමයි ගැලපෙන කටුවකින් විදල ලේ ටික ඒ ස්ථානයට එන්න සලස්වල මිරිකල ඉවත් කරන්නෙ. ඒ විදියට නිලයට විදල මිරිකපු ගමන් කලු පාටට නරක් වෙච්ච ලේ බින්දු දෙක තුනක් මේ නිල ස්ථානවලින් එලියට යනවා. හුඟක් විදින්න දෙයක් නෑ. එක පාරක් විද්දම ඇති. එතකොට ශරීරයේ තිබිච්ච ඔක්කොම විස දියවෙලා අර නිල ස්ථානවලින් පිට වෙනවා. මේ වගේ අත් දෙකේම මහපට ඇඟිලිවලින් ඒ විදිහට විදල ලේ ඉවත් කරනවා. දිනපතා උදේ වරුවේ මේ විදිහට දින හතක් හෝ නවයක් නොකඩවා කරන්න ඕන. ඒකෙන් මුලු ශරීරයේම තියෙන රක්ත උෂ්ණය ඉවත් වෙනවා.

හැබැයි කකුලේ සුළු සුළු කුෂ්ඨ ආවොත් කරන්නේ මීට වඩා වෙනස් විදිහකට. එතකොට ඒ කුෂ්ඨ උඩින් තෙල් බිංදු කිහිපයක් එලුවම සියලු විස ඒකට ඇදල ගන්නවා. නමුත් කකුලටත් පොඩි පොඩි බිබිලි ඇවිත් රක්තවාතය කියල දැනගන්න ලැබුනොත්, පයේ මහපට ඇඟිල්ලේ ඇඟලි බිත්තරේ මුදුනට විදල ලේ ඉවත් කරන්න පුළුවන්. මෙතනදී නියපොත්ත අස්සට විදින්නෙ නැතිව එතනින් පහල ඇඟිලි බිත්තරේට තමයි විදින්නෙ. එතනිනුත් අතේ වගේම විදල ලේ ඉවත් කරනවා. හැබැයි ඊට පෙර අර තෙලෙන් කලින් වගේම දණහිස සිට පතුල දක්වා තවාගන්න ඕන. මේ විදිහට දින හතක් හෝ නවයක් උදේ වරුවේ මේක කරනවා.

මීට අමතරව ශරීරය ඇතුලේ බිබිලි වගේ ඇවිත් ඇඟ පතේ අමාරුකම් හටගන්න පුළුවන්. ඒ වගේම රක්ත වාතය ඉහට ගැහුවම සමහර අයට ඔල්මාද වෙනවා. ඒවගේ අයට තමයි විශේෂයෙන්ම අත් දෙකේ තෙල් ගාල, මහපට ඇඟිලිවල නිල මිරිකල ලේ පිට කරන්නෙ. මොකද ඒවගේ පිස්සු ඔල්මාද හැදෙන අයට පිටින් තුවාල නැති වුනාට මොලයට විස වැඩ කරනවා. එතකොට කල්පනා කරන්නත් අමාරු වෙනවා. මේ තෙලෙන් ඒකත් හොඳ වෙනවා.

දැන් අර මුලින් කියපු අවස්ථාවට ගියොත් ඒ කාන්තාවගේ අතේ තිබිච්ච තත්ත්වය අනුව, තුවාල තවල ලේ ඉවත් කරන කොට ඉස්ම වැක්කෙරෙන නිසා තෙල් ගාල නිකන් ඉන්න දුන්නෙ නෑ. දවස් හතක්, නවයක් යනකල් දිනපතා උදේට මේ විදිහට නිලවලින් ලේ ඉවත් කරන්නයි උපදෙස් දුන්නෙ. එහෙම කරගන්න කිව්වම ඇය ඇහුවා, මට මේක තනියෙන් කරගන්න බෑ, ගෝනගල්දෙණිය ග්‍රාමීය රෝහලේ මැලේරියාවට ලේ ගන්න දොස්තර මහත්තයෙක් ඉනන්වා, ඔහුට කියල ඉවත් කරගන්නද කියල. මමත්, කමක් නෑ ඒ ටික කරගෙන එන්න කියල කිව්වා. ඉතින් පලවෙනි දවසෙ අත වෙලාගෙන තමයි ගියේ. එතකොට ඒ රෝහලේ ප්‍රධාන වෛද්‍යවරයා දැකල ඒ ගැන අහල තිබුනා. මේ විදිහෙ වෙද මහත්තයෙකුගෙන් බෙහෙත් ගන්නව කියල ඒ කාන්තාව කාරණය කිව්වම, කුණු කරගෙන අත කපන්න ලෑස්තිවෙලා මිසක් මෙහෙ එන්න එපා කියල ඒ දොස්තර මහත්තය සැර කරල තිබුනා. ඒකෙන් මේ කාන්තාව තවත් බය වුනා. ඒ රෝහලේ ඉඳල හැතැප්මක විතර දුරක් අපේ ගෙදරට තිබුනා. ඒ කාන්තාව එතන ඉඳලම අතත් ඔතාගෙන පයින්ම අඬ අඬා ඇවිත්, දැන් අර දොස්තර මහත්තය මෙහෙම කියනවා මොකද කරන්නෙ කියල මගෙන් ඇහුවා. මේ වෙලාවෙදී මට සමාධියෙන්ම අදහසක් ආවා, ඒ වෛද්‍යවරයාට අභියෝග කරන්න කියල. ඒ අනුව මම ඇයට මෙහෙම කිව්වා. ඒ දොස්තර මහත්තයට මම කිව්ව කියල කියන් , අතේ ඉස්ම ගැලීම දවස් හතරකින් සම්පූර්ණයෙන්ම නවත්වනව කියල. ඒ කාන්තාවත් ඒක ගිහිල්ල කිව්වම, හා හොඳයි මෙහාටනෙ එන්නෙ මං බලා ගන්නම්කො කියල ටිකක් සැරෙන් කතා කළාලු.



මේ විදිහට හරියටම දින හතරක් අර ප්‍රතිකර්මය කරන කොට එක බිංදුවක්වත් නැතිවෙන්න අතින් ඉස්ම ගැලීම සම්පූර්ණයෙන්ම නතර වුනා. ඉතින් මටත් හරි සන්තෝසයි. මොකද මේ රෝගයට පළමුවෙන්ම සමාධියට ආපු ප්‍රතිකර්මය අත්දැකීමෙන්ම සාර්ථක වෙච්ච නිසා. ඊළඟට මට සමාධියෙන් තවත් අදහසක් ආවා, තවත් දින තුනක් හෙවත් සම්පූර්ණ දින හතක් යනකොට මේ තුවාලයේ තියෙන පොතු ඔක්කොම ගැලවිලා තුවාලය හොඳවෙන බවට. ඒ අනුව මම ඒ කාන්තාවට කිව්වා, දොස්තර මහත්තයට කියන්න තවත් දවස් තුනක් යනකොට මේ තුවාල කබොල්ල සම්පූර්ණයෙන්ම ගැලවිලා තුවාල කැලල විතරක් ඉතිරි වෙන විදිහට මේ අත සනීප කරල දෙන බව ඒ වෙද මහත්තය කිව්ව කියන්න කියල. ඒකත් ඒ කාන්තාව ගිහිල්ල කිව්වම දොස්තර මහත්තය ඇයව පරීක්ෂා කරල බලල, හා මෙහාටනෙ එන්නෙ, ඉතිරි ටිකත් බලමුකො කියල ටිකක් නිවිච්ච විදිහට කතා කළාලු.

මේ විදිහට දින හතක් යන කොට එක තුවාල පොත්තක්වත් නැතිව සම්පූර්ණයෙන්ම සුව වුනා. ඒ බවත් ඇය මට ඇවිත් කිව්වම, මම නැවතත් ඇයට මෙහෙම කිව්වා. "දොස්තර මහත්තයට කියන්න තවත් දවස් දාහතරක් යනකොට මේ අතේ තුවාලයක් තිබුනද කියල හොයාගන්නවත් බැරි වෙන්න කැලැල් මකල සම්පූර්ණයෙන්ම අතේ රෝමකූප වවල පෙන්වනව කියල. මේ විදිහෙ අභියෝගයක් ඒ වෙද මහත්තය කළා කියන්න." ඒ කාන්තාව ඒකත් ගිහිල්ල ඒ දොස්තර මහත්තයට කිව්වම, දැන් ඉතින් මෙච්චරකල් වෙදකම් කරල සනීප වෙච්ච හැටියට මේක හරියි කියල විශ්වාසයක් ඔහුට ඇති වුනා. දැන් ඉතින් ඔහු, කවුද ඒ වෙද මහත්තයා, කොහේ කෙනෙක්ද කියල මෙහෙම අහනවයි කියලත් මම දැනගෙන හිටියා. ඒ නිසා මම ඒ කාන්තාවට මෙහෙම කිව්වා. "ඇහුවොත් කියන්න ඒ වෙද මහත්තය දොස්තර මහත්තය හොඳට දන්න කෙනෙක්, පූගොඩ එන්.ටී.සී. (ජාතික පේෂකර්ම සංස්ථාව) එකේ වැඩ කරන අබේරත්න කියල කෙනෙක්. හැබැයි

වෙද මහත්තයෙක් නෙවෙයි කියන එකත් ඔහු දන්නවා. පස්සෙ කියයි මගේ හොඳ යාලුවෙක්නෙ කියල. හැබැයි ඒක කියන්න එපා, පූගොඩ වැඩකරන අබේරත්න කියල කෙනෙක් කියන්නකො. දොස්තර මහත්තය දන්නව කියල විතරක් කියන්න".

මම කියපු විදිහටම ඇය ගිහිල්ල කිව්වම, ''මගේ හොඳම යාලුවෙක්නෙ ඉතින් එයා මම අඳුනන්නෙ නැද්ද? එයා වෙද මහත්තයෙක් නෙවෙයිනෙ'' කියල ඒ දොස්තර මහත්තය කිව්වලු. ඒ වෙද මහත්තයට ගුප්ත ක්‍රමයකින් කියන ශක්තියක් තියෙනවා. ඒකෙන් තමයි මේ වගේ දේවල් කරන්නෙ කියල ඇය කිව්වම, දොස්තර මහත්තය මෙහෙම කිව්වලු. "අපේ තාත්තත් ආයුර්වේද වෙද මහත්තයෙක් තමයි. නමුත් මම ඔය වගේ තැන්වලට යන්න එපා කිව්වෙ මොකද, බොරු වංචා කරල අසනීප වැඩිකරන සමහර වෙද්දු ඉන්නව. ඒවුනාට එහෙම වෙදකමක් නැතිව නෙවෙයි. නමුත් ඉතින් හරියට කෙරෙන තැනක් නැති නිසයි මං එහෙම කිව්වෙ". අන්තිමට දොස්තර මහත්තය මේ විදිහෙ කථාවක් තමයි කියල තිබුනෙ. ඉතින් ඒ අයටත් හිතාගන්න බෑ ආයුර්වේද වෛද්‍යවරයෙක් නොවී මම එහෙම දෙයක් කළේ කොහොමද කියල. එච්චර බලගතු තෙලක් තමයි මේ විදිහට හැදුවෙ. ඊට පස්සෙ ඒ තෙලින් සෑහෙන වැඩ කොටසක් කළා. ඒක හරි විශේෂ දෙයක්. මෙහෙම යනකොට ඒ තෙල සම්බන්ධයෙන්ම මට තවත් අභියෝගයක් බාර ගන්න සිද්ධ වුණා. දැන් විස්තර කරන්න යන්නේ ඒ සිද්ධිය තමයි.

මේක 1990 ගණන්වලදී තමයි සිද්ධ වුනේ. ඒ කාලවකවානුවේදී මම වෙදකම් කළේ වේයන්ගොඩ දඩගමුව කියන ගම් ප්‍රදේශයේ. ඒ කාලයේ මම හිටපු විවිධ පලාත් අනුව, ඒ ප්‍රදේශවල පිරිස් මා විවිධ නම්වලින් ආමන්ත්‍රණය කළා. සමහර පලාත්වල වැඩ කරනකොට සාන්ති මහත්තය කියල කියන්න පටන් ගත්තා. සාන්ති කර්ම කරනවා කියන අදහසින් තමයි එහෙම කිව්වෙ. මේ වගේ දඩගමුව ප්‍රදේශයේදී මට කිව්වෙ පොඩි වෙද මහත්තය කියල. මොකද මම එහේ යනකොට ප්‍රසිද්ධ වෙච්ච තවත් ලොකු වෙද මහත්තයෙක් හිටියා. ආයුර්වේදය දන්න ඒ මහත්තයගෙන් රක්තවාතයට ප්‍රතිකර්ම ගන්න ගියපු ඒ කාලයේ දැරියකගේ කතාවක් තමයි මේකට මුල් වුනේ.

ඒ ළමයගෙ කකුලක විශාල කුෂ්ඨයක් මතු වෙලා ඉස්ම ගලමින් තිබුනා. ඉංග්‍රීසි වෙදකමින් බෙහෙත් විදල තමයි ඒක තාවකාලිකව යටපත් කරල තිබුනෙ. මේ රෝගය නිසා සෙම් ගෙඩි ඇවිත් ඇඟ මහත් වෙනවා. අර විදපු බේතකින් තමයි ඒක පාලනය කරමින් හිටියේ. මේ විදිහට ඒ වෙනකොටත් හය මාසයකට වරක් පමණ බේත් විදීම කරගෙන ඉන්න වුනා. මේ ළමය මං හම්බවෙන්න ආවම, මම අර තෙල නියම කළා. ඒ කාලයේ හිඳල තිබ්බ තෙල්වලින් අවුන්ස එකහමාරක් විතර ඇයට දුන්නා. මේක තෙලකින් සනීප කරන්න පුළුවන් කිව්වට පස්සෙ අර ලොකු වෙද මහත්තය ඒකට නිග්‍රහ කරල අභියෝග කළා. මෙහෙම ක්‍රමයක් ආයුර්වේදයේවත් නෑ, තෙලකින් ඕක සනීප කරන්න පුළුවන්නම් මම මගේ කන කපා ගන්නව කියල ඔහු අභියෝග කළා. ඔය වගේ දේවල් කරල නිකන් ලෙඩ වැඩි කරගන්න එපා, මෙන්න මේ බේත් ටික බොන්න කියල ඔහු ඒ ළමයට බෙහෙත් තුණ්ඩුවක් දීල තිබුනා. ඒක සති දෙකකට දීපු කසාය තුණ්ඩුවක්. මේ කාරණය ඒ ළමය තාත්තත් එක්ක ඇවිත් මට කිව්වා. පොඩි වෙද මහත්තයෝ ලොකු වෙද මහත්තය මෙහෙම එකක් කියනවනෙ කියල. මං ඇහුව කොච්චර කාලයකට බෙහෙත් දුන්නද කියල. සති දෙකකට දුන්න කිව්වා. ''එහෙනම් මට කිසිම ප්‍රශ්ණයක් නෑ, මට ඕන දවස් හතරයි. දවස් හතරකින් පස්සෙ මම එක්තරා ප්‍රතිඵලයක් පෙන්වනවා. හරි ගියේ නැත්තම් ඒ ලොකු වෙද මහත්තය දීපු බෙහෙත බොන්න. මම දීපු එක එහෙම්ම නවත්තල දාන්න. මොකද මෙච්චරකල් සුව නොවී තිබුනනම් ඔය ටිකට ඉවසන්න බැරි කමක් නැනේ.'' මම මෙහෙම කියල ඒ අයට කිව්වා. හැබැයි මේක ලොකු වෙද මහත්තයට කියන්න එපා කියලත් කිව්වා.

දිනපතා උදේටයි හවසටයි මේ තෙල් බිංදු කිහිපයක් දදය මතට දාන්නයි තියෙන්නෙ. ඊට පස්සෙ රෙදි කැබැල්ලක් අරගෙන උඩින් තෙල් ටික හොඳට තවරනවා. හැබැයි තුවාලයේ පොත්ත ගලවන්නෙ නෑ. මොකද ඒ තුවාලයේ පොත්තම තමයි මේකට ඖෂධය වෙන්නෙ. මේක ගාපු වෙලේ ඉඳල තුවාලයේ පොත්ත බලා ඉඳිද්දි වැඩෙනවා. ඒකට ඇඟ ඇතුලෙ තියෙන ඔක්කොම විස ඇදල අරන් පිට කරනවා. එහෙම පිට කරල මහ තුවාල පොත්තක් හැදෙනවා. හැබැයි බය වෙන්න එපා. ඒ තුවාල පොත්ත ගලවන්නත් එපා. මේ විදිහට නැවත හවසට ඒක උඩින් තෙල් බිංදු කිහිපයක් එලන්න. තව තවත් පොත්ත ලොකු වෙයි. ලොකු වෙලා දවස් හතරක් යන කොට තුවාලයත් හොඳ වෙලා පොත්ත ඉබේම හැලෙයි .එතකොට අසනීපය ඉවරයි. ඕක කරගෙන ගිහින් කියන්න. හැබැයි ලොකු වෙද මහත්තයට මේක තෙල් ගාල ඉවත් කළා කියන්න එපා. මොකද එයා එහෙම බෑ කියලනෙ කිව්වෙ.

ඊට පස්සෙ මම කිව්ව ඒ වෙද මහත්තයත් එක්ක මට ටිකක් දොස් කියන්න කියලත්. "වෙදකම් දැනගෙන නෙවෙයි ඇත්ත වශයෙන්ම අපි මේ ලොකු වෙද මහත්තය කිව්ව නිසා ඒකෙන් බේරුනා. ලොකු වෙද මහත්තය දීපු බෙහෙත් ටික ගත්තට පස්සෙ එන්න එන්න අසනීපය අඩුවෙලා ගියා. දැන්නම් මොකුත් රෝග ලක්ෂණ නෑ. තෙල් ගගා හිටියනම් මෙච්චර මේ ලොකු දේකට ළමයෙක්ගෙ කකුලක් ඉතිරි වේයැ". මෙහෙම මට දොස් කියල ඒ ලොකු වෙද මහත්තය දීපු බෙහෙතෙන්ම සනීප වෙච්ච බව අඟවන්න කියල මම ඒ අයට කිව්වා. අනේ අපි කොහොමද හිතට එකඟව එහෙම කරන්නෙ කියල ඒ අය කිව්වා. ඉතිං මම මෙහෙම කිව්වා. "හිතට එකඟව කියන්න වෙන්නෙ වෙන හේතුවක් උඩ, හේතුව මම පස්සෙ කියන්නම්, එතකල් මේ විදිහට කියන්න. මේ මං ගැනවත්, තෙල් ගැනවත් මොකුත් කියන්න එපා, නැවත දෙවෙනි සැරේ බෙහෙත් ගන්න එන්න පෙර ඒ ලොකු වෙද මහත්තය ලවා විස තියෙනවද කියල බලව ගන්න. දැන් ඔහුගේ දත්තයන්ට අනුව විස තියෙනවද නැද්ද කියල කියයි. මොකද ඔහු කියන්නේ මේ වගේ තුවාලයක විස තෙලකින් නසන්න බෑ, ඒකට බෙහෙත් දෙන්නම ඕන කියලනෙ. ඉතින් ඒක ඒත්තුවෙන විදිහට කථා කරල, වෙද මහත්තයෝ තවත් බෙහෙත් බොන්න වෙයිද, විස තියෙනවද කියල ඒ ලොකු වෙද මහත්තයගෙන්ම අහන්න. එයා පරීක්ෂා කරල , නලාව තියල, නාඩි අල්ලල රටේ නැති ඒව කරල කියන දේ කියන්නෙ නැතැයි. හැබැයි මං දීපු තෙල් බේත කරගෙන සද්ද නැතිව නිකන් ඉන්න. ඒ ගැන නම් කියන්න යන්න එපා. ලොකු වෙද මහත්තය හම්බවෙන්න යනකොට අඩුගානෙ තුවාලෙ තෙල් පොඩ්ඩක්වත් ගාගෙන යන්න එපා". ඒ අයට මම මේ විදිහට උපදෙස් දුන්නා. මොකද ප්‍රතිකර්මය නොකඩවා ගත්තොත් ඒ වෙන කොට තුවාලෙ වේලිලා කැළල විතරයි තියෙන්න ඕන. මෙහෙම දවස් හතක් යනකොට තුවාලෙ හොඳ වෙන්න ඕන.

දැන් අර කිව්ව විදිහටම තුවාලය හොඳ වුනා. හැබැයි තුවාලයේ පොත්ත සෑහෙන ලොකු වෙන්න පටන් ගත්තා. දැන් මේ ළමයගෙ තාත්තට බොහොම දුකයි. හරි අනුකම්පා සහගතයි. අනේ කෙල්ලගෙ කකුල කපන්න වෙයිද දන්නෙ නෑ, මොකක්ද මේ උඹල කරන්නෙ කියල තුවාලෙ පොත්ත දැකල ගෙදර අයත් එක්ක අඬනව දුක් වෙනවා. මොකද බලාගෙන ඉඳිද්දි පොත්ත ලොකු වෙන්න

28 වෙනි පිටුවට...

# වෛද්‍ය විද්‍යාවට හසු නොවූ අමනුස්ස හා කර්මජ රෝග

*(පසුගිය කලාපයෙන් - වෛද්‍ය විද්‍යාවට හසු නොවූ ලෙඩ රෝගයන්ගේ මූලය දහම් ඇසින්)*

මනුෂ්‍යයන්ට ඇතිවන ලෙඩ රෝගාබාධ සම්බන්ධයෙන් වෛද්‍ය විද්‍යාවට හසු නොවූ තවත් පැතිකඩවල් කීපයක් තමයි මේ පෙන්වා දෙන්න උත්සාහ කරන්නේ. හැබැයි ඉතින් මේවා පෙන්නල ඉවරයක් කරන්න පුළුවන් දේවල් නෙවෙයි. බුදු දහමේ පෙන්වාදෙන අට අනූවක් රෝග කියන්නේ කාණ්ඩ අනූ අටක් විතරයි. ඒ කාණ්ඩවලට අහුවෙන රෝගාබාධයන් විවිධාකාරයි. වර්ග කරන්න ගියොත් කෙලවරක් නෑ. ඒවාට සියළු හේතු හොයන එකත් ඒ වගේම දුෂ්කර වැඩක්. මේ නිසා සියල්ලම දැනගැනීම අවශ්‍ය වෙන්නෙ නෑ. ඒවාට හේතු වන මූලධර්මයන් පෙන්වා දුන්නට පස්සෙ ඥානවන්තව තේරුම් අරගෙන මේ කියන්නා වූ ලෙඩ රෝග ඇතිවන හැටිත්, ඒවා නැතිකරන්න අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගත් ධර්මානුකූලව තේරුම් ගත යුතුයි.

වර්තමාන වෛද්‍ය විද්‍යාවෙන් බොහෝ කොටම ප්‍රතික්ෂේප කරන කාරණයක් තමයි අමනුස්සයන් මගින් ලෙඩරෝග ඇතිකරනවා කියන කාරණය. මොකද ඒක වෛද්‍ය උපකරණවලටවත්, සාමාන්‍ය මස් ලේ සහිත ඉන්ද්‍රියන්වලටවත් ගෝචර නොවන තත්ත්වයක් නිසා. නමුත් දිවැස්, අභිඥා, සමාධි ආදී විශේෂ බල ලබාගත් අයට මේවා සාමාන්‍ය දේවල්. අපි මේ මනුස්ස ලෝකයේදී දකිනවා, අහනවා, වගේම ඒ බල ලැබූ අයටත් ගුප්ත ලෝකයේ දේවල් දැක බලාගන්න පුළුවන්. එහෙම දැක බලාගත් උතුමන්ගෙන් ලබාගත් කරුණුවලින් තමයි මේ කාරණා පහදන්නේ.



මෙතනදී අමනුස්සයන් මගින් ලෙඩ හැදෙනවා කිව්වමත් විවිධාකාර ක්‍රම තියෙනවා. අපි අමනුස්සයන් කියල කිව්වට ඒ අය පිටින් ආපු අමුතු කට්ටියක් නෙවෙයි. අපිත් එක්ක මනුස්ස වෙලා සිටියදී එකට කාලබීලා විවිධාකාර විදිහට අන්‍යොන්‍ය සහයෝගයෙන් කටයුතු කරලා ගනුදෙනු හදාගත්තු, නමුත් කරපු අකුසල් නිසා දුගති ස්ථානවල උපත් ලබා ඉන්න අපේම ඥාතිමිත්‍රාදී කොට්ඨාශයක්. අපි අද මනුස්සයෝ වශයෙන් ලොකුවට කතාකරගෙන හිටියත්, අපිත් ඒ වගේ වැඩ කළොත් ඊලඟ අත්බැවේ අපිටත් ඒ වගේම දෙයක් තමයි උරුම වෙන්නේ. දැන් මේ වගේ **අමනුස්සයෙක්, අමනුස්සයෙක් වෙන්න පෙර මනුස්ස වෙලා සිටිද්දී තිබ්බ්ච කර්මජ රෝගයක් සම්පූර්ණයෙන්ම නොගෙවී තිබුණොත්, ඒ රෝගය අමනුස්ස වුනාට පසුවත් තියෙනවා.** මොකද විශේෂයෙන්ම කර්ම ශක්තිය ප්‍රධාන කරගෙනම තමයි අමනුස්සයන්ටත් ඒ රෝග එන්නේ. එතකොට ගන්ධබ්බ කයකින් ඉන්න අමනුස්සයෙක් මනුස්සයෙකුගේ ශරීරයට ඇතුල් වුනොත්, අපේ මස් ලේ කය කියන ආකෘතියෙන් ඇතුලේ තියෙන ඇස්ට්‍රල්බොඩි කියල හඳුන්වන මනෝමය කයට ඒ අමනුස්සයා අරක් ගන්නවා. එතකොට ඒ අමනුස්ස **ගන්ධබ්බයාට යම් කිසි රෝගයක් තිබුණ නම්, අර මනුස්සයාගේ මස් ලේ කයටත් ඒ රෝගය ක්‍රමයෙන් පැතිරෙනවා.** හැබැයි නිකන්ම එනවා නෙවෙයි. කලින් සඳහන් කළා වගේම ඥාතිමිත්‍ර සම්බන්ධයකින්ම තමයි එන්නේ. මනුස්ස වෙලා අන්‍යොන්‍ය සහයෝගයෙන් ඉන්න කාලවලදී එකිනෙකා හුවමාරු කරගත්තු කන බොන හෝ අඳින පළඳින හෝ මොනවහරි දේකට අන්‍යොන්‍ය වශයෙන් හිමිකමක් ලැබෙනවා. ඒ නිසාම තමයි ඥාති මිත්‍රාදීන්ට මියගියාට පස්සෙ අපේ ඇසුරට එන්න පුළුවන්කම ලැබෙන්නේ. තරහකාරයෙක් වුනත් මැරිල අමනුස්සයෙක් වුනොත් නිකන්ම එන්නෙ නෑ. **මොනවා හරි ගනුදෙනුවක් පියවගන්න තමයි එන්නේ. මේවා ඔක්කෝම විපාකයන්.**

උදාහරණ විදිහට ගත්තොත් තාත්තා දරුවන්ට කන්න බොන්න අරන් දෙනවා. දරුවෝ ඒකෙන් ජීවත් වෙනවා. දැන් වයසට ගියාම දරුවන්ගෙන් යමක් ගන්න තාත්තට හිමිකමක් තියෙනවා. නමුත් සමහරවිට එහෙම නොකර නොසලකා ඉන්න පුළුවන්. එතකොට ඒකට වෛර බැඳගන්න සාධාරණ හේතුවක් ඒ අවස්ථාවේදී යෙදෙනවා. මොකද උපකාරයට කෘතෝපකාරය කියන එක කරන්න ඕන. ඒ වගේ වෙලාවක තාත්තා මැරිල අමනුස්සයෙක් වුනොත් ඒ අමනුස්ස ගන්ධබ්බයාට පුතාගේ ශරීරයට ඇතුල් වෙන්නත් පුළුවන්. නැවත පිටවෙන්නත් පුළුවන්. මේ වගේ **විවිධාකාර සංසාර ගනුදෙනු පියවගන්න අමනුස්සයින් ශරීරයට ඇතුල් වෙන්න පුළුවන්.**

අමනුස්සයා නිතරම ගන්ධය උරාගෙන තමයි ජීවත් වෙන්නේ. ඌට යම්කිසි ආකර්ෂණයක් ඇතිකරන්න පුළුවන් ශක්තියක් තියෙනවා. උදාහරණ විදිහට යම්කිසි අසූචි ගන්ධයක් තියේනම්, ඒක ලඟට ඇදගන්න අමනුස්සයාට පුළුවන් (මෙවැනි විශේෂ සිදුවීම් ඉදිරියේදී

අහයරතනාලංකාරය තුලින් බලාපොරොත්තු වන්න). මනුස්සයා ලඟ ඒ වගේ දුගඳක් නැතිවුනත් අමනුස්සයන්ට ශරීරයට ඇතුල්වෙන්න පුළුවන්. එහෙම ඇතුල්වෙලා ශරීරයේ ඇතුලෙමත් ඉන්නවා නෙවෙයි. අවශ්‍ය නම් අවශ්‍යතාවය ඉටුකරගෙන ක්ෂණිකවම පිටවෙන්නත් පුළුවන්. ඒ වගේම දිගටම පැලපදියම් වෙලා ඉන්නත් පුළුවන්. මේ අතර ශරීරයේ ඇතුලෙ ඉඳගෙන පිටතට කිරණ විහිදුවන්න පුළුවන් අමනුස්සයොත් ඉන්නවා. ඒ නිසා තමයි වැරදි ක්‍රම අනුගමනය කරලා සමහර භාවනා කරපු උදවිය, සමාධි ලැබුවා කියල අතින් කිරණ විහිදෙනවා, ලෙඩරෝග සනීප කරන්න පුළුවන් ආදී මේවගේ විවිධ දේවල් කියන්නේ. එතකොට බොහෝකොටම කිරණ විහිදුවන්නේ අමනුස්සයා. ඌ එහෙම කිරණ විහිදුවලා තමන්ට ප්‍රියමනාප දේ විශ්වයෙන් ඇදගන්නවා. බාහිර ලෝකයේ වැසිකිළියක තියෙන අසූචි පවා මේ වගේ කිරණ යවල ඇදගන්න පුළුවන්.

සමහර වෙලාවට අමනුස්සයෙක් ඇඟට ආවේස වුනාම ඒ පුද්ගලයා කොච්චර නෑවත්, කොච්චර පිරිසිදුවට හිටියත් ගඳ ගහනවා. ඒක ඒ පුද්ගලයා දන්නෙත් නෑ. ඉබේම ගඳයි. අමනුස්සයා මනුස්ස ශරීරයේම ඉඳගෙන පෝෂණය වෙනවා, මළ මුත්‍ර පිටකරනවා. පෝෂණය උරාගන්නේ ගන්ධය වශයෙන්. උගේ ගඳ තමයි අර විදිහට පිටවෙන්නේ. චිත්තජ රූප එකතු කරලා උතුජ රූප වශයෙන් බැඳගන්න චිත්ත ආකර්ෂණයක් තියෙනවා. ඒ ආකර්ෂණය මගින් අර ගන්ධය අංශු බවට පත්කරලා ඇදල අරගෙන තියා ගන්නවා. ඒකෙන් උන් බඩ පුරවගන්නවා. **මනුස්ස ශරීරයෙන් දාහෙන් එකක් (1/1000) තමයි අමනුස්ස ගන්ධබ්බයකුගේ ශරීර ඝණත්වය හැටියට තියෙන්නේ.** හැබැයි මේ කාරණය පොත්පත්වල නෑ, සමාධියට ගෝචර වන දෙයක්. මේ නිසා අමනුස්ස ගන්ධබ්බයා භෞතික ආහාරයක් දහස් වාරයක් කෑවොත් මිනිස් ඝණ ද්‍රව්‍යයන්ගෙන් එක් වාරයක් අඩුවෙනවා. උදාහරණ විදිහට අමනුස්ස ගන්ධබ්බයෙක් අසූචි පිඩක් දහස් වරක් කෑවොත් භෞතික ලෝකයේ තියෙන අසූචි පිඩ ඉවරවෙනවා.

අමනුස්ස ගන්ධබ්බයෙක් මේ වගේ අසූචි කාලා මනුස්ස ශරීරයකට ඇතුල් වුනොත්, අර අසූචි ටිකයි ඒවායේ තියෙන විෂබීජයි ඔක්කොම මනුස්ස ශරීරගත වෙනවා. එතකොට ඒකම රෝගකාරකයක් වෙන්න පුළුවන්. ඉතින් විෂබීජ එන්නේ කොහොමද කියල ඇහුවම ඒකට විද්‍යාවෙන් උත්තරයක් දෙනවා. වාතයෙන් එනවා, කැස්සට විසිවන කැබලි මගින් එනවා, කැලිකසල මගින් එනවා... මේ ආදී වශයෙන් විවිධ කරුණු ඉදිරිපත් කරනවා. ක්‍රමය හරි බොරු නෙවෙයි. මොකද මිනිස්සුන්ට පේන්නෙ නැති නිසා හිතන්නේ වාතයෙන් ගහගෙන ආව කියල. නමුත් වාතයෙන් හරි මොකෙන් හරි ඒක ගෙනාවේ කවුද? අමනුස්සයින් තමයි ඒවා ඇදගෙන එන්නේ. ඒත් ඒ කාරණය මස් ලේ ඇහැට පේන්නෙ නෑ. සුළඟ එක්ක යන දෙයක් තමයි අපට දැනෙන්නේ. මේ නිසා ගෙවල්වල දුර්ගන්ධය තියෙන තැන් වහන්න, හිරු එළිය වැටෙන්න තියන්න, අඳුරුමුලු තියන්න එපා, තෙතමනය රැඳෙන්න තියෙන්න එපා, හුළං ටිකක් වදින්න ජනෙල් දොරවල් ඇරල තියන්න, මේ ආදී වශයෙන් කියනවා. කාරණය හරි. මොකද අමනුස්සයින්ට හිරු එළිය සැරයි. හැම වෙලේම යන්නේ අඳුරු මුලු හොයාගෙන. තැනක හිටියත් මුළු ගැන්විලා තියෙන අඳුරු කුණු සහිත, තෙතමනය සහිත තැන්වලට තමයි උන් වැඩිපුර ප්‍රිය කරන්නේ. මේ නිසා තමයි විද්‍යාවෙන් කියන්නේ එහෙම ස්ථාන තියෙන්න දෙන්න එපා කියල. ඒ වගේ තැන් වේලෙන්න තිච්චම ඒ විෂබීජ විනාශ වෙනවා කියනවා. භෞතික ලෝකයේ කතාව නම් හරි. නමුත් ගුප්ත පැත්ත පේන්නෙ නෑ. ඒ වුනත් අධ්‍යාත්මික යම්කිසි ගුප්ත බලයකට මේ කොටස් පේනවා.

**සමහර වෙලාවට මේ අමනුස්සයින් විටින් විට කාල බීලා හදිස්සියේම ඇඟට පනින අවස්ථා, ඒ වගේම ඇඟ ඇතුලේ තියෙන දේවල් කාල බීලා එලියට පනින අවස්ථා තියෙනවා.** ඒ වගේම සමහර මිනිස්සුන්ගේ ශරීරවලට ආහාර ජීරණය වෙන්නත් පෙර අමනුස්සයින් ඒක උරාගන්නවා. සමහරවිට මනුස්සයාගේ ශරීරයේ තියෙන දේවලුත් අරගෙන යන එවුන් ඉන්නවා. මනුස්සයාගේ ශරීරයේ කුණක් තිබුනොත් උන් ඒකත් ඇදගෙන යනවා. මේ නිසා සමහර වෙලාවට ඒකම උපක්‍රමයක් විදිහට පාවිච්චි කරල ඒ අමනුස්ස බලවේගය ඉවත් කරන අවස්ථා පැරණි ක්‍රමවල තියෙනවා.

උදාහරණ විදිහට ශරීරයේ කොතැනක හරි ඉන්නෙක් හෝ ගෙඩියක් තියේ නම් ඒ ඉන්නගේ හෝ ගෙඩියේ ගල්කැටයක් අතුල්ලලා ඒක පඬුරකුත් එක්ක හිස් ගිනිපෙට්ටියකට දාලා වහල කතා නොකර තුන්මන් හන්දියක කාටවත් නොපෙනෙන තැනක තියල යනවා. ඒක කාටවත් ගන්න එපා කියල කියන්නේ ගත්ත මනුස්සයටත් ඒක හැදෙන්න පුළුවන් නිසා. එතකොට ඒක ඒ විදිහට දැම්මම අර මනුස්සයාගේ ශරීරයේ ඒ රෝගාබාධයේ ඉඳලා ගිනිපෙට්ටියට කිරණ රැනක් හැදෙනවා. ඊට පස්සෙ උන් එතන ඉඳන් රැනෙන් කඹ අදින්න වගේ රංචුවක් එක්කලා අර ඉන්නගෙන් හෝ ගෙඩියෙන් කුණ ඇදල ගන්නවා. මේ විදිහට තමයි උන්ගෙ ආහාරය සපය ගන්නේ.

මෙතැනදී සිද්ධ වෙන්නෙ මේකයි. ඒ ඉන්නගේ හෝ ගෙඩියේ පිටින් ගල් කැටයක් ඇතිල්ලුවම එහි අංශුමාත්‍රා අර ගලටත් ඇදල ගන්නවා. ඊට පස්සෙ ඒක කොච්චර ඈතට ගෙනිහින් දැම්මත් එක්තරා නොපෙනෙන රැනකින් සම්බන්ධයි. එතකොට උන්ගෙ ආහාරය හදල දුන්න වෙනවා. අර විදිහට පඬුරක් දාල දෙන්නේ ඒක උන්ට හිමිකරල දෙන්නයි. එහෙම හිමිකරල දුන්නම උන්ගෙ ලෝකයෙන් පිරිසක් අරගෙන එතනට එකතු වෙනවා. එකතුවෙලා රැනෙන් අදිනවා. ඒ රැන දිගේ ඇදල ගන්නේ අර ශරීරයේ තියෙන ඉන්නගේ හෝ ගෙඩියේ කුණ තමයි. ඒකෙ තියෙන කුණු ඔක්කොම අදිනවා. දවස් දෙක තුනක් යනකොට ඉන්නට හෝ ගෙඩියට වෙච්ච දෙයක් නෑ. ඒක හොඳ වෙලා. මෙතනදි තුන්මන් හන්දියකට ගෙනවිත් දමන්නේ අමනුස්සයෝ ඒ වගේ තැන්වල වැඩිපුරු ගැවසෙන නිසයි. මේක පැරණි ගුප්ත ක්‍රමයක්.

මේනිසා සමහර වෙලාවට සමහර මිනිස්සු කුණු ජරාව පවා කනවා. නමුත් එහෙම කෑව කියල ඒ අය ලෙඩ වෙන්නෙ නෑ. අදත් ඕන තරම් කසල ගොඩවල් ඇදගෙන කන මිනිස්සු ඉන්නවා. නමුත් උණක් හෙම්බිරිස්සාවක් වත් නෑ. මේ එක ක්‍රමයක්. මොකද අමනුස්සයා බලවත් නම් ඌ මනුස්ස ශරීරයේ ඉඳගෙනම ඒවා කාල බීලා යන්න යනවා. මෙතනදී මනුස්ස කය ඒ අමනුස්සයාට ආහාර ගන්න, අතර මැදි ආධාරකයක් විදිහට පාවිච්චි කරනවා. මනුස්සයා ලවා ඕන කුණක් කනවා. හැබැයි කෑවට මනුස්සයාගේ ඇඟේ ඒවා නෑ. මොකද ඒවා ඔක්කොම අමනුස්සයා පාවිච්චි කරනවා. මේ වගේ සමහර අයට කොච්චර ජරාව කෑවත් දිරවනවා. නමුත් එහෙම නොවන අවස්ථාවලදී ඒකෙන්ම ශරීරය ලෙඩ කරනවා. ඒ වගේම සමහර ප්‍රේත ගති ඇඟට ආවේශ වෙලා එනවා.

එක්තරා හිඟන්නෙක් මිනී වලවල් තියෙන තැන්වල මිනී වලලන්න වලවල් හාරන කොට ගොඩදාන පැරණි ඇටකටුවලට බොහොම කැමැත්තෙන් හිටියලු. ඒ හිඟන්නා ඒ වගේ මිනී වලවල් හාරන තැන් හොයාගෙන ගිහින් ඒ ඇටකටු අරගෙන තම්බලා ඒවා උරලා ඒ වතුරත් බොනවලු, තලු ගගහා ලෙවකනවලු. හැබැයි මේ මනුස්සයාට පිටින් පේන්න කිසිම ලෙඩක් තිබිලත් නෑ. නමුත් සාමාන්‍ය මනුස්සයෙක් මේ වගේ දෙයක් ගත්තොත් මොනතරම් නම් ලෙඩරෝග හැදෙන්න ඕනද? එතකොට මේක කොහොමද වෙන්නේ? ඒක අර අමනුස්සයා තමයි ඇදල ගන්නේ. ඒ මනුස්සයා ඒක ආහාරයට ගත්තත් ඇඟට ජීරණය වෙන්න පෙර ඒක අමනුස්සයා කාල අහකට පනිනවා.

දැන් මේ වගේ ශරීරයේ ඉන්න අමනුස්සයින් ගැන කතා කරන කොට මිනිස්සුන්ට හැදෙන ලේ පිළිකාව හෙවත් ලියුකේමියාව ඒත් එක්කම එන ප්‍රධාන

රෝගයක් වෙනවා. බොහෝකොටම මෙතැනදී අමනුස්සයෙක් තමයි මුල්වෙන්නේ. ඌ යටි බඩේ හෝ ලේ නහර පොදියක් අල්ලගෙන බදාගෙන කුඩැල්ලා ලේ උරා බොනව වගේ ලේ අදිනවා. ලේ ඇදල උරාබොන නිසා තමයි රතු රුධිරානු කියන කොටස අඩුවෙන්නේ. ඒක තමයි උගේ ආහාරය. මේ නිසා දහස් වාරයක් බොනකොට මනුස්සයාගේ එක් ලේ උගුරක් ඉවරයි. මේක හැදෙන හැටිත් දැන ගැනීම වැදගත්. සමහර වෙලාවට **ඉනා බෙහෙත්, බඩට දෙන විනබන්ධන, පන්නන්න, ගෙන්වන්න, ස්ත්‍රී පුරුෂයන් වශී කරන්න ආදි මේ වගේ ගුප්ත වැඩවලින් මිනිස්සු නොදන්නා බරපතල අපරාධයක් සිද්ධ වෙනවා.**

මේ වගේ අවස්ථාවලදී **යන්ත්‍ර මතුරලා ඒවට අමනුස්සයෝ හිරකරලා, ගැටගහලා අර ඉනාව කවනවා. ඒක කැවුනට පස්සෙ ඒ ආහාරය මනුස්සයින්ගේ යටි බඩ කේන්ද්‍ර කරගත් මූලාධාර චක්‍රවල හා ලිංගාශ්‍රිත ප්‍රදේශවල ගිහින් තැන්පත් වෙනවා.** ඉතින් අමනුස්සයොත් බලාගෙන ඉන්නෙ උන්ට කන්න බොන්න හම්බවෙන ක්‍රමවේදයක් හැදෙන්නෙ කොතනද කියල. මේ නිසා යන්ත්‍ර මතුරල දුන්නම උන්ට හිමිකම් ලැබෙනවා. ඉතින් **ඒ අමනුස්සයෝ ඒ හිමිකම අරගෙන ඒකෙන් ගිහින් මනුස්ස ශරීරයේ කොතනක හෝ නිලයක් අල්ල ගන්නවා.** එක්කෝ හදවත, පෙනහැල්ල, ගර්භාෂය, ලිංගාශ්‍රිත ප්‍රදේශවල එහෙමත් නැත්නම් බඩවැලේ හෝ බෙල්ල දිහාවේ. මේ වගේ කොහේ හරි තැනක් අල්ලනවා. බොටුව කඩාගෙන ලේ බීපිය කියල ඔය යන්ත්‍ර මන්ත්‍ර කරනකොට කියන්නෙත් ඕකම තමයි. ඉතින් අමනුස්සය ගිහින් ඒ කිව්ව තැන් අල්ල ගන්නවා. කොතැන හරි තැනක් අල්ලගත්තම ඒක හොයන්න බෑ. එහෙම අල්ලගෙන එතන දත ගහගන්නවා. දත ගලවන්නෙ නෑ. උර උරා ඉන්නවා. මදුරුවා පිම්බෙන කල් බඩපුරව ගන්නව වගේ කොච්චර හරි උරනවා. මස්ලේවල ඝනීභවනයෙන් දාහෙන් එකයි (1/1000) එක වතාවකට ඌ අදින්නේ. ඒක ඇහැට පේන්නෙ නෑ. නමුත් ලේ අඩුවෙනවා. මේ වගේ දහස් වාරයක් අදින්න ඌට වැඩි වෙලාවක් යන්නෙ නෑ. මේ නිසා බලා ඉඳෙද්දී ශරීරයේ ලේ අඩු වෙනවා. පැයක් යනකොට ඌ දහස් වාරයක් විතර ඇදගෙන බීලා. ඉතින් පැයකට ලේ උගුරක් විතර අඩුවෙනවා කියන්නෙ මනුස්සයෙක් ඉතිරි වෙයිද? දැන් ඉතින් පිටින් ලේ දුන්නට වැඩක් නෑ. නමුත් මේ රුධිරානුවලට මොකද වෙන්නෙ කියල වෛද්‍ය විද්‍යාවටවත් හොයාගන්න බැරිවෙලා තියෙනවා. අඩුවෙනව කියන එක විතරයි පේන්නෙ. හේතුව හොයාගන්න බෑ. මේ නිසා අඩුවෙනවා කියන එක මිසක් මොකද වෙන්නෙ කියල හේතුව කියන්න දන්නෙ නෑ. ලේ වතුර වෙනව කියල කියනවා මිසක් මූලධර්මය දන්නෙ නෑ. විවිධාකාර මත ඉදිරිපත් කළත් ඇත්ත වශයෙන්ම ඒවා නෙවෙයි සිද්ධ වෙන්නේ.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් ඇතිවෙන්න පුළුවන්, ඔය කියන යන්ත්‍ර මන්ත්‍රවලින් ඔහොම දෙයක් වෙනව නම්, බටහිර රටවල් ඇතුලු ලෝකය පුරාම ඕක වෙන්නෙ කොහොමද කියල. මොකද බටහිර රටවල්වල ඔය ගුප්ත ක්‍රම අඩුයි. ඒ වුනත් ඒක වෙන්නෙ මෙහෙමයි. මේ පෙන්නුවේ ලේ පිලිකාවට මුල්වෙන එක් කාරණයක් විතරයි. යන්ත්‍ර මන්ත්‍ර සම්බන්ධයක් නැතිවත් අමනුස්සයෝ ඕන තරම් සම්බන්ධ වෙනවා. බටහිර රටවල අමනුස්ස කතා පිළිගත්තත් නැතත් ඒ රටවලත් ඔය අමනුස්ස ගන්ධබ්බයෝ මේ වගේම ඕන තරම් ඉන්නවා. මොකද අපි මේ විදිහට විවිධාකාරයෙන් අර ජාතියේ මේ ජාතියේ රටවල් කියල කොටු කරගත්තට, අමනුස්ස ලෝකයේ එවුන්ට එහෙම බේදයක් නෑ. උන්ගෙ ලෝකය වෙනම ලෝකයක්. උන්ට ආහාර ලැබෙනව නම් කොහේ වුනත් කමක් නෑ. ඉතින් ඒ ඉන්න අමනුස්ස ගන්ධබ්බයින් ඒ අයගේ ශරීරයට ඇතුල් වුනත් ඒ අය ඒක පිලිගන්නෙ නැතිව මිසක් එයින් එහාට දෙයක් එතැන නෑ. එහෙම ලෙඩක් කරදරයක් හැදුනත් වෙනත් භෞතික ක්‍රමයකින් හැදුන කියනවා මිසක්, අමනුස්සයන් ලෙඩ රෝග ඇතිකරනවා කියන කාරණය පිලිගන්නෙ නෑ. ඒ වගේම ද්වේශ සහගත අවස්ථා, මස් මාංශ පුළුටු කර බැද ආහාරයට ගැනීම ආදියත් මේ අමනුස්ස බලපෑම්වලට හේතු වෙනවා. ද්වේශය අමනුස්සයාට ආහාරයක්.

**කොහොම හැදුනත් කර්ම විපාකයක් මුල්වෙලාම තමයි මේ වගේ රෝගයක් හැදෙන්නේ.** ඒක පද නිරුක්තියෙනුත් පැහැදිලි කරන්න පුළුවන්. ලය කියන එක තමයි ලේ කියන්නේ. ඒ කියන්නේ හිතවත් බව, යහපත් බව. මේ කියන ගුණ යහපත් ධර්ම විනාශ කිරීම තමයි විපාකය. ඒකත් පිළිකාවේම කොටසක්. තවත් විදිහකින් කියනව නම් ලයෙහි වූ කාම සහගත බව හෙවත් කාමයන්ගේ අජීර්ණයත් තමයි මේකට මුල් වෙන්නේ. ඒ වගේම මේ වගේ අවස්ථාවකදී කාම අදහස් තදබල ලෙස ක්‍රියාත්මක කළොත් අර කියපු ගතිය වැඩෙන්න පටන් ගන්නවා. ඒකෙන් අමනුස්සයා ඉක්මනට එතැනට රිංග ගෙන බලවත් වෙනවා. දැන් මනමාලයා වෙන්නෙ අමනුස්සයා තමයි. ස්ත්‍රීන් පුරුෂයන් කෙරෙහිත් පුරුෂයන් ස්ත්‍රීන් කෙරෙහිත් තදබල ලෙස බලාපොරොත්තු තියාගන්නවා. එතකොට ලේ උරන්න ගිය අමනුස්සයාට උගේ ගතියට තවත් ගතියක් අහුවෙනවා. ඌ ඒ ආස්වාදයත් බලාපොරොත්තු වෙනවා. ඊට පස්සෙ අජීර්ණ වෙලා ශරීරයේ ඇතිවන ප්‍රතික්‍රියා සම්පූර්ණයෙන්ම විකෘති වෙනවා. ඒ නිසා ඇඟ උණු කරන විවිධාකාර රෝගාබාධවලට බොහෝකොටම හේතු යෙදෙනවා.

ගැහැණු ළමයෙක් වැඩිවියට පත්වෙනකොට පිටවෙන පළමු ලෙය මේ අමනුස්සයන්ගේ ජනප්‍රියම ආහාරයක්. මේනිසාම තමයි එදා ඉඳල මේ ගැන දන්න කියන අය ළමයි ආරක්ෂා කරන්න කිව්වේ. ගුප්ත පැති ගැන දන්න අය ළමයි කොටහලු වුනා කියන කාලයේදි තනිවෙන්න දෙන්නෙ නැතිව, එළියට පහලියට ගියත් ගිරයක් වගේ දෙයක් දීල මිසක් යවන්නෙ නැතිව ළමයි ආරක්ෂා කරනවා. මේක අපේ චාරිත්‍රයක්. නමුත් බටහිර රටවල ඔය මොනම චාරිත්‍රයක්වත් නෑ. වැඩිහිටි වුනා කියල කිසිම ගාණක්වත් නෑ. ඒවා ගණන් ගන්නෙ නෑ. නමුත් ගණන් ගත්තෙ නැතිවට අමනුස්සයන්ට ඒක ප්‍රියයි. ඒවගේ වෙලාවට ඌ ශරීරයට රිංගල අල්ල ගන්නවා. ගර්භාෂයේ හරි ලිංගාශ්‍රිත ප්‍රදේශයක හරි අල්ලගෙන දත ගහගෙන ලේ උරනවා. ඌට ඒක රහ වැටුනට පස්සෙ යන්නෙ නෑ. හැබැයි එහෙම දෙයක් අපිට පේන්නෙ නෑ. නමුත් ඒ ළමයට බඩේ කැක්කුම් එනවා, කලන්තෙ කැරකිලි වැඩියි. ඕකට වෛද්‍යවරු මොනවා හරි බේතක් දීලා නිකන් ඉන්නවා. ඒව විශ්වාස කරන්නෙ නෑ. නමුත් කාලයක් යනකොට අර අමනුස්සයා කාල බීල යන්නෙ නැතිව එතන පැලපදියම් වෙනවා. ඊට පස්සෙ ඒකට ගිහින් තව තවත් එවුන් එල්ලෙනවා. අන්තිමට කාලයක් යද්දී ඕක පිළිකාවක් බවට පත්වෙනවා. **සමහර පිළිකා පේන්නෙ නෑ. නමුත් අමනුස්සයින් ලේ උරා බොනවා.** ඒ වගේම සමහර රටවල ආගමික වශයෙන් අදහන ගුප්ත බලවේග ප්‍රබලයි. එතකොට ඒවාට සම්බන්ධ ඒ පිරිස් බොහෝ විට එබඳු රටවල අයට ආරක්ෂාව සලසනවා. මාර පාක්ෂික ආගම් නිසා ඒ අයට පක්ෂ වෙනවා.

බොහෝකොට ලංකාවේ ළමයි වැඩිවියට පත්වුනාම තනිකරනවා කියල නවීන විද්‍යාවේ සමහර අය හිනාවෙනවා. හරියට කාරණා දන්නෙ නැති අය හිනා වුනත් මේක බොරුවක් නෙවෙයි. පෙර හිටපු ඍෂිවරු මෙන්න මෙහෙම ළමයි ආරක්ෂා කරගන්න කියල නොපෙනෙන පැති පෙන්වා දීල තියෙනවා. ඒකෙ මූලධර්මය හරියට දැනගෙන හිටපු අයට ප්‍රශ්නයක් වුනේ නෑ. නමුත් පසුව මේවා ගණන් ගත්තෙ නැති උදවියට තමයි ගැටලු ඇති වුනේ. කොයි රටේ ගත්තත් ඊට පස්සෙ මේ වගේ රෝගී තත්ත්වයන්ට වෛද්‍ය ප්‍රතිකාර කියල මොනවාහරි ගන්නවා. එක්කො කපල කොටල දානවා. නමුත් රෝගයට මූල හේතුව හඳුනගෙන නෑ.

ලේ මාපිලා ගැන අපේ ආදියේ පටන් එන කතාවක් තියෙනවා. ඌ ලේ උරාගත්තට පස්සෙ උගේ ඇඟේ තවත් ලේ මාපිලෙක් එල්ලිලා දත ගහගන්නවා. ඊට පස්සෙ ඒකගේ ලේ බොනවා. මේ විදිහට තවත් එකෙක් ඇවිත් උගේ ඇඟෙත් එල්ලිලා කොච්චර හරි ලේ

උරනවා. මේ වගේ පළමු එකා ලේ උරලා මහත්වෙනකොට, තවත් එකෙක් ඇවිත් උගේ ලේ උරනවා. මේ විදිහට පෝලිමට තවත් එවුන් එනවා. අන්තිමට මනුස්සයාට නින්ද ගිහින් මැරෙනවා. අර විදිහට ලේ මාපිල්ලු ඇවිත් ලේ උරල යන්න යනවා. අවසානයේ ඇගේ ලේ නැතිවෙලා මැරිල යනවා. මේ වගේ අමනුස්සයෝ පොදියක් එකෙක්ගේ ඇඟේ එල්ලිලා ලේ බොනවා. මොකද අපිට වගේ උන්ට ඉඩ ඕන නෑ. අපිට නම් ඔළුගෙඩි දෙකක් වත් ළංකරන්න බෑ. නමුත් උන්ට ඔළුගෙඩි සීයක් වුනත් එකට ළංකරන්න පුළුවන්, එකිනෙකාට බාධක වෙන්නෙ නෑ. මේ නිසා ඕනෑම තැනක එල්ලෙන්න පහසුයි.

එක්තරා ස්ත්‍රියකගේ බෙල්ල ළඟ ගුලියක් තිබුනා. බලන කොට අමනුස්සයෝ දෙන්නෙක් එල්ලිලා. සම්බන්ධය බලද්දී පෙර අත්බැවක එක්තරා ආකාරයක හොරට හිටපු මිනිස්සු දෙන්නෙක්. ඒ දෙන්නා එදා මැරිල අමනුස්ස ගන්ධබ්බයෝ දෙන්නෙක් වෙලා අර ස්ත්‍රියගේ ශරීරයේ එල්ලුනා. ඊට පස්සෙ ස්ත්‍රියගේ ඒ අත්බැව මළා. මළාට පස්සෙ ඒ ස්ත්‍රී ගන්ධබ්බ කයේ අර කිව්ව අමනුස්ස ගන්ධබ්බයින් දෙන්න එල්ලිච්ච ගමන් එහෙමමයි. එතැනින් ඒ ස්ත්‍රී ගන්ධබ්බයා වෙනත් ගැබක මනුස්සයෙක් වෙලා ඉපදුනා. බලන කොට බෙල්ලේ උපන් ලප වගේ පුල්ලියක්. කල් යනකොට මේක ලොකු වුනා. අන්තිමට වෛද්‍යවරු පිළිකාවක් කියල නිගමනය කළා. නමුත් ගුප්ත ක්‍රමයෙන් බලන කොට අර අමනුස්ස ගන්ධබ්බයො දෙන්නා කුඩැල්ලො වගේ මේ ස්ත්‍රියගේ බෙල්ලෙ එල්ලිලා. ඊට පස්සෙ යම් ගුප්ත ක්‍රමයකින් ඒ දෙන්නම පැත්තකට ගලවල දැම්මා. එයින් අසනීපය සනීප වුනා. **මේ වගේ වෙලාවට වෛද්‍ය විද්‍යාවේ බෙහෙත් නෑ. ඉතින් කපල කොටල දාන එක තමයි කරන්නේ. නමුත් කැපුවා කෙටුවා කියල උන් අයින් කරන්න** බෑ. මේ භෞතික ලෝකයේ පේන්න තියෙන දෙයක් කපල ඉවත් කළාට ඒක හරියන්නෙ නෑ.

**කොයි ලෙඩේට වුනත් ඔය අමනුස්ස බලපෑම්, කර්ම ශක්තියේ බලපෑම් මේ ඔක්කොම එනවා. එකක් කියල නෑ. අමනුස්සයාගේ ශක්තිය කර්ම ශක්තියත් එක්ක සම්බන්ධ වෙලා ලෙඩ රෝග හැදෙන්න හේතු තියෙනවා.** එහෙම නැත්නම් කර්මජ රූපයන්ගෙන් විවිධාකාර දේවල් හැදෙනවා. අමනුස්ස කියන්නේ එක කොටසක් විතරයි. කර්මජ රූපයන්ගෙන් හැදෙන ඒවා අපේ මනෝමය කයේ පරිවර්තනයන් කරනවා. හෝමියෝපති වෙදකමේදී වෙදකම් කරන්නේ ඇස්ට්‍රල්බොඩි කියල හඳුන්වන මනෝමය කයට. ඒක තමයි කර්මජ කය. මේ කර්මජ කයේ කර්ම ශක්තියෙන් හටගන්නා විවිධ විපාක තියෙනවා. උදාහරණ විදිහට අම්මට තාත්තට පයින් ගැහුවොත් ඒ කරපු කර්ම විපාකය ඇවිත් මනෝමය කයේ විපාක වශයෙන් තුවාලයක් හැදෙනවා. හැබැයි ඒක මස් ලේ කයේ පිටින් බැලුවම පේන්නෙ නෑ. මස්ලේ කයට විපාක දෙන්න සුදුසු කාලයක් එන්න ඕන. මේ වගේ අවස්ථාවකදී තාත්තා වයසට යනකොට පුතා ලොකු වෙලා බීල ඇවිත් අසභ්‍ය විදියට හැසිරිලා බැනල තාත්තට ගැහුවයි කියල හිතමු. දැන් තාත්තට වෙන කරන්න දෙයක් නෑ. වයසයි. ඔහොම සැහෙන කාලයක් යනකොට අත්බැව් ගණනක් ගිහිල්ල හරි ඒ පුතත් ඒ වගේ කාලයක මනුස්ස අත් බැවක් ගත කරන කොට, අවුරුදු හැටක් හැත්තෑවක් වෙද්දී පෙර අත්බවයක ඒ වගේ කාලයක තාත්තට කරපු කර්ම විපාකය පුතාටත් පල දෙන්න කාලයක් එනවා. ඒ කාලයට කර්ම ශක්තිය මුල් වෙලා මනෝමය කයේ තුවාල වෙච්ච තැන මනෝමය කායිකත්වයෙන්ම ගෙඩියක් හදනවා. ඒ කර්මජ රෝගය ඉස්සෙල්ලම මනෝමය කයට එනවා. ඊට පස්සෙ ඒ මනෝමය කයට අනුකූල වන්නා වූ භෞතික කය (මස්ලේ කය සහිත සනීභවන කය) ඊට අනුකූලව හැඩගන්නවා. ඒක හැදුනට පස්සෙ පිටතට පිළිකාවක් හෝ වෙනත් දරුණු රෝගයක් විදිහට හෝ විද්‍යමාන වෙනවා. දැන් ඉතින් ඒක කපල අයින් කළාට හරියන්නෙ නෑ. මොකද **භෞතික කය කැපුවට මනෝමය වශයෙන් කර්ම ශක්තියෙන් එන එක කපන්න බෑ. කොච්චර කැපුවත් නැවතත් හැදෙනවා. මේ නිසා මනෝමය කයේ රෝගී තත්වය අයින් කළේ නැත්නම් ඒ වගේ රෝග සනීප කරන්න බෑ.**

මේ වගේ අවස්ථාවකදී ශරීරයේ ඉන්නෙ අමනුස්සයෙක් නම් යම්කිසි ගුප්ත බලයකින් ඇදල අරන් දාන්න පුළුවන්. නමුත් කර්ම ශක්තියෙන් ආපු දෙයක් නම් කරන්න දෙයක් නෑ. මේ නිසා තමයි කර්මජ රෝගවලට බෙහෙත් නෑ කිව්වෙ. ඒක බලවත් නම් බෙහෙත් නැතිව යනවා. මේ නිසා අයින් කරන්න වෙන්නෙ කර්මය කපලම තමයි. ඉතින් **මේක තේරුම් ගන්න පුළුවන් ඥානවන්තයෙක් නම් ප්‍රතිකර්මය විදිහට යම්කිසි පුණ්‍ය කටයුතු සිද්ධ කරල හෝ තමන් අතින් වෙච්ච පාප කර්මවලට වන්දි ගෙවල කර්මයෙන් නිදහස් වෙන්න බලනවා.** ඒ වගේ ක්‍රමයක් යෙදුවොත් අර රෝගය අතුරුදහන් වෙලා යනවා. එහෙම නැත්නම් ඉතින් කර්ම විපාකය ගෙවිල ඉවර වෙනකල් ඒක අතුරුදහන් වෙන්නෙ නෑ. මනෝමය කයේ සටහන් වෙලා තියෙනවා.

මේ විදිහට කර්ම විපාකයකින් නම් ඒ රෝගය ආවේ, ඒකෙන් මැරිල අහකට ගියත් දැන් ඒ ගන්ධබ්බයත් ලෙඩෙක් (දේව බ්‍රහ්ම අත්බැවකට නොගියොත්). දැන් ඒ ගන්ධබ්බයටත් ඒ රෝගය තියෙනවා. ඉතින් ගන්ධබ්බ ලෝකයේ ඉඳගෙන ඒක විඳවනවා. අර තාත්තට ගහපු එකේ විපාකය අත්බැව් ගණනක් ගිහිල්ල හරි විඳවනවා. මව් ගැබකට ගිහින් මස් ලේ කයක් ගත්තත් ඒ මස් ලේ කයටත් ඒ රෝගය හැදෙනවා. මේ විදිහට කර්ම ශක්තිය ප්‍රධානතම ප්‍රභවය වෙලා රෝග හැදෙන එක, එක ක්‍රමයක්. මීට අමතරව **අමනුස්සයන්ගේ සම්බන්ධයෙන් කර්ම ශක්තිය පැත්තක ඉඳන් උදව් දීලා ලෙඩ රෝග ඇති කරවන තත්ත්වයන් තියෙනවා.** මේ වගේ විවිධ ක්‍රම රටාවන්. ඒ මොකෙන් වුනත් කර්මය මුල්කොට, දායාද කොට, උපත කොට, නෑයා කොට, පිළිසරණ කොට ආදී වශයෙන් කර්ම ශක්තියත් කොහෙන් හරි කැරකිලා ඇවිත් සම්බන්ධ වෙනවා.

ඉතින් **අමනුස්සයන් ඉවත් කරන්න, උං ඉල්ලන මොනවා හරි තියේ නම් ඒ බලාපොරොත්තුව ඉෂ්ට කරල, යම්කිසි පුණ්‍ය ශක්තියකින් හොඳ අත්බැවක උපතකට යවන්න පුළුවන්නම්, ඒ අමනුස්සයා නිසා හටගත් රෝගය එයින්ම සනීප වෙනවා.** එහෙම නැතිව අර වගේ කර්මජ රෝගයක් නම් කර්ම ශක්තිය නොකැපුවොත් විඳලම ගෙවන්න වෙනවා. රෝග කාරකය අමනුස්සයෙක් නම් ඒක අයින් කරන්නත් ගුප්ත ලෝකයේ විවිධ ක්‍රම තියෙනවා. උදාහරණ විදිහට යම්කිසි අමනුස්සයෙකුට ස්ත්‍රියක් සම්බන්ධව බලාපොරොත්තුවක් තියෙනවා කියල හිතමු. උංට ඒ ස්ත්‍රියව දාල යන්න බෑ. මේකි මගේ ගෑනි කියල උං කියනවා. ඒ අස්සෙ තවත් එකෙක් ඇවිත් මගෙත් ගෑනි කියල කියනවා. බලන කොට මේ අමනුස්සයො දෙන්නම මේ ස්ත්‍රියගේ ආස්වාදය අතහරින්න කැමති නෑ. මේ වගේ අවස්ථාවක අධිෂ්ඨාන බලයෙන් මනෝමය වශයෙන් මවන්න පුළුවන් කෙනෙක් ඉන්නව නම්, ඔයිට වඩා ලස්සන කාන්තාවන් හතක් මවල දුන්නොත් අර ගෑනිව අත්හැරල මවපු එක පැනල ගන්නවා. උන් ස්ත්‍රීන්ට කෑදර නිසා මවල දුන්නොත් ඒක ගන්නවා. ඒ ගැන දන්න කෙනා, අභිඥා ශක්තියක් තියෙන කෙනා මනෝමය ඍද්ධියෙන් මවන්න පුළුවන් නම් එකට හතක් මවල, මේ හත්දෙනාම අරන් මේ කය අතහැරල පලයන් කිව්වම ඒ අමනුස්සයා ඒ කය අතහැරල අර මවපු එක අරගෙන උන්ගෙ ලෝකයට යන්න යනවා. අපේ ලෝකය වගේ තමයි ඒ අමනුස්ස ලෝකයෙත් උන්ගෙ අවශ්‍යතාවයන් තියෙනවා. ඊට පස්සෙ අමනුස්ස පොදි පිටින් ඒ ලෝකයට යනවා. මෙහෙම දෙයක් කළොත් බලා සිටිද්දීම අර ලෙඩේ සනීප වෙනවා.

ඊලඟට උමතු රෝග හෙවත් පිස්සුව කියල කියන්නෙ තවත් පැත්තක්. මෙතැනදීත් **අමනුස්සයන් සම්බන්ධ වෙලා උමතු රෝග ඇති කරන අවස්ථා තියෙනවා.** එතැනදී අමනුස්සයා මූර්ඡා බවට පත්වෙනවා. මනෝමයේ කයේ බලය අමනුස්සයාට වැඩිනම්, මනුස්සයාගේ කය මේ අවස්ථාවේදී ඒකට යටත් වෙනවා. අමනුස්සයා තීක්ෂණ මානසිකත්වයකින් නැගිල හිටියොත් ඒ මනුස්සයාගේ ☞

මනෝමය කය ඒ වෙලාවට නිදාගන්නවා. එතකොට දැන් ඇහැරිලා ඉන්නෙ අමනුස්සයා. මේ වගේ වෙලාවට තමයි ආවේශයෙන් ක්‍රියාකරන්නේ. හැබැයි ඒක ඒ මනුස්සය දන්නෙත් නෑ. නිදාගෙන හිටිය කෙනා ඇහැරෙනවා වගේ, අමනුස්ස බලය අඩුකරන්න මනුස්සයාගේ මනෝමය කය නැවතත් නැගෙනවා. එතකොට ඒ බව දැනෙනවා. උදාහරණ විදිහට යමෙක් බෙල්ල මිරිකලා කවුරු හරි මැරුවා කියල හිතමු. එතකොට ගති නිමිත්තෙන්ම ඒ මිනිහත් මැරිල ගිහින් අමනුස්ස ගන්ධබ්බයෙක් වෙනකොට ඒ පුද්ගලයාගේ බෙල්ලත් කවුරුන් හෝ මිරිකනවා පේනවා. එතකොට ඒ පුද්ගලයත් සිහි නැතිවෙලා කෑ ගහනවා. මේ විදිහට නැවත නැවතත් දවසකට සැරයක් හරි පරිසරය කර්ම ශක්තියෙන්ම සකස් වෙච්ච මොහොතක අමනුස්සයාට, තමන් පෙර අනුන්ට විඳවන්න දීපු දුක තමන්ටත් විඳවන්න අවස්ථාව එනවා. ඒ අමනුස්සයාට තමන් කරපු කර්ම ශක්තිය ගෙවෙන කල්ම ඕක සිද්ධ වෙනවා. ඕකගෙ බෙල්ල මිරිකලා මරපිය කියල තවත් කෙනෙක් උදව් කළා නම් ඒ උදව්කරුගේ කොටසත් ඒ උදව්කරුට එසේම හම්බවෙනවා.

මේ විදිහට විවිධ නොපෙනෙන අත්බැව්වල විපාක විඳල පසුව මිනිස් වෙලා උපන් කාලයක ශේෂ වෙච්ච විපාක ප්‍රවෘත්ති විපාක ලෙස ඔවුන්ට විඳින්න සිද්ධ වෙනවා. විවිධ කායික මානසික දුර්වලතාවන්ගෙන් පෙළෙන අත්බැව් මිනිස් වෙලා ලබනවා. ඒ වෙලාවට පෙර හවුල් වෙලා පවුකම් කරල, අමනුස්ස ලෝකවල මූර්ඡා වෙමින් දුක් විඳින අමනුස්ස කොටස් ඉහත කී මිනිස් ලෝකයේ ශේෂ ප්‍රවෘත්ති විපාක ගෙවන්න උපන් අයට ආවේශ වෙනවා. එතකොට ඒ මනුස්සයින්ටත් මූර්ඡා රෝග වැළඳෙනවා. මීමැස්මොර ආදී ආබාධ ලෙසත් මේවා දකින්න පුළුවන්.

ඊළඟට මේ මූර්ඡා රෝගවලත් කර්මජ ක්‍රමයක් තියෙනවා. දැන් අර බෙල්ල මිරිකල මරපු කෙනා අතීතයේ කරපු පුණ්‍ය කර්මයක් මතුවෙලා මනුස්සයෙක් වෙලා උපන්නොත්, අර කර්ම විපාකය ප්‍රවෘත්ති විපාක විදිහට එනවා. ඉන්පස්සෙ ඔහුගෙත් බෙල්ල කවුරුහරි මිරිකනවා වගේ මනස ක්‍රියාත්මක වෙනවා. හිටිගමන් බයවෙලා සිහි නැතිවෙනවා. කෙනෙකුගේ බෙල්ල මිරිකල පැත්ත දැම්මම ඒ පුද්ගලයාට දැනෙන්නෙ කොහොමද, ඒ විදිහටම මේ පුද්ගලයටත් දැනෙනවා. ඒක අමනුස්ස සම්බන්ධයකින් තොරව සිද්ධවෙන කර්මජ රෝගී තත්ත්වයක්. ඊට අමතරව සිහි නුවණ ඇති ගුණවත් අයට අභූත චෝදනා නැගුවමත් ඒවා හරි බලවත් වෙනවා. ඒවත් කර්ම විපාක වශයෙන් එකතු වෙලා තමන්ටත් අවසිහිවෙන අවස්ථාවක් එන්න පුළුවන්. මේ නිසා යමෙකුට නිග්‍රහ කළොත් නිග්‍රහ ලබන්න වෙනවා. බැන්නොත් බැනුම් අහන්න වෙනවා. ගැහුවොත් ගුටිකන්න වෙනවා. නැත්තම් කායික රෝගාබාධයකින් වන්දි ගෙවන්න වෙනවා. මේ වගේ කෙලවරක් නැති පීඩා එනවා. දැන් මේ කියන කාරණා පද නිරුක්ති මගිනුත් පැහැදිලි කරන්න පුළුවන්.

යමෙකුට ගහන්න බනින්න පය ඉස්සුව නම්, පා + ඉස්සු තමයි පිස්සු වෙන්නේ. පය උස්සන්නේ කාටහරි ගහන්න. යමෙකුට පය උස්සනවා, නැත්නම් බඩට පයින් ගහනවා. පයින් ගහනවා කියන්නෙ අතින් ගහනවට වඩා නීච වැඩක්. කෙනෙකුට කරන්න පුළුවන් ලොකුම නිග්‍රහයක් තමයි පයින් ගහනවා කියන එක. අතින් පනහක් හැටක් ගහනවට වැඩිය එක පා පහරක් ගහන එක නීචයි. කෙනෙකුට පය උස්සන්න එපා කියල අපි අතර කතාවක් තියෙනවා. මේ විදිහේ කර්මයක විපාකය හැටියට පිස්සුව එන්න පුළුවන්. ඒක කෙනෙකුගේ මනස සම්පූර්ණයෙන් විකෘති කරන වැඩක්. **කෙනෙකුට රිදුනෙ නැතත් පයින් පාරක් ගැහුවයි කිව්වම, ඒ පුද්ගලයාගේ මනසට හරි වේදනාවක් දැනෙනවා.** ඒ පහරට ලක්වන කෙනාගේ ගුණවත් භාවය මත විපාකය අඩු වැඩි වෙන්න පුළුවන්. ඒක මානසික රෝගවලට බලපානවා. මේකෙම තවත් වචනයක් තමයි උන්මාදය කියන්නේ. අපි අතර කතාවක් තියෙනවා. මද වැහෙනවා, මද ගහනවා කියල. ඒ කියන්නේ මත්වෙනවා කියන එකයි. මදනමත් වීම කියලත් කියනවා. උම් වෙනවා කියන්නෙ යොමුවෙනවා කියන එකයි. උම්මා එකක් දෙන්න කියල පොඩි ළමයින්ටත් කියනවා. ඒ කියන්නේ ඉඹිනවා, ළංවෙනවා කියන එකයි. එවිට මත්වෙලා ඉඹිනවා කියන අර්ථය තමයි එන්නේ. ඒ තමයි මුල්වෙන ගති ලක්ෂණය. ඒ කියන්නේ මුලින් කියපු ගතියම තවත් ක්‍රමයකින් එනවා. පහත් බවට නීච බවට පත්කරන වැඩ, ඒ වගේම කාමයන්ගෙන් මත්වෙලා මිත්‍යාචාර කරන්නා වූ ආස්වාදයන් විඳීමට ගන්නා විවිධ ක්‍රමවේද හෝ මේවායේ ස්වභාවයන් හෝ අරගෙන ආවොත් ඇතිවන ලක්ෂණ තමයි මේවායින් කියන්නේ.

ඊළඟට වලිප්පුව කියල රෝගයක් තියෙනවා. ඒක හැදුනම දතකට පූට්ටුවෙලා දඟලනවා. මේ වචනවල ගැබ්වෙලා තියෙන පද නිරුක්තිවලින් රෝගයේ මූල නිධානය කියන්න පුළුවන්. වලි + ඉප්පු තමයි වලිප්පු කියන්නේ. ඒ කියන්නේ වලියට උලුප්පනවා කියන එකයි. යම් කිසි දෙන්නෙක් වලියට ඇද දමලා කොටවලා එයින් ආස්වාදයක් ගන්න කැමති අය අදත් අපි අතර ඉන්නවා. මොකක් හරි කොස්සක් දැකල දෙපැත්තටම ගතු කියල දෙන්නෙක්ව අවුලවනවා. ඒකට අවශ්‍ය පසුබිම සකස් කරල දෙනවා. ඉතින් උන් දෙන්නා වෛරයෙන් ඇනකොටා ගන්නවා. වලිය අවුලවපු කෙනා උඩ පැන පැන බොහොම සන්තෝසෙන් ඒ දිහා බලාගෙන ඉන්නවා. මේක මහ අපරාධයක්. මේ වගේ අවස්ථාවක කර්ම විපාකය විදිහට තමන්ටත් කවදා හරි මනුස්සයෙක් වෙලා ඉන්න කාලයක සුදුසු පරිසරය සකස් වුනාම නහයෙන් කටින් සෙම දාගෙන එදා අන්‍යයන්ට දීපු දුක එන්න හේතු සකස් වෙනවා.

අතීතයේ පටන් මිනිස්සු අතර හටගන්නා තවත් රෝගයක් තමයි අතීසාරය. මේ අති කියන වචනයෙන් පෙන්වන්නේ ඉක්මවා ගියා කියන එකයි. සාර කිව්වේ සාරත්වයට. අපේ තිබිච්ච සාරධර්ම ඉක්මවා ගියානම් ඒකෙ හේතුවට අනුකූල ඵලය විදිහට අතීසාරය රෝගය හටගන්න පරිසරය සකස් වෙනවා. දැන් ඉතින් අතීසාරය හැදුනම සාරධර්ම හෝදා ඉක්මවා ගියා වගේම ශරීරයෙත් ශුද්ධ කොටස් හෝදගෙනම යනවා. ශරීරයේ තියෙන සාරය දියවෙලා පිටවෙනවා. ඉතින් අපි ලඟ සාරත්වය තිබුන නම් අතීසාරය හැදෙන්න හේතු නැතුව යනවා. අපරාපරීය වේදනා කර්මයක් ආවම, මේ වගේ රෝගයක් ඇදිල එන්න පුළුවන්. මේ විදිහට රෝග ලක්ෂණ ඇතිකරන පොදු මූලධර්මයන් දැනගෙන, ඒවායේ ස්වභාවය ධර්මානුකූලව තේරුම් ගත්ත නම්, අපි ඒවගේ දේවල් නැවත කරන්න යන්නෙ නෑ.

දැන් ඉතින් මේවට කාටවත් දොස් කියල වැඩක් නෑ. අහවලා අරක කෙරුවා, මට මෙහෙම කෙරුවා, මේ විදිහට කළා නම් මේ ලෙඩේ සනීප කරගන්න තිබුනා... ආදී වශයෙන් කෙනෙක් අඳෝනා කියන්න පුළුවන්. නමුත් ඒක නෙවෙයි මූල හේතුව. **කර්මයත් එක්ක සම්බන්ධ වෙලා ඒ කර්ම ශක්තිය ප්‍රබල නම්, ඒක අභිබවා යන්න බැරිනම් මොන ප්‍රතිකර්මය කළත් ඒ අවස්ථාවේදී ඒක ඒ විදිහට අහන්නෙ නැතිව යනවා. මේ නිසා හැම ලෙඩක් රෝගයක්ම භෞතික ප්‍රතිකාර කරපු පලියට ඒකෙන්ම සනීප වෙන්නෙ නෑ.** බාහිර භෞතික පරිසරයේ මොකක් හරි විපරීතයක් නිසා හටගත් එකක් එහෙම අයින් කරන්න පුළුවන් වුනත්, කර්මජ රෝග එහෙම අයින් කරන්න බෑ. ඒවා අයින් කරන්න නම්, ඒවා හටගත්තු මූලධර්මය ධර්මානුකූලව දැනගෙන විපාක ගෙවෙන විදිහට වැඩපිළිවෙල සකස් කරගත යුතුයි. ඒ විදිහට කටයුතු කරන කොට කරන බෙහෙත් පවා ප්‍රත්‍ය වෙනවා.

(ඉතිරි කොටසට ලබන කලාපයෙන්...)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්...

5 වන කොටස

අද ලිපියෙන් පෙන්වා දෙන්නේ අපි පුංචි කාලෙ ඉඳලම අහල තියෙන යම රජ්ජුරුවන් ඉන්න යම ලෝකයේ සැබෑ තත්වයයි. මෙතනදී යම කියන වචනයෙන් අදහස් කරන්නේ දෙලොවක් අතර කියන එකයි. මේ අවස්ථාවේ මනුස්සයා මැරිලත් නෑ. තවත් තැනක උප්පත්තිය ලබලත් නෑ. මැරෙන්න පෙර මනෝමය කයකින් ගෙනියන අවස්ථාවක් තියෙනවා. ඒ තමයි මේ යම කියන අවස්ථාව. මේ නිසා **දැල්වුනු ඇහැට මෙලොවත්, පියවුනු ඇහැට පරලොවත් කියල මේ යම ලෝකය ගැන ධර්මයේ සඳහන් වෙනවා.** හැබැයි මරණාසන්න මොහොතේදී සියල්ලන්ම යම ලෝකයට යන්නෙ නෑ. ඊට සුදුසු අය ඉන්නවනම් ඒ අය ඒකට සම්බන්ධ වෙනවා. ඒක නිකන්ම සිද්ධ වෙනවා නෙවෙයි. හෙළ බොදු පියුම 7 වන කලාපයේ අභයරතනාලංකාරය යටතේ විස්තර කෙරුනු පොත්ගුල් හතරේ කතාවෙන්, පිං පොතක් ගැන සඳහන් කළා ඔබට මතක ඇති. අන්න ඒ පිං පොත කියන එක තමයි ස්වයංක්‍රීයව මෙතනදී ඇදිල එන්නේ. ඒ පිං පොතෙන් තමයි ඒ ඒ පුද්ගලයා කරල තියෙන පිං පව් විග්‍රහ කරල විනිශ්චයක් ලබා දෙන්නේ. ඒ විනිශ්චය ලබා දෙන්නේ යම ලෝකයේ ඉන්න යම රජ්ජුරුවො තමයි.

**යම් කෙනෙකුගේ නඩුවක් විනිශ්චය කරන්න ඕන වුනාම ඒ පුද්ගලයාගේ පිං පොත ස්වයංක්‍රීයව යම රජ්ජුරුවො ළඟට යනවා.** අවශ්‍ය කටයුත්ත ඉවර වුනාම නැවත වරක් කවුරුවත් ගිහින් තියන්න අවශ්‍ය නෑ. ස්වයංක්‍රීයව ගිහින් අදාල ස්ථානයේ තැන්පත් වෙනවා. ඒ තමයි ගුප්ත ලෝකයේ තියෙන පොත් ගුලේ හැටි. කර්ම බලවේගයෙන්මයි ඒවා යන්නෙ එන්නේ. ඒකෙන් තමයි යමපල්ලන්ට යම රජ්ජුරුවො දැනුම් දෙන්නේ, අහවල් රටේ, අහවල් ගමේ, අහවල් පුද්ගලයා කියල. මෙලොවදී යම් පුද්ගලයෙක් **පිං පව් දෙකම කරල, ඒ අතර බරපතල පාප කර්මත් කරල තියෙන අවස්ථාවක ඒ මරණාසන්න මොහොතේ ඉන්න පුද්ගලයා යම ලෝකයේ ඉන්න දූතයන් විසින් ගෙනියනවා.** මැරෙන්න පෙර ක්‍රියාවකින් තමයි ඒක සිද්ධ වෙන්නෙ. මේ නිසා තමයි සමහර අය මැරෙන්න පෙර, මං එක්කගෙන යන්න ඇවිල්ල ඉන්නවා ආදී වශයෙන් කියන්නේ. එක්තරා අවස්ථාවකදී කෑගල්ල ප්‍රදේශයේ බලලෙක් මරපු පුද්ගලයෙක් මරණාසන්න මොහොතේදී, බලල් නඩුවට මාව ගෙනියන්න ඇවිත් ඉන්නව කියල ප්‍රකාශ කරල තිබුණා. මේ වගේ යම දූතයො කල් තියාම ඇවිත් අදහස දෙනවා.



හැබැයි මෙහෙම ගෙනිහින් සමහර අය ආපසු එවපු අවස්ථාත් තියෙනවා. එතකොට එයා නෙවෙයි, වෙන කෙනෙක් කියල නියමිත පුද්ගලයා රැගෙන යනවා. මොකද යම පල්ලන්ටත් වරදිනවා. එක්තරා විදෙස් ජාතිකයෙක් ශෛල්‍ය කර්මයකට භාජනය වෙලා සිහි නැති වෙලා හිටපු අවස්ථාවක සිද්ධ වෙච්ච මෙවැනි සිද්ධියක් ඒ පුද්ගලයා නැවත සිහිය ආවට පස්සෙ විස්තර කරල තිබුනා "උඹ අදට පලයන් හැබැයි උඹේ අනිත් එවුන්ටත් කියපං උන්ටත් මෙතනට තමයි එන්න වෙන්නෙ කියල." මෙහෙම කියපු ඒ පිරිස අර පුද්ගලයව අත හැරියලු. මේ වගේ සිද්ධීන් ඕන තරම් වාර්තා වෙලා තියෙනවා. ඒවා බොරු නෙවෙයි සත්‍ය සිදුවීම්. මේ වගේ වෙලාවක මනුස්සයා සිහි නැති වෙලා හරි මොකක් හරි වෙලා තවම මැරිල නෑ. මනෝමය කයින් අරගෙන යනවා. යම රජු පිං පොත බලල අදාල පුද්ගලය නෙවෙයි කියල දැනුම් දුන්නම ආපසු සැරයක් ඒ පුද්ගලයාව ගෙනිහින් සුදුසු කෙනා අරන් එනවා. මේ වගේ අවස්ථාවක නොමැරී දෙලොවක් අතර ඉන්නවා.

දැන් මේ විදියට **මේ මස් ලේ කයින් වෙන් වෙලා යන කොටත්, නැවත මස් ලේ කයට ඇතුල් වෙන කොටත් ඒ කයවල් දෙක අතර සම්බන්ධය ගොඩනගන්නේ එක්තරා රැහැනකින්.** ඒ ගැනත් යමක් දැනගෙන ඉන්න එක හොඳයි. ඒ රැහැනට Silver Code කියලත් බටහිර විද්‍යාවේ හඳුන්වනවා. හැබැයි ඒක මස් ලේ ඇහැට පේන එකක් නෙවෙයි. කොහොම හරි මේ රැහැන තියෙනකල් තමයි යන්නෙ එන්නෙ. මේ රැහැන ගැන කැස්බෑවෙක් උපමා කරපු දේශනාවකින් මේ විදිහට පෙන්වනවා. හැබැයි මේක උපමාවක් විතරයි.

එක් කැස්බෑ මවක් තමන්ගේ කැස්බෑ පුතාට මෙහෙම කියනවා. "පුතේ උඹේ පරම්පරාව විනාශ වුනේ ඔන්න ඔය පැත්තට ගිහින්. ඔය පැත්තේ ප්‍රිය මනාප කෑම තියෙනවා. ඒවා කන්න යන්න එපා. කන්න ගියොත් මිනිස්සු දාන උගුලක් තියෙනවා. ඒකට අහුවෙනවා. අපේ පරම්පරාවේ උන් ඕව කන්න ගිහින් විනාස වුනා. ඒ නිසා උඹ යන්න එපා." නමුත් කැස්බෑ පුතා මේක ඇහුවෙ නෑ ගිහින් කෑවා. කාල පැනල අම්ම ගාවට ඇවිත් කියනවා, මම නම් ගිහින් කාල ආව කියල. එතකොට ඒ කැස්බෑ අම්ම අහනවා, "බලපන් පුතේ උඹේ ඔය පිටිපස්සෙන් ඇවිත් රැහැනක් තියෙනව නේද? එහෙනම් ඉතින් උඹ ජීවිතයට තියෙන ආසාව අත හැරපන්. උඹේ අනිත් අයත් ගිහිල්ල ආවෙ ඔහොම තමයි. එහෙම ආවම උන් දන්නෙ නෑ. රැහැනෙන් ඇදල ගෙනියනවා. උඹත් ඉතින් හිටපන් දැන් කරන්න දෙයක් නෑ." කැස්බෑ මව මෙහෙම කියල ටික වෙලාවක් යන කොට රැහැනෙන් ඇදෙන්න පටන් අරන් මිනිස්සු අතරට ගිහින් ඒ කැස්බෑ පුතා මැරුම්

කැවලු.

මේ උපමාවෙන් කියන්නේ **පිං පව් කළාම ඒවා රැහැනකින් සම්බන්ධ වෙන හැටි** තමයි. අපි ඇම කනව වගේ යම් බලාපොරොත්තුවකින් යමක් කළොත් ඒ කාරණය අපිට රැහැනකින් සම්බන්ධ වෙනවා. ඒක පෙන්වන්නේ යම් කිසි මිනිහෙක් බිලී කොක්කක ඇමක් ගහල දියට දැම්මම ඇම ගිල්ල මාලුවා රැහැනින් බිලී කොක්කට සම්බන්ධ වෙනව වගේ. ඒක ගිල්ලම අර මිනිහට ඕන දෙයක් කර ගන්න පුළුවන්. එතකොට මේ රැහැනින් ඕන ලෝකයක් දක්වා යන්න පුළුවන්. හරියට දුන්නක් වගේ. ඒක කැඩෙන්නෙ නෑ. මනෝමය කයින් යනකොට කොච්චර දුර ගියත් ඒක තියෙනවා. කැඩුනයි කියන්නෙ එතැනින් ඒ අත්බවයේ ජීවිතය ඉවරයි කියන එකයි.

දැන් ඉතින් දෙලොවක් අතර ඉන්න මේ වගේ වෙලාවක පිං පව් විනිශ්චයට යනකොට, මැරිල කියල හිතල සමහර වෙලාවට ඒ පුද්ගලයාගේ දේහය එම්බාම් කරන්නත් පුළුවන්. නමුත් මැරිල නෑ. හෘදය වස්තුව වැඩ කරන බව යන්ත්‍රයට අහුවෙන්නෙ නෑ. අති සූක්ෂම යන්ත්‍රයකටවත් අහුවෙන්නෙ නැති අවස්ථා තියෙනවා. නමුත් ඒ අනුව දෙන වෛද්‍ය නිගමනය මැරිල කියලයි. මෙහෙම මැරිලයි කියල හිතාගෙන එම්බාම් කරන්න මෘත ශරීරාගාරයට යවපු ඇතැම් පුද්ගලයන්, මම මෙහෙම තැනකට ගියා කියල අත්දැකීම් විස්තර කරල තියෙන අවස්ථා මේ මෑතකදීත් අහන්න ලැබිල තියෙනවා. ඒ වගේම මියගියයි කියන සමහර පුද්ගලයන් එම්බාම් කරන කොට අමු ලේ ගලනවා. නමුත් මැරුණ නම් ලේ කැටි ගැහෙන්න ඕන. එහෙම කැටි ගැහිලත් නෑ. ඉතින් මේ වගේ අවස්ථාවක ඒ අය යම ලෝකෙ කැරකෙන වෙලාවක් වෙන්නත් පුළුවන්. එහෙම වෙලාවක එම්බාම් කළොත් අර රැහැන කැඩෙනවා. එහෙම වෙච්ච අවස්ථාත් තියෙනවා. මේ වගේ වෙලාවක භයානක පැත්තකුත් තියෙනවා. සමහරවිට මියගිය අම්ම හෝ තාත්ත එසේ මියගියයි කියල දෙන වෛද්‍ය නිගමනය අනුව දරුවන් විසින් ඒක පිළි අරන් එම්බාම් කරන්න භාර දෙන්න පුළුවන්. එහෙම වුනොත් ඒ අයට නොදැනුවත්වම බරපතල පාපකර්මයකට කර ගහන්න සිද්ධ වෙන්නත් පුළුවන්. මේ නිසා කෙනෙක් මැරුණ පලියට හදිසියේම එම්බාම් කරන්න හොඳ නෑ. මැරුණට පස්සෙ යම්කිසි වෙලාවක් ඉඳලා ඇඟ අධික සීතල වෙලා වෙනසක් එනවා. මොකද මළා නම් ශරීරයේ උෂ්ණත්වය ඉවත් වෙන්න ඕන.

ඉස්සරනම් මනුස්සයෙක් මැරුණම පපුවේ හෘදය වස්තුව තියෙන සීමාවේ වෙඬරු කැටියක් තියනවා. මොකද වෙඬරු කියන එක ඉතාම සියුම් උෂ්ණත්වයකටත් දිය වෙනවා. එහෙම වෙනව නම් පුද්ගලයා මැරිල නෑ. තවමත් ජීවත් වෙනවා. මේක පැරණි ක්‍රමයක්. මොකද නාඩි බැලුවොත් නාඩි වැටෙන්නෙ නෑ. නමුත් ශරීරයේ රස්නය තියෙනවනම් මැරිල නෑ. හැබැයි ඒ රස්නය සාමාන්‍ය අතකටවත්, වෛද්‍ය උපකරණයකටවත් අහු නොවෙන්න පුළුවන්. ඉතින් වෙඬරු කැටිය දියවෙන්නෙ කර්මජ තේජෝ ධාතුව තවමත් ඇඟේ තියෙන නිසයි. සර්පයෝ දෂ්ඨ කළාමත් සමහර වෙලාවට සමහර අයට සිහි මූර්ඡා වෙනවා. සිහි මූර්ඡා වෙච්ච කෙනාගේ නාඩි වැඩ කිරීම හා හෘදය කම්පනය උපකරණවලට ගෝචර නොවන ආකාරයට අති සියුම් වෙනවා. මේ කාරණය ඔප්පු වෙන, නමුත් වෛද්‍ය විද්‍යාවට තවමත් අල්ල ගන්න බැරි වෙච්ච විශේෂ අවස්ථා දෙකක් ධර්මයේ තියෙනවා.

**චතුර්ථ ධ්‍යාන සමාපත්තියට සමවැදිච්ච කෙනෙක්ගේ හුස්ම වැඩ කරන්නෙ නෑ. නාඩි ගැස්මත් ඉතා අඩු වෙනවා. නමුත් ජීවත් වෙනවා.** ඊටත් වඩා මහා ප්‍රභල අවස්ථාවක් තමයි නිරෝධ සමාපත්තිය කියන්නේ. **නිරෝධ සමාපත්තියට සම වැදිච්ච උත්තමයෙකුගේ හදවත වැඩ කරන්නෙ නෑ. නාඩි වැඩ කරන්නෙ නෑ. හුස්ම වැඩ කරන්නෙ නෑ. ඉන්ද්‍රියන් ප්‍රබෝධව පවතිනවා. ශරීරයේ උෂ්ණත්වය තියෙනවා.** නමුත් මේ වගේ අවස්ථාවකදී වෛද්‍ය විද්‍යාව නම් කියන්නේ මළා කියලයි. මොකද ඒ උපකරණවලට අහුවෙන්නෙත්, ඒ අය හොයාගත්තු සිද්ධාන්තවලට ගැලපෙන්නෙත් නැති නිසා. ඉතින් මේ කාලෙ හැටියට නම් එහෙම උදවිය හොයාගන්නත් අඩු නිසා වෛද්‍ය විද්‍යාවේ නිගමනය ඒකාන්තයෙන්ම මැරිල කියලයි. නමුත් වෙඬරු කැටියක් පපුවෙ තිව්වොත් දිය වෙනවා. ඉතින් යම ලොව කියන්නේ මේ වගේ අවස්ථාවක්. පුද්ගලයා යම වෙලාවක නම් ඉන්නේ වෙඬරු පොඩ්ඩක් පපු ප්‍රදේශයේ තිබ්බම ඒක දියවෙනවා.

මේ යම ලෝකය කියන එක අපායට කෙලින්ම සම්බන්ධ නෑ. නමුත් අපායට සම්බන්ධ කාර්යාලයක් වගේ. පොලොව යට එක්තරා සීමාවක (නාග ලෝකය වගේ) තමයි මේක පිහිටල තියෙන්නේ. සතර අපායේ නිරය (අටමහ නිරය හා ඔසුපත් නරකය) කියන එකේ කාර්යාලය තමයි මේ. ඒකට යන්න තියෙන්නේ කුහරයක් වගේ උමගක් තුලින්. ඒ උමග විශාල ශාලාවක් වගේ දිගයි. හත් අට දෙනෙකුට වුනත් කිසිම අපහසුතාවයකින් තොරව යන්න පුළුවන්. හැබැයි මනෝමය කයින්. ගියාම තියෙන ප්‍රදේශයත් හරි විශාලයි. ගස් කොලන් වටා පිටාවක් පේන්න නෑ. කාර්යාලයක් වගේ. ඒකෙ බාහිර ලියන මේස නෑ. නමුත් යම රජු ඉන්න තැන ලිඛිතව කරන කටයුත්තක් තියෙනවා. ලියකියවිලි ගන්න, භාර දෙන්න පුළුවන්. උපදෙස් දෙන්නත් පිරිසක් ඉන්නවා. භාරගන්න වටිනවනම් භාරගන්නවා. නැත්නම් ප්‍රතික්ෂේප කරනවා. වට පිටාවේ යම පල්ලන් තැනින් තැන සැරිසරනවා. එහේ රන්ඩු සරුවල් නෑ. නමුත් යම් කිසි ආකාරයකින් විනිශ්චයක් දුන්නොත් ඒ යමපල්ලො තමයි අල්ලගෙන යන්න එන්නේ. විනිශ්චයක් දෙනකල් ඒ අයගෙන් කරදරයක් නෑ. විනිශ්චයක් දෙන්නෙ යම රජ්ජුරුවො තමයි. ඒ විනිශ්චය ලැබෙන්නේ කර්ම ශක්තිය අනුවමයි. යම්කිසි විදිහකින් නිරයට යන්න විනිශ්චයක් දුන්නොත් ආයෙ මෙහේ එන්නෙ නෑ. එතකොට අර කලින් පෙන්වපු රැහැන කැඩෙනවා. විනිශ්චය දෙනකල්ම ඒ රැහැන තියෙනවා. ඒක තමයි දෙලොවක් අතර කාලය කිව්වේ. මේ කරුණු කාරණා අපේ මේ මනුස්ස ලෝකයේ උසාවි, පොලිසි ආදිය වගේ තමයි සිද්ධ වෙන්නේ. හැබැයි මෙහේ වගේ ජාතීන් වශයෙන් බෙදිච්ච නීති, අයුතු අසාධාරණකම් ආදිය එහේ නෑ. මොන රටෙන් මොන ලොක්කෙක් ගියත් ඔක්කෝටම එක හැන්දෙන් තමයි බෙදන්නේ. මේ කියන කාරණාවන් පියවි ඇසට නොපෙනුනාට සමාධියේදී සමහර අවස්ථාවල සමහරෙකුට දැක බලා ගන්න පුළුවන්.

මේ විදියට යම්කිසි පුද්ගලයෙක් මේ ස්ථානයට ගෙනිහින් යම්කිසි නිරයකට යන්න ඕන කියල දඬුවමට සුදුසු ස්ථානයක් තමයි ධර්මතාවයෙන් කැරකිලා එන්නේ. එහෙම ධර්මතාවයෙන් කැරකිලා ආවට පස්සෙ බේරන්න පුළුවන් නම් යම රජ්ජුරුවෝ හැකි තරම් ඒකට උත්සාහ කරනවා. ඒ කියන්නේ දඬුවම් දෙන්න නෙවෙයි බේරන්නයි උත්සාහ කරන්නේ. **හැම කෙනෙක්ම බේරගන්න පුළුවන්ද කියල බලන එක යම රජ්ජුරුවන්ට කර්ම ශක්තියෙන්ම ආපු ආවේණික දෙයක්.** යම රජු අර පිං පොතෙන් ඒ පුද්ගලයාගේ පිංකම් කරපුව බලනවා. එහෙම කරපු පිං තියේ නම්, උඹ මෙහෙම පිංකම් කරල තියෙනවා, ආදී වශයෙන් ඒ පුද්ගලයාට දැනුම් දීමක් කෙරෙනවා. දැන් එතනදී ඒ පුද්ගලයා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනවා වගේ මේ විදිහේ ප්‍රශ්ණ අහනවා. උඹට ඒක මතක නැද්ද? මතක් කරන්න පුළුවන්ද? මේ විදිහට ඒ පුද්ගලයාට චිත්ත ප්‍රසාදය ඇති කරන්න පුළුවන්ද කියල බලනවා. එහෙම මතක් කළාම ඒ පුද්ගලයාගේ මනස වෙනස් වුනොත් සුගතියකට යන්න පුළුවන්. මේ විදිහට දුගතියකට දාන්න නෙවෙයි උත්සාහ කරන්නේ. නමුත් බැරිම වුනොත් තමයි අහන්නෙ, පළමු දූතයා උඹ දැක්කෙ ☞

නැද්ද? දෙවැනි දූතයා උඹ දැක්කෙ නැද්ද? තුන්වන දූතයා උඹ දැක්කෙ නැද්ද? ආදී වශයෙන්. ඒ විදිහට විනිශ්චය කරන ක්‍රමයක් තියෙනවා. ඒ ක්‍රමය මෙහෙමයි.

උපන් පොඩි දරුවො තමයි මේ කියන පළමු දූතයා. දැන් යම රජ්ජුරුවො මෙහෙම අහනවා. මේ උපන් හැටියෙ පොඩි එකා අනුන්ගෙ පිළිසරනින්, අනුන් නිසා ජීවත් වෙනවා. ඉතින් අනුන්ගෙ පිළිසරනින් ජීවත් වෙන ශරීරයක් අරගෙන උඹ ඇයි මේ අන්‍යයින්ට හිංගි හිංසා අයුතු අසාධාරණකම් කළේ? උඹට ඕක අයුතුයි අසාධාරණයි කියල තේරුනේ නැද්ද? ස්වාමීනි, මම ප්‍රමාද වුනා, මම ඒ ගැන හිතුවෙ නෑ කියල මේ ආදී වශයෙන් ඒ පුද්ගලයා දැනුම් දෙනවා. ඉන්පස්සෙ නැවතත් මෙහෙම අහනවා. උඹ දෙවැනි දූතයා දැක්කද? මං කවුද කියන්න දන්නෙ නෑ කියල උත්තර දෙනවා. උඹ ලෙඩ්ඩු දැකල නැද්ද? ඔත්පල වෙලා යන්න එන්න බැරි අය එහෙම දැකල නැද්ද? ඉතින් දැකල තියෙනවයි කියල උත්තර දෙනවා. ඒ අයට කවුද සාත්තු කළේ? කවුද ගොඩ ගත්තේ ? ඒ තැනැත්තා මේ ජනතාව නේද ගොඩ ගත්තේ? ඉතින් එහෙම ජනතාවට ඇයි උඹ මේ හිංගි හිංසා කළේ? අන්‍යයන්ගේ ආධාරයෙන් තමනුත් ජීවත් වුනා නම්, අන්‍යයන්ට එහෙම කරන්න හොඳ නෑ කියල උඹට හිතුනෙ නැද්ද? දැන් ඉතින් වරද පිලිගන්නවා. මං ඒකට ප්‍රමාද වුණා, මං ඒ ගැන හිතුවෙ නෑ ආදී වශයෙන් උත්තර දෙනවා.

ඊළඟට තුන්වෙනි දූතයා ගැන අහනවා. කුදු වෙච්ච, හැරමිටියෙන් යන, කෙස් පැහිච්ච, හම රැලි වැටිච්ච ආදී වශයෙන් විග්‍රහ කරල අහනවා. අනුන්ගේ පිළිසරණ ඉල්ලගෙන, පිහිටකින් ජීවත්වන මේ වගේ මහළු අය උඹ දැකල නැද්ද? එහෙම අය දැක්ක නම් උඹටත් එහෙම කයක් එනකොට අනිත් අයගෙ පිළිසරණ ඕන කියල දැක්කෙ නැද්ද? එහෙම දැනගෙනත් ඇයි උඹ සමාජයට, මිනිස්සුන්ට හිංසා කළේ? බැලුවෙ නෑ, හිතුවෙ නෑ ආදී වශයෙන් දැන් ඔහු අඳෝනා කියනවා. ඊළඟට හතරවෙනි දූතයා ගැන අහනවා. උඹ මළ මිනියක් දැකල නැද්ද? දැකල තියෙනවා. ඒ මළ මිනියට මිනිස්සු ප්‍රිය කළාද? ඒවා නියමිත තැනට ගෙනිහින් සුද්ධ පවිත්‍ර කරල අනිත් අය සේවයක් කරනව නේද? එහෙම සේවයක් කරන මනුස්සයින්ට ඇයි උඹ අසාධාරණකම් කළේ? උඹටත් කවදා හරි මළාට පස්සෙ ඒවගේ තත්ත්වයකට පත්වෙන්න වෙයි කියල හිතුවෙ නැද්ද? දැන් ඉතින් මට කරන්න දෙයක් නෑ. මේ පාපය උඹේ අම්ම තාත්ත කළෙත් නෑ, සහෝදර සහෝදරියන් කළෙත් නෑ, අන්‍ය නෑදෑයෙක් හිත මිතුරෙක් කළෙත් නෑ. මේක උඹමයි කළේ. ඉතින් උඹ කරපු පාපයට කවුද විපාක විඳිය යුත්තේ? කවුද වගකිව යුත්තේ? අනිකෙකුට උඹ කරපු පාපය පවරන්න පුළුවන්ද? දැන් ඉතින්, නෑ ස්වාමීනි, මම කරපු එකට මමම වැරදිකරු කියල පිලිගන්නවා. ඉතින් උඹ බේරගන්න ක්‍රමයකුත් නෑ, උඹ යහපතක් කරලත් නෑ. මම මොකද කරන්නේ? උඹ කොහොම බේරන්නද? උඹට හිමි යම්කිසි දඬුවමක් ඇත්නම් අන්න අහවල් විදිහේ අපායක, අහවල් දඬුවම උඹට හිමියි. උඹට හිමි දඬුවම උඹට හම්බ වෙයි. මට කරන්න දෙයක් නෑ. මේ තමයි අවසාන විනිශ්චය. ඉන්පසු යමපල්ලන් ඒ පුද්ගලයා



අල්ලගෙන ගිහින් දඬුවම් ඒ විදිහටම දෙනවා.

මේ වගේ අවස්ථාවක සමාව ගන්න හරි අවස්ථාවක් ලැබෙන්නේ ඒකටත් හිමිකමක් තියෙනව නම් විතරයි. එවැනි අවස්ථාවක් හෙළ පොදු පියුම 14 වන කලාපයේ "අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්" ලිපියෙන් ඉදිරිපත් කළා. "අනුන්ට හිංගි හිංසා කළත් උඹ උදව් කරපු අයත් ඉන්නවනේ. ඒ නිසා උඹට සමාව ගන්නත් හිමිකමක් තියෙනවා. බේරෙන්න ඕන නම් උඹට පුළුවන් දැන් ගිහින් සමාව ගන්න." මේ ඔක්කොම කියන්නෙ අර පිං පොත බලල තමයි. මේ ආදී වශයෙන් කිව්වමත් සමාව ගත්තෙ නැත්නම් දඬුවම් දෙනවා. ඒ වගේම **කරපු හොඳ වැඩ තියෙනව නම් මතක් කරල දීල චිත්ත ප්‍රසාදය මතු කරවල නිදහස් කරන්න බලනවා. එහෙම මතක් කරල දීලත් චිත්ත ප්‍රසාදයක් මතු කරගන්න බැරිනම් කරන්න දෙයක් නෑ.** මේ පිං පොත කියව කියව ඉන්න දෙයක් නෑ. ස්වයංක්‍රීයව පොතේ පිටු පෙරලිලා එනවා. ලිඛිතව ඕන නම් ලිඛිතව බලන්නත් පුළුවන්, අවශ්‍ය නම් දර්ශනයෙන් බලන්නත් පුළුවන්. දැන් මේ වගේ දේව දූතයන් එන හැටි, ඒ අය ඇවිත් දැනුම් දෙන හැටි ත්‍රිපිටකයේ තියෙනවා. හැබැයි අර පිං පොත ගැන, ඒක එන හැටි ආදී කරුණු ත්‍රිපිටකයේ නෑ. ඒවා දිවැස් සමාධි ලබපු අයගේ අත්දැකීම්.

කොහොම හරි මේ වගේ සමාව ගන්නත් හේතු තියෙන අයට ඒකටත් අවස්ථාවක් ලබා දීල බැරිම වුනොත් තමයි දඬුවම් දෙන්න ගෙනියන්නේ. මේ වගේ වෙලාවකදී අපායේ තියෙන කටු ඉඹුලක් ගැන, ඒවගේම කකුල් පලල ලුනු දාන හැටි, ගින්දර උඩ ඇවිද්දවන හැටි, කටට උණු ලෝදිය වත්කරන හැටි.... මේ ආදී දඬුවම් ගැන අපි අහල තියෙනවා. ඒ කියන දඬුවම් සම්පූර්ණයෙන්ම ඇත්ත. හැබැයි ඒවා තියෙන්නේ යම ලෝකයේ නෙවෙයි. නියමිත නිරයට ගෙනිච්චට පස්සෙ එතැනදී තමයි ඒ දඬුවම් ලබා දෙන්නේ. අර සමාව ගන්න කියන වෙලාවෙ මේ දෙන දඬුවම් දකින්නෙ නෑ. දැක්ක නම් ඒ පුද්ගලයා බය වෙනවා. හරියට වැරදි කරපු කෙනෙක් හිරේට දාන කොට හිර ගෙදර මොන වගේ තැනක්ද කියල දන්නෙ නෑ වගේ. ගියාට පස්සෙ තමයි එතැන ස්වභාවය දැන ගන්නේ. මේ නිසා කල් තියා නුවණින් තේරුම් ගන්න ඕන, හිරගෙදර යනවද දඩය ගෙවනවද කියල. හිරගෙදර තත්වය දන්නෙ නැත්නම් මං හිරේ යනව කියල ලොකු කමට කියන්න පුළුවන්. නමුත් ගියාට පස්සෙ තමයි ලතැවෙන්න වෙන්නෙ. ඊට පස්සෙ කරන්න දෙයක් නෑ. මෙන්න මේ වගේ තමයි අපායේ දඬුවම් විඳින්න ඉස්සෙල්ල සමාව ගන්න අවස්ථාව ලබාදෙනකොට එහි ස්වභාවය දැක්කෙ නැත්නම්, ගියාට පස්සෙ කරන්න දෙයක් නෑ. හැබැයි මනුස්ස ලෝකෙදිත් යම්කිසි කෙනෙක් හිරයට නියම කරන කොට ඒක දඩ මුදලකින් හිලව් කරන අවස්ථාත් හැමෝටම නැතිවා වගෙයි, අපායෙදිත් සමාව ගන්න අවස්ථාව හැමෝටම

ලැබෙන්නෙ නෑ. හේතු තියේ නම් විතරයි ලැබෙන්නේ.

ඉතින් මේ වගේ **යම ලෝකය නිර්මාණය වෙලා තියෙන්නෙත් මේ මනුස්ස ලෝකෙ වගේ එක්තරා ආකෘතියකට අනුව.** ඒ කියන්නෙ මේ මනුස්ස ලෝකය ගත්තම මෙහේ නඩු අහන උසාවි, නඩුකාරවරු ඉන්නවා. ඒ වගේම ඒ උසාවිවලට වැරදි කළයි කියල සැක කරන අයව ගේන්න පොලිසියෙන් ඉන්නවා. ඊළඟට දඬුවම් නියම කරන කොට ඒ අයව නියමිත ස්ථාන කරා රැගෙන යන්නත් තවත් පිරිසක් ඉන්නවා. ඊට පස්සෙ දඬුවම් කරන්න තවත් පිරිසකුත්, ඒ හිරකාරයන්ව බලාගන්න තවත් පිරිසකුත් ලෙස මේ ආදී වශයෙන් විවිධ කණ්ඩායම්වලට ඒවායේ පාලන කොටස් භාර දීල තියෙනවා. මෙන්න මේ වගේ තමයි යම ලෝකයෙත් වැරදි කරපු අයට ඒ බව දැනුම් දීලා, නඩු අහලා, විනිශ්චයක් දීලා, දඬුවම් නියම කරන තෙක් ඒකට සැදී පැහැදී ඉන්න විවිධ යම කණ්ඩායම් ඉන්නවා. එතකොට ඒ අයගේ ඒ නියමිත කාර්ය භාරය තීරණය වෙන්නෙත් මනුස්ස ලෝකයේදී වඩපු සංඛාර අනුව තමයි. මොකද ඔය යම රජ්ජුරුවො ඇතුළු යම පල්ලන් වෙන්නෙත් කවදා හරි මේ මනුස්ස ලෝකයේදී ඊට අදාල සංඛාර වඩපු අය මිසක් වෙනත් ලෝකෙකින් ඇවිල්ල නෙවෙයි. දැන් කියන්න යන්නෙ ඒ වඩන සංඛාරවල ස්වභාවයන් තමයි. සිය කැමැත්තට අනුව ගොඩනැගෙන ධර්ම ස්වභාවයට අනුව ඒ තානාන්තර හිමි වෙනව මිසක් ඒවා වැටුපට වැඩ කරන තැන් නෙවෙයි.

මෙතනදී බොහෝ විට ක්‍රියාත්මක වෙන්නෙ කළු සුදු කියන පිං පව් මිශ්‍රණයක් තමයි. **ශිෂ්ඨ සමාජයට යහපතක් කිරීම පිනක්. නමුත් දඬුවම් දීම පවක්.** දැන් සමහරු ඉන්නවා, අපට වෙන මොකුත් ඕන නෑ, පවුල් වෙන්න ඕනත් නෑ, සමාජයට අසාධාරණය කරන පිරිසක් ඉන්නව නම් ඒ අයගෙන් පලිගන්න දඬුවම් දෙන්න අවශ්‍යයි කියන මානසිකත්වය තමයි ඒ අයට තියෙන්නෙ. එතකොට ඒ අයට ඕන සැප ජීවිතයක් නෙවෙයි. එක්තරා අසාධාරණයක් කරපු පිරිසකගෙන් පලිගැනීමේ බලාපොරොත්තුවෙන් ඒ වගේ සංඛාර වඩනවා. පලිගන්නෙත් අවංකවම අසාධාරණ අයුතු වැඩවලට විරුද්ධව තමයි. ඉතින් කල්ලිත් ගැහෙනවා. ඒ නිසා ඒ අය බොහෝ කොටම තම නිවෙස්වල නෙවෙයි ජීවත් වෙන්නේ. කල්ලි ගැහිල මග රැකවල්ලා ගෙන ඉඳල හතුරො එන කල් බලාගෙන ඉන්නවා. එහෙම ඉන්න කොට ඒ අයට තමන්ගේ පවුල් රැක බලා ගන්න කියල වටින කමක් නෑ. දරදඬු ගැහිච්ච උන්ගෙ කල්ලිවල කට්ටිය එකතු වෙලා රෑ දවල් දෙකේ අර අසාධාරණකම් කරපු අයගෙන් පලිගන්න බලාගෙන ඉන්නවා. මේ නිසා ඒ අයට පවුල් ජීවිතයේ කාම සම්පත්තියක් ගැන බලාපොරොත්තුවක් නෑ. හැම වෙලේම අසාධාරණය කරපු වරදකාරයන්ගෙන් පළිගන්නමයි බලන්නේ. මේ නිසා **යම ලෝකයේ පවුල් කන ජීවිතයක් නෑ. ස්ත්‍රී පුරුෂ භේදයක් නෑ.**

මේ කියපු සංඛාර රජයට සම්බන්ධ අධිකරණ පොලීසි බන්ධනාගාර ආදියේ සේවයේ නියුතු අයට මෙන්ම පෞද්ගලිකවත් වඩන්න පුළුවන්. මොකද සමහරු ඉන්නව මට බලය හම්බවුනා නම් මම ඔය අසත්පුරුෂයන්ට මෙහෙම කරනවා කියල බලය නැතුවත් ඒ සංඛාරය වඩන අය. හැබැයි ඉතින් අසාධාරණ කරපු අසත්පුරුෂ අයගෙන් පළිගන්නවා මිසක් සත්පුරුෂයන්ගෙන් පළිගන්නෙ නෑ. අසාධාරණය මට පේන්න බෑ කියන මානසිකත්වය තියෙනවා මිසක් සත්පුරුෂයන්ට අයහපතක් කරන බලාපොරොත්තුවක් නෑ. සත්පුරුෂයන්ට යහපතක් කරන, අසත්පුරුෂයන්ගෙන් පළිගන්න අය ඉන්නේ චාතුර්මහාරාජික දේව කොට්ඨාශයේ. යම ලෝකයේ අයගේ අදහසුත් ඊට අනුකූලයි. නමුත් චාතුර්මහාරාජිකයේ අණ කළාට යම ලෝකෙ වගේ දඬුවම් දෙන්න යන්නෙ නෑ. මේ සංඛාර වඩන අය අදත් අපි අතර ඉන්නවා. මේ නිසා ඒකට ගැලපෙන සූක්ෂම සුදුසු කායිකත්වයකින් යම ලොව ඉපදෙනවා. යම රජු කියන පුද්ගලයා වෙන්නෙ මීට වඩා ටිකක් වෙනස් කෙනෙක්. මනුස්ස ලෝකයේ ඉන්න නඩුකාරවරුන්ගේ ප්‍රධාන අරමුණ සමාජය අසත්පුරුෂයන්ගෙන් සුද්ධ කරල බේරගන්න එක නම් ඒ සංඛාර බලවත් වෙලා වඩන කෙනා ඒක උපාදාන කරගෙන යම ලෝකයේ රජවරු වෙලා උපදින්න හේතු යෙදෙනවා. ඒකත් තානාන්තරයක්. මේ වගේ එක් සක්වලකට එක් යම ලෝකයක් බැගින් පිහිටල තියෙනවා. එහි විවිධ කොටස් ප්‍රදේශ ආකාරයෙන් තියෙනවා. යමරජවරුත් හුඟක් ඉන්නවා. එක්කෙනෙක් ආයුෂ පිරිහිලා චුත වෙන කොට තවත් කෙනෙක් එතනට පත්වෙනවා. යම ලෝකයේ ඉන්න අයගේ ස්වරූපයන් පවා අදාල තනතුරු අනුව වෙනස් වෙනවා. යම රජු කියන කෙනා සැඩපරුෂ නෑ. කොහොම හරි නිදහස් කරන්න අවස්ථාවක් දෙන්නයි බලන්නෙ. හැබයි විශේෂ සැළකිලි නෑ. පිං පොතට අනුවමයි ඒක තීරණය කරන්නේ. එතකොට මරණාසන්න මොහොතේ දී දූතයෝ වගේ එන අයත් සැඩ පරුෂ නෑ. මනුස්ස ස්වරූපයෙන් ඉන්නේ. සූක්ෂම කායිකයි, ගන්ධබ්බයෝ වගෙයි. නමුත් ඒ අයට සූක්ෂම කායික කියල දැනෙන්නෙ නෑ.

දඬුවම් කරන යම පල්ලන් බොහොම රෞද්‍රයි. උස මහත මහ විශාල ශරීර ඒ අයට පිහිටල තියෙනවා. නමුත් ඒවත් සූක්ෂම කායිකයි. මේ ආකාරයෙන් කරන කාර්ය භාරය අනුව ස්වරූපය වෙනස් වෙනවා. හරියට මනුස්ස ලෝකය වගෙයි. නඩු අහන අය එක ස්වරූපයක්, පොලීසිය එක ස්වරූපයක්, අලුගෝසුවන් තවත් ආකාරයක්, හිරකරුවන් බලාගන්න ඉන්න අය තවත් ආකාරයක්. මේ වගේ මනුස්ස ලෝකයේදී වඩපු සංඛාරම තමයි යම ලෝකයේ කායිකත්වයට හේතු වෙන්නේ. ප්‍රිය මනාපයෙන් ඒ රැකියාව සංඛාරයක් විදියට වඩා ඒක උපාදාන කළා නම් යම ලොව ඉපදෙන්න හේතු වෙනවා. ඒ අයගේ ආහාරයත් කර්ම ශක්තියෙන්මයි මැවෙන්නේ.

දඬුවම් දෙන යමපල්ලොත් ඒ දඬුවම් ලබන අයත් අදාල අපායට යනවා. නමුත් ඒ යමපල්ලන්ට ඒ ලෝකය ඔරොත්තු දෙනවා. හැබැයි දාහයකුත් එනවා. හරියට පාන් පෝරනුවේ බාස් උන්නැහේ වගේ. පාන් පිච්චුනාට බාස් පිච්චෙන්නෙ නෑ. හැබැයි දාඩිය දානවා. මහ වෙහෙසක් විඳගෙන තමයි ඒක ඇතුලෙ ඉන්නේ. යමපල්ලොත් එහෙමෙ තමයි. එක්තරා ඔරොත්තු දෙන විදියකින් හිටියත් අනුන්ට දඬුවම් දෙන්නත් දුක් විඳගෙන වෙහෙස වෙන්න වෙනවා. දඬුවම් දීල ඒ අය යන්න යනවා. සමහර අපායවල්වලට යමපල්ලො අදාල පුද්ගලයන්ව එක්ක ගෙන යනවා, දොර ඇරෙනවා, ඒකට තල්ලු කරනවා, එච්චරයි. නැවතත් දඬුවම් දෙන්නෙ නෑ. කර්ම ශක්තියෙන්ම පිච්චි පිච්චී ඉන්නවා. ඒ ගිනි අපායවල් වගේ තැන්වල. නමුත් ඊට වඩා අඩු විපාක තියෙන ඔසුපත් නිරය වගේ තැන්වල මනුස්ස ලෝකයේ වගේ වෙලාවෙන් වෙලාවට දඬුවම් දෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්නේ යමපල්ලන් විසින්. මේ නිසා යම ලෝකයේ පිනක් කරගන්න කියල විශේෂ අවස්ථාවක් නෑ. මේ නිසා යම රජු කියනවා ඊයෙත් බුදු කෙනෙක් පහල වෙලා, අදත් බුදු කෙනෙක් පහල වෙලා, ඉතින් මම මෙච්චර කල් නඩු විසඳ විසඳ ඉන්නව මිසක් මට එක බණ පදයක් අහන්න යන්න වෙලාවක් නෑ කියල. මෙහෙම කිය කියා දුක් වෙනවා. මෙතනදී ඊයෙත් අදත් කියල කිව්වේ, ඒ තරම් ඒ අයගේ කාල සීමාව (තානාන්තරය) දිගයි කියන එකයි. බුද්ධාන්තරයකුත්, එක් දිනක් වගෙයි යම රජුට දැනෙන්නේ.

මේ අය චුත වෙන කොට එතැනට පත්වෙන්න අයත් ඕන තරම් ඉන්නවා. මේ ලෝකයේ වගේම තමයි. මෙහෙත් නඩුකාරවරු, පොලීසියේ උදවිය, බන්ධනාගාර නිලධාරීන් වගේ අය රාජකාරියෙන් විශ්‍රාම යන කොට තවත් අය ඒ තැන්වලට පත් වෙනවා. මේ ☞

වගේ එහෙත් ධර්මතාවයෙන් ඒක සිද්ධ වෙනවා. **එහෙන් චුත වෙන කොට සමහර විට ඒ යමපල්ලොත් ඒ ආශ්‍රිත අපායවල්වලටම වැටෙන්න පුළුවන්. මොකද ඒ අයගේ පළි ගැනීමේ තියෙන දරුණු මානසිකත්වය නිසා.** මේ නිසා ඒ අයටත් කිසිම සැනසිල්ලක් නෑ. කොච්චර දඬුවම් දුන්නත් ඉවරයක් නෑ. තව තවත් එනවා. ඒ අයත් පව් කර ගන්නවා. මේ නිසා ඒ අයත් සැනසිලා සුගතියට යනවයි කියන්න අමාරුයි. වැඩි සම්භාවිතාව තියෙන්නේ තවත් පහලට යන්න තමයි. මොකද ඒ අය වුනත් අසත්පුරුෂ වැඩේට දඬුවම් දෙනවා මිසක් නියම අසත්පුරුෂයා කව්ද කියල හොයාගන්න ඒ අයටත් බෑ. උදාහරණ විදියට ගත්තොත් බෝසතාණන් වහන්සේ කියන්නේ සත් පුරුෂයෙක්. නමුත් ඒ වගේ සත්පුරුෂයෙක් සමහරවිට කරපු අසත්පුරුෂ කටයුත්තකින් මේ වගේ අපායකට ගියොත්, ඒ අසත්පුරුෂ මාත්‍රයට හෝ දඬුවම් කරනවා මිසක් මේ ආවේ බෝසත්වරයෙක් නේද කියල වටහාගන්න මානසිකත්වයක් ඒ අයට නෑ. වැඩේ අසත්පුරුෂ නම් එහෙම කෙනෙක් ධර්මතාවයෙන් නිරයට ආවොත් ඒ අයටත් වෙනසක් නැතිව දඬුවම් දෙනවා. එතකොට ඒකෙන් ලැබෙන පාපය වැඩියි. නමුත් ඒ යමපල්ලන් අර පාප ක්‍රියාව විතරයි දකින්නේ. මේ නිසා හරි විදියට නම් දඬුවම් නොකර ඒක ධර්මතාවයෙන්ම විපාක විඳලයි විසදෙන්න ඕන. මොකද **මේ යම ලෝකයත් සංඛාරවලින් ගොඩනගාගත් ලෝකයක් නිසා එතැන දෙන දඬුවම් වුනත් නියම දහමට ගැලපෙන්නෙ නෑ.** මේ නිසා ධර්මතාවයෙන්ම ඒ විපාකය ගෙවිල ඉවර වුනොත් සමහර වෙලාවට යමපල්ලො ගහන පහර වදින්නෙත් නෑ. ඒක වෙන පැත්තකට යනවා.

**අපේ ගෞතම බෝසතාණන් වහන්සේත් එක් අත් බැවකදී තේමිය කුමාරය වෙලා ඉපදෙන්න පෙර අත් බවයක රජකම් කරල කරගත්ත පව්වලින් ඔසුපත් නරකයේ අවුරුදු 80,000 ක් දුක් වින්ද** බව ධර්මයේ සඳහන් වෙනවා. හැබැයි ඒ වෙනකොටත් බුදු වෙන්න නියත විවරණ අරගෙනයි තිබුනේ. මොකද නියත විවරණ ගත්තත් කරපු පව්වලට අපාගත වෙන්න වෙනවා. හැබැයි අටමහ නිරයට යන්නෙ නෑ. ඒ කියන්නෙ ඔසුපත් නිරයෙන් පහලට යන්නෙ නෑ. මීට අමතරව අලියෙකුට වඩා විශාල සතෙක් වෙන්නෙත් නෑ. වටු කුරුල්ලෙකුට වඩා කුඩා සතෙක් වෙන්නෙත් නෑ, ස්ත්‍රියක් වෙන්නෙත් නෑ, පහත් නීච යයි සම්මත කුලයක උපදින්නෙත් නෑ කියල පෙන්වා තියෙනවා. බෝසතාණන් වහන්සේ කෙනෙක් වුනත් පාරමිතා පුරන මුල් කාලයේදී කරපු පාප කර්මයකින් යම ලොවට ගියොත්, සමහර වෙලාවට දෘෂ්ඨියේ දැඩි බලවත්කම නිසා සමාව ගැනීමක් හෝ කරපු පින් සිහි කිරීමක් නොකර හිටියොත් ඒ හේතුවෙන් අපායට යන්න වෙනවා. කොහොම හරි **සංසාරයේ තියෙන භයානකත්වය මේ කාරණාවලින් තේරුම් ගන්න ඕන.**

අනෙක් කාරණය තමයි මේ **යම ලෝකයෙන් දෙන දඬුවම් ක්‍රියාත්මක වෙන්නේ නිරයෙන් පහල අපායවල්වලට විතරයි.** මොකද නිරයේ උප්පත්තිය හිමි කෙනාට තිරිසන් සතුන්ට වගේ ස්වභාවික විපත් එන්න විදියක් නෑ. මොකද නිරය කියන්නේ විපත් කරන තැනක්. මෙතනදී ස්වභාවික කියන එක මෙහෙම තේරුම් ගන්න ඕන. යම් කිසි කාලයක වැහි නැතිව තිබිල විසාල ගං වතුරක් එන එකත්, තවත් කාලෙක වැස්ස තිබිල මහා ඉඩෝරයක් එන එකත් ආදී මේ වගේ දේවල් ස්වභාවික විපත්. නමුත් යම් තැනක ගින්නක් හෝ උණු ලෝදිය හෝ එවැනි විනාසකාරී දෙයක් වෙනස් නොවී දිගටම තිබෙනම් එයින් ලැබෙන්නේ ස්වභාවික විපතක් නෙවෙයි. මේ නිසා නිරයේ තියෙන්නේ ස්වභාවික විපත් නෙවෙයි.

තමන් අනුන්ට හිංගි හිංසා කරපු එක එක් කාරණයක්. එහෙම දෙයක් කළාම ඒ ජාතියේ ක්‍රියාවකින්ම විපාකය එන්න ඕන. උදාහරණ විදියට තමන් අනුන්ට පිහියෙන් ඇන්නොත් ඒ ජාතියේ විපාකයකින් තමන්ටත් ඒක විඳින්න වෙන්න ඕන. තමන් මත් වුනා. මත්වෙලා ඇන්නා. දැන් ඉතින් තමනුත් මත් වෙන්න ඕන. අනුන්ව මත් කෙරෙව්ව නම් එහෙම එකකට තමන්ටත් අනුන්ගෙන් එකක් එනවා. අනුන් නැතිව තමන් තමන්ටම හිංගි කරගන්න පුළුවන්. ඒවගේ අය ස්වභාවිකව විඳවන්න තිරිසන් වෙනවා මිසක් නිරයට යන්න බලවත් වෙන්නෙ නෑ. මේ නිසා ඒ වගේ අයට හිංගි හිංසා කරන්න අනිත් අයගේ උදව් අවශ්‍ය නෑ. ඒ වගේම සතුන් මරන්න අනුබල දීම, වර්ණනා කිරීම වගේ දේවල්වලින් ප්‍රවෘත්ති විපාක ලබන්න පුළුවන් ක්‍රමත් තියෙනවා. එතකොට නිරයට නෙවෙයි ඊට සුදුසු ප්‍රදේශයක තිරිසන් සතුන් වෙලා උපදින්න පුළුවන්. නමුත් පිරිසක් එකතු වෙලා කෙනෙක් අල්ලගෙන ගිහින් බේරෙන්න අවස්ථාවක් පවා නොදී කොටු කරල මරනවා. එතකොට ඒ හේතුවෙන් ඒ පිරිසටත් තවත් පිරිසක් එකතු වෙලා දෙන, ඒ විදියේ මරන දුකක් එන්න ඕන. මේ නිසා එහෙම අය නිකන්ම මැරෙන්නෙ නෑ. මොකද හේතුවට අනුකූලයි ඵලය. මේ නිසා එකට දහස් වාරයක් දඬුවම් ලැබෙන නිරයේ උපදින්න හේතු වෙනවා. නමුත් තිරිසන් ලෝකෙදි එහෙම මැරෙන්නෙ නෑ. මැරෙන්නෙ එක සැරයයි. එතනින් ඒ වේදනාව ඉවරයි. නමුත් නිරයට යන්න හේතු සකස් කරගත්තු අයට දඬුවම් විඳින්න ඊට වඩා වැඩි ක්‍රමයක් යෙදෙනවා. මැරි මැරි උපදිනවයි කියන්නෙ මේකට තමයි. **සතෙක් කන්න මැරුවොත් ඒ මරපු කෙනාත් මස් දෙන්නම සතෙක් වෙලා උපදින්න ඕන. හැබැයි වෛරයෙන්, ක්‍රෝධයෙන් තරහට පලිගන්න මැරුවොත් පටිසන්ධි විපාකය බලවත් නම් ඒ ජාතියේම මරන තැනක උපදින්න ක්‍රමයක් යෙදෙනවා. එතැන ලැබෙන දඬුවම් ඊට වඩා සිය දහස් වාරයක් වැඩියි.**

ඊළඟ කාරණය තමයි මේ **යම ලෝකයට ඇදගෙන යන්නේ මනුස්ස ගන්ධබ්බයින් විතරයි.** හරකෙක්, බල්ලෙක් වගේ සත්ව ගන්ධබ්බයින් යම ලෝකයට ඇදගෙන ගිහින් ප්‍රශ්න කරපු අවස්ථා අහන්න දකින්න ලැබිල නෑ. අපායේ ඉන්න තරමක් ඉන්නේ මනුස්ස ස්වරූපයෙන්ම ඉන්න අය. තිරිසන් වෙලා ඉඳල නැවතත් පහළ අපායක ගිහින් උපදින්න පුළුවන් කියල ධර්මයේ පෙන්නුවත් ඒ උපදින්නේ මනුස්ස ස්වරූපයකින්. ඒ කියන්නේ **තිරිසන් සතෙක් වුනත් මැරිල නිරයට යනව නම් මනුස්ස ගන්ධබ්බ ස්වරූපයකින් තමයි යන්නේ. මොකද මේ වගේ නිරයට යන්න හේතුවන දරුණු ගණයේ පව් කරන්න තිරිසන් සතුන්ට බෑ. ඒකට මනුස්සයෙක් වෙලා කරපු දරුණු පාපයක්ම යෙදෙන්න ඕන.** ඒ වගේ වෙලාවකදී ඒ සතාට කර්ම නිමිත්තක් ගති නිමිත්තක් එනවා. එහෙම එනව නම් එන්නේ මනුස්ස වෙලා හිටපු කාලයකදී කරපු පාපයකින් තමයි. ඒකෙන් තමයි ගති රුව නැගෙන්නේ. ඒ ගති රුවෙන් අපායට යනවා. මේ නිසා තිරිසනෙක් වෙලා කරපු පාපයට විපාක ලැබුනත්, නිමිත්තක් එනකොට පෙර කරපු නිරයට හේතුවන කර්මයට අනුව සිහිය එනවා. එතකොට යන්නේ මිනිස් ස්වරූපයෙන්. නේරෙක සත්තු (නිරි සත්තු) කියන්නේ නිරයේ උපන් මනුස්සයින් ගැනයි. දැන් ඉතින් නඩු අහල **විනිශ්චයක් දෙන්න නම් අහන දේවල් තේරෙන්න ඕන. නමුත් තිරිසනුන්ට හොඳ නරකක් තේරුම් ගන්න පුළුවන් මානසිකත්වයක් නෑ. මේ නිසා තේරුම් කරල දෙන්න පුළුවන් අවස්ථාව තමයි මනුස්ස කියන්නේ.** ඒනිසා මනුස්ස ස්වරූපයකින්මයි නිරයට යන්නේ.

හැබැයි නිරයෙන් මිදෙන කොට නම් පොලොවෙන් මෙරු මතුවෙනව වගේ විවිධාකාර සත්ව ස්වභාවයන් ගන්ධබ්බ සිරුරුවලින් මතු වෙනවා. මොකද එතකොට නිරයට හිමි විපාකය විඳල ඉවරයි. මේ නිසා ඌරු, බලු, බළල්, හරක් ආදී විවිධ සත්ව ගන්ධබ්බයින් පොළෝ කුහරයෙන් මනුස්ස ලෝකයට එනවා. මොකද අපි අපායට පින් දුන්නම ඊට හිමිකම් කියන සත්වයින්, කර්ම ශක්තිය ගෙවිල ඉවර වෙච්ච අපේම ☞

ඥාති මිත්‍රාදී කොටස් ඒ නිරයේ ඉන්නවා. ඒ අයට ඒක ගැලවෙන්න අවස්ථාවක් වෙනවා. මෙහෙම පොළොව මතුපිටට එන කොට වැඩිපුරම එන්නේ සත්ව ගන්ධබ්බයින්. **මැරෙන බහුතරය සතර අපාගත වෙනවයි කියන කාරණය මෙතනදීත් ඔප්පු වෙනවා.** මනුස්ස ගන්ධබ්බයිනුත් ටිකක් එනවා. ඒ අතර යක්ෂ ප්‍රේත කොටස්වලට යන සත්තුත් ඉන්නවා. බොහොම කලාතුරකින් වගේ දෙවියො වෙලත් එනවා. ඒ අයට ගන්ධබ්බ අවස්ථාවක් නෑ. බැලුම් එකක් වගෙයි කෙලින්ම ඇදිල දේව ලෝකයට යනවා. මේ වගේ සිද්ධි දිවැස් සමාධි වඩපු අයට ඉතා පහසුවෙන් ගෝචර වෙනවා. පින් අනුමෝදන් කරන අවස්ථාවලදී ඒ වගේ සිද්ධි ඕන තරම් අහුවෙනවා.

දැන් කෙනෙකුට කියන්න පුළුවන් මේ කාරණා මනසින් මවා ගත් මනෝ විකාර කියල. නමුත් ස්වභාවයේ සිද්ධ නොවෙන දෙයක් නම් මවන්න බෑ. ඒ නිසා මවල බලන මානසිකත්වයක් නෙවෙයි මේ කියන්නේ. ඇත්තටම වෙන සිද්ධිය පේනවා එච්චරයි. අපි නොහිතන දේවල් තමයි පේන්නේ. අහවල් සතා එනවයි කියල එහෙම පූර්ව නිගමනය කරන්න බෑ. පොළොවෙන් මතුපිටට එනකල්ම මොකෙක්ද කියල දන්නෙ නෑ. සමහර වෙලාවට තමන්ට ඕන එකක් මවාගන්න උත්සාහ කළාට එහෙම මවන්න බෑ. උදාහරණයක් විදියට තමන්ට හිතුනොත් නරක තැනක බුදු රුවක් මවන්න ඒක වෙන්නෙ නෑ. නරක තැන වෙනමත් බුදුරුව වෙනමත් මවන්න පුළුවන්. නමුත් දෙක එකට මවන්න බෑ. ඒ කියන්නේ **ධර්මානුකූල නොවෙන දෙයක් මවන්න බෑ.**

තවත් උදාහරණයක් ගත්තොත් තමන්ගේ තරහකාරයෙක් බල්ලෙක් කරල යවන්න ඕන කියල හිතුවට ඒක වෙන්නෙ නෑ. නමුත් තමන්ට බල්ලෙක් මවන්න පුළුවන්. ඒත් අර තරහකාරයා බල්ලෙක් කරන්න බෑ. ඒ තරහකරයා වුනත් බල්ලෙක් වෙන්න හේතු තියේ නම් බල්ලෙක් වෙන එක වෙනම කාරණයක්. නමුත් තමන්ගේ අවශ්‍යතාවයට ඒක කරන්න බෑ. හැබැයි සර්කස්කාරයෙක් මාරක ලිඳක බයිසිකලයක් පදින දර්ශනයක් හරි පිනුම් ගහන දර්ශනයක් හරි මවන්න පුළුවන්. මොකද ඒක ස්වභාවිකව සිද්ධවෙන දෙයක්. නමුත් උපාසක මහත්තයෙක් ඔළුවෙන් හිටගෙන ඉන්න දර්ශනයක් මවන්න හැදුවට බෑ. යමක් නොගැලපෙනව නම් ඒක මවන්න බෑ. මේ වගේ කෙනෙකුට විපතක් වෙන කාරණයක් දිවැස් සමාධි තියෙන කෙනෙකුට වේලාසනින් බලන්න පුළුවන්. ඒ පුද්ගලයා හදිසි අනතුරකට පත්වෙනවයි කියලත් පේන්න පුළුවන්. නමුත් ඒ අනතුර වෙනත් කෙනෙකුට සිද්ධවෙන සිද්ධියක් මවල බලන්න බෑ. මේ විදියට මැවුම් විද්‍යාවේත් ක්‍රම වේදයක් තියෙනවා. එනම් ධර්මානුකූලව සිද්ධ නොවෙන දෙයක් මවන්න හැදුවට බෑ. නැට්ටුවෙක් නටනව මැව්වට බුදු කෙනෙක්, රහතන් වහන්සේ කෙනෙක් නටනව මවන්න බෑ. මේ නිසා මවන දෙයක්ද, ස්වභාවිකව පවතින දෙයක්ද කියල බලාගන්න එහෙම දෙයක් මවල වෙනස් කරන්න උත්සාහ කරන කොට දැනගන්න පුළුවන්. හැබැයි ඒක කරන්න පුළුවන් වෙන්නෙත් ඒ වගේ මැවුම් විද්‍යාව දන්න කෙනෙකුට විතරයි. ඒකෙන් පේනවා **අපේ මනසේ තියෙන අපට ඕන දෙයක් මවනවා කියන කාරණය සිද්ධ වෙන්නෙ නැති බව. මේනිසා මැවීමත් ධර්මතාවයෙන් පාලනය වෙනවා.**

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

17 වෙනි පිටුවෙන්..

# දුර්ලභ ගණයේ සමාධිමය ප්‍රතිකර්මයකට...

පටන් ගත්තා. නමුත් ඒ ළමය මෙහෙම කියනවා. ''මට කැක්කුම නෑ, මට ඒකෙ කිසි අවිස්වාසයක් නෑ, තුවාලය වැඩිවෙන්නෙ නැති බව මට තේරෙනව, මේ තුවාල පොත්ත ලොකු වුනාට ඇඟ ඇතුලෙ අමාරුවක් නැති බව මට දැනෙනවා''. මෙහෙම කිය කියා උදේ හවස බෙහෙත් කරනවා. ඒක දවස් හතරකින් සනීප කරගන්න තෙල් අවුන්ස එකහමාරක් හොඳටම ඇතිවුනා. දින හතරකට පස්සෙ ළමයගෙ තාත්ත අහනව, මොකක්ද මේ කොලපොතක් වගේ ගෙයි සාලෙ වැටිල තියෙන්නෙ කියල. බලන කොට අර ළමයගෙ කකුලෙ තිබ්ච්ච තුවාල පොත්ත. පුවක් ගහක කොලපොතක් වගේ ඒ තරම් විශාලයි. දැන් තුවාලය තිබ්ච්ච තැන එහෙම එකක් තිබුනයි කියල සුදු පාටට පේනවා. නමුත් තුවාලය හොඳවෙලා ඉස්ම ගලන ඒවා මොකුත් නෑ. ඒකෙන්ම ඇගේ තිබ්ච්ච විසත් ඉවරයි. හය මාසයක් විද්ද බෙහෙත එයින්ම නතර වුනා. නැවතත් බෙහෙත් කරන්න ඕන වුනේ නෑ.

දැන් අර ලොකු වෙද මහත්තය බලල මෙහෙම කියනවා. ''විස පොඩ්ඩක්වත් නෑ. තෙල් බේත් ගගා ඉන්න ගියා නම් මොකක් වෙයිද? මම ඒක තමයි කිව්වෙ නොදන්න බෙහෙත් කරන්න යන්න එපා කියල". මේ විදිහට මහ පණ්ඩිත කථාවකුත් කිව්වලු. දැන් මේ ළමයගෙ තාත්ත එළියට බැහැල කියනව, මේ වෙදා නම් පුදුම වෙදෙක්! මහ කපටි කමක්නෙ කළේ! මහ නිග්‍රහයක් කළා මිසක් යථාර්ථයක් දැකල නෙවෙයිනෙ කථා කළේ, අපට දැන්නෙ තේරෙන්නෙ කියල. ඊට පස්සෙ ඇගේ තාත්ත මං එක්ක කියනව, මට මේක දැන්මම ගිහිල්ල ඒ වෙදාට කියල එන්න තරම් හිතෙනව කියල. මම කිව්ව, කියන්න එපා ඒ වෙද මහත්තය හරි දරුණුයි, එහෙම කිව්වොත් ඔයිට වඩා වෙන පැත්තකට යන්න පුළුවන්, නැවත බේතක්වත් එතනින් ගන්න බලාපොරොත්තු වෙන්න එපා කියල. ඒකෙ භයානකත්වය මම දැනගෙන හිටපු නිසාම තමයි අර වෙදකම කරන අතර කාලයේ මේ තෙල් ගැනවත්, මං ගැනවත් අඟවන්න එපා කිව්වෙ. කොහොම හරි මේ දීපු තෙලේ බලයෙන් මෙච්චර දරුණු ලෙඩක් සනීප වුනාට, දැන් අර ලොකු වෙද මහත්තය රැවටීමෙන් හිතන් ඉන්නෙ, මේ අයව රැවටිලා තමන්ගේ ඒ වෙදකමින් සනීප වුනා කියල. වෙදකම වුනත් ලාභ, කීර්ති, ප්‍රසංසාවලට මොනතරම් පහත් තත්වයට ඇද වැටිලද කියන එක මේ වගේ සිද්ධිවලින් පේනවා.

දැන් මේ තෙල බොහොම දුර්ලභ ගණයේ සුවිශේෂිය තෙලක්. නමුත් ඒක එහෙම ආවට ගියාට හිඳගන්න පුළුවන් කමක් නෑ. ඒකට ඕන කරන අමුද්‍රව්‍ය හොයාගන්නත් මහන්සි වෙන්න වෙනවා. ඔක්කොටම වඩා මේ තෙල හිඳගන්න එක මහ සංකීර්ණ ක්‍රියාවලියක්. සෑහෙන කාල වේලාවක් ඒකට ගතවෙනවා. බොහොම ඉවසිලිවන්තව ක්‍රමානුකූලව කරගත යුතු දෙයක්. ඒක හැමෝටම කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. තෙල් හිඳල යම්කිසි අත්දැකීමක් තියෙන්න ඕන. හැබැයි මෙහෙම කිව්වට අධෛර්යමත් වෙන්න එපා. ඒක හිඳ ගන්න ක්‍රමය එකපාරටම මේ වගේ ලිපියකින් කියන්න බෑ. පොඩ්ඩක්වත් වරදින්නෙ නැතිව කිසිම ගැටලුකාරී තත්ත්වයක් ඇති නොවෙන විදිහට හරියටම දෙන්න ඕන. මේ නිසා ඒ තෙල හිඳගන්නා ආකාරය ඉදිරි කලාපයෙන් බලාපොරොත්තු වෙන්න.

**සටහන**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# මෙසේ වූ සිව්පසය වැළඳීමට වඩා ගිනි අඟුරු ගිලීම හොඳයි

\- (බුදු පියාණන් වහන්සේ)

**2 වන කොටස**

යම් ශ්‍රද්ධාවන්තයෙක් තම ශක්ති ප්‍රමාණයෙන් රසමුසු භෝජන සහිතව ප්‍රනීතව සකස්කර දෙන දානය, හරිම රසයි හරිම රසයි කිය කියා අසීමිතව බඩ පුරවා ගන්න වළඳනවද, ඒ දානය රස පිණිස කය හැඩ වැඩ කරගන්න, හම පාට වෙන්න හිතාගෙන, ලස්සන වෙන්න හිතාගෙන, කාම ජවය වැඩෙන්න හිතාගෙන ගන්නවද, මේ ජාතිය මෘදුයි, මේ ජාතිය රසයි කිය කියා මේ සිව්පසය ගන්නවද, නිවන් දකීම පැත්තක තියල මේ බුද්ධ සාසනය වෙනුවෙන් තමන්ට සිව් පසය නොවැරදී ලැබෙන කොට, මේ ප්‍රනීත ආහාරය රස පිණිස, හැඩ වැඩ පිණිස, කාම සම්භෝගය පිණිස, කාම ජවය වඩා ගන්න හිතේ තියාගෙන යම් භික්ෂුවක් මේ දානය ගන්නවද, අන්න ඒ විදියට සාසනයට, විනයට, ධර්මයට නොගැලපෙන චරියාවෙන් සම්බුද්ධ සාසනය කිලිටි කරමින්, පිළිවෙත් නොපුරන මෙන්ම ස්ත්‍රී පහස විඳින ඒ අලජ්ජී (ලැජ්ජා නැති) භික්ෂුන්ට කළ අවවාදයක් මේ අග්ගික්ඛන්ධෝපම සූත්‍රයේ මෙසේ පෙන්වා තියෙනවා.



''මහණෙනි, දැල්වුණ, මනාව ගිනිගත් දැල්ලෙන් බබලන, අර මහා ගිනි කඳ දැක්කහුද? එසේය ස්වාමීනි. මහණෙනි, කුමක් සිතන්නහුද? අර දැල්වුණ, මනාව ගිනිගත් දැල්ලෙන් බබලන, මහත් වූ ගිනි කඳ වැළඳගෙන හිඳගන්නේ නම් හෝ නිදන්නේ නම් හෝ යම් ඒ මෘදු වූ, තරුණ වූ, අත් පා ඇති ක්‍ෂත්‍රිය කන්‍යාවක් හෝ බ්‍රාහ්මණ කන්‍යාවක් හෝ ගෘහපති කන්‍යාවක් හෝ වැළඳගෙන හිඳ ගන්නේ නම් හෝ නිදන්නේ නම් හෝ මේ දෙකින් කුමක් උතුම් වේද?"

මහණෙනි, යුස්මතුන්ට දන්වමි, ප්‍රකාශ කරමි. (ආයු+උස්ම-ආයුස්ම-ආයුස්මතා-යුස්මතා-එනම් කර්මජ තේජෝ ධාතුව හෙවත් ආයුස පවතින කල්, මරණාසන්න අන්තිම මොහොත දක්වාම) දුශ්ශීල වූ, පාප ධර්ම ඇති, කැත කුණුවලින් පිරි කසල ගොඩක් හා සමාන වූ, සැඟවී වැරදි වැඩ කරන, ශ්‍රමණ යැයි අඟවන අශ්‍රමණ වූ, බ්‍රහ්මචාරී යැයි අඟවන බ්‍රහ්මචාරී නොවූ, ඇතුළත කුණු වූ, වැගිරෙන, කසල හටගත්, ඒ දුසිල් මහණහුට ඒ ගිනි කඳ වැළඳ ගැනීම මැනවි. එයට හේතු කවරේද? ඒ හේතු කොට ගෙන ඔහුට මරණය හෝ ඒ සමාන දුකක් හෝ වන්නේය. ඒ හේතුවෙන් කායයාගේ බිඳීමෙන්, මරණින් මතු, සැපයෙන් තොර වූ, අයහපත් ගති ඇති නරකයෙහි නූපදනේය."

මෙසේ මේ සාසනයේ යම් භික්ෂුවක් මේ ලැබෙන දානය අරිහත්වය පූර්ණ කරගන්නා තෙක්, තමන්ගේ ජීවිතය ක්ලාන්ත කැරකිලි නැතිව වෙහෙස වේදනා දුරු කරගෙන නිවනට උපනිශ්‍රය පිණිස පවත්වාගන්න පමණක් පරිභෝග කරනවා කියන ප්‍රත්‍යවේක්‍ෂාවෙන් වළඳන්නෙ නැතිව, සාසනයට නොගැලපෙන විදියට රස පිණිස, හැඩ වැඩ පිණිස, කාම සම්භෝගයන් පිණිස, කාම ජවය වඩාගන්න, අසීමිතව බඩ පුරවා ගන්න, පස්සෙ වලඳන්න රැස්කර තබාගන්න මේ දානය ගන්නවද, පංචේන්ද්‍රියන් පිනවන අදහසින් කාම සම්භෝගය සඳහා හිත තියාගෙන ස්ත්‍රී පරිහරණයේ පහස ලබමින් මේ දානය පරිභෝග කරනවද, අන්න ඒ අයට තදින් අවවාදයක් කර, මින් මතු එවන් සාසනය කෙලෙසන දේවල් නොකරන ලෙස බුදුන් වහන්සේ දේශනා කළා.

මේ සැදැහැවතුන් සාසනය උදෙසා දෙන ඒ සිව්පසය පරිභෝග කරමින්, අග්නික්ඛන්දෝපම සූත්‍රයේ පෙන්වා වදාල ආකාරයෙන් සාසනයට නොගැලපෙන, ස්ත්‍රී සම්භෝග සහිත වූ අලජ්ජී වැඩ කරමින් මහා නරකයේ පැසෙන්න සිදුවන මහා පාප කර්ම රැස්කරගෙන ඉන්නවා මදිවට, එවන් කෙනෙක් තවදුරටත් මේ සාසනේ රැඳෙමින් ඒ අලජ්ජී වැඩේම කරගෙන කල්ප කෝටි ප්‍රකෝටියකින්වත් ගොඩ එන්න බැරි අපා දුකකට වැටෙන්න තව තවත් පාප කර්ම රැස් කරගන්නවද, මේ සා බරපතල මහා පාපකර්ම, මේ සාසනේ රැඳෙමින් තව තවත් රැස්කරගන්නවාට වඩා අර ගිනිගෙන දැවෙන ගිනි අඟුරු ගිලින එක වඩා හොඳයි. එහෙම ගිනි අඟුරු ගිලපු කෙනෙක් දැන් ඒකෙන්ම මියැදුනොත් එයින් ඔහුට හෝ සාසනයට කිසිම අයහපතක් සිද්ධ වෙන්නෙ නෑ කියල දේශනා කළා.

මේ බුද්ධ දේශනාව කන වැකෙන්න වැකෙන්න අර වගේ අධම, දුස්සීල, කාමුක කටයුතු ඇති, සැදැහැවතුන්ගේ ගරු සත්කාර වැඳුම් පිදුම් ලබන දුසිල්වත් අයට දෙකොනම රත්වෙන්න පටන් ගත්තා. ඒ වැරදි කරමින් හිටපු අය මහා භයකින් වෙව්ලන්න පටන් ගත්තා. කිසිම විදියකින් සමාවක් ලබන්න බැරි විදියට සාසනයට වැරදි කර පාරාජික වූ, අපාගත වෙන පාප කර්මයක් කරගෙන ඇති බව වැටහෙන්න පටන් ගත්තා. මේ විදියට ඒ දේශනය අහල බයෙන් සන්ත්‍රාසයෙන් ඇළලී ගිය භික්ෂුන් හැට නමක් මහා ගිනි දාහයකින් දැවෙමින් ලේ වමනය කර මිය ගිය බවත් ඒ සූත්‍ර දේශනාවේ සඳහන් වෙනවා. ☞

ඒ වගේම තවත් දැඩි අවවාදයක් උන්වහන්සේ ඒ දුසිල් භික්ෂූන්ට සිවුපසය මුල් කරගෙනම සිද්ධ කළා. මේ ලිපිය ලියන මටත් ඒ කරුණු මෙසේ වැටහෙනවා. මේ සැදැහැවත් උපාසක උපාසිකාවන් මේ බුද්ධ සාසනය උදෙසා දෙන පිණ්ඩපාතයට අමතරව, තමන්ගේ අඹුදරුවන්ගේ වස්ත්‍ර සඳහා අමාරුවෙන් සපයාගත් රෙදිකඩ පවා තම වස්ත්‍ර උවමනාව දෙවෙනි කර භික්ෂූන් වහන්සේලාගේ චීවරය සඳහා දන් දෙනවා. මේ ආකාරයට බුදු සසුන වෙනුවෙන් සැදැහැවතුන්ගෙන් ලැබෙන රෙදි කැබැල්ලෙන් සකස්වෙන ඒ චීවරය දඬමීමා කරගෙන යමෙක් ස්ත්‍රී පරිහරණය කරමින් ලාභ, කීර්ති, ප්‍රසංසා ලබාගැනීම සඳහා සිවුරේ සාසන දිස්නය අලෙවි කරනවද, අන්න ඒ අයටයි බුදු පියාණන් වහන්සේ පෙන්වා දුන් මේ අනතුරු ඇඟවීම.

එහෙම විෂම චරියා රටා ඇති යමෙක් මේ සාසනය බබලවන්න තියෙන චීවරය පොරවගෙන, ගෙවා නිම කරන්න බැරි මහා පාප කර්ම වැලක් මේ සාසනයට ඇතුල් වෙලා කරගන්නවද, අඥ්ඥාන වූ ඒ පිරිස් දූන දූනම, ඉහත බුදු පියාණන් වහන්සේ දේශනා කර ඇති අයුරු බලවත් ධර්ම විරෝධී, විනය විරෝධී අපාගතවෙන අකුසල්මයි කරගන්නෙ. ඒ නිසා මේවා පොරවගෙන **තවදුරටත් සාසනය දුගඳ ගස්සන කටයුතු කරමින් ඉන්නවට වඩා, ඒ සිවුරු පිරිකර බහා තබා අර සතර අත විහිදෙන මහා ගිනිදැල් පොරව ගන්න එක වඩා හොඳයි කියල දේශනා කළා. ඒ ගිනි දැලෙන් මේ මොහොතේම මියගියත්, මේ සාසනේ ඉඳගෙන තව තවත් පව් රැස් කරගන්නවට වඩා ඒ මරණය දෙලොවටම වැඩදායකයි කියල** මහා බරපතල අවවාදයක් උන්වහන්සේ කරනවා. මේ අවවාදය කරල තියෙන්නේ, ඒ අවස්ථාවේ හිටපු අයට පමණක් නෙවෙයි, නිවන් බලාපොරොත්තුවෙන් සැදැහැවෙන් සාසනයට ඇතුල්වන සියලු දෙනාගේත් දූන ගැනීම සඳහා බව පැහැදිලියි.

**මේ ආකාරයෙන් අයුතු විදියට සාසනය පරිහරණය කිරීමට වඩා දූන් දූන්ම චීවරයෙන් සමුගැනීම හෝ මරණය ළඟා කරගැනීම යහපත් වන බවයි** ඒ භික්ෂූන්ට උන්වහන්සේ දේශනා කළේ. එසේ සාසනයෙන් ඉවත්වීමෙන් යහපතක් වෙන්නෙ කොහොමද? මෙතෙක් කරගත් අකුසල් ගොඩෙන් සමහරවිට සතර අපායේ අසුරයෙක් වෙලා ඉපදිලා දුක් විඳින්නයි සැහුනේ. නමුත් තවදුරටත් මේ විදියට සාසනේ රැඳිල කාම මඩ තැවරෙන මහා පාප කර්ම රැස් කරගෙන ගියානම්, ලෝකුඹු නරකයේ කල්ප කෝටි ගාණක් පැහෙන්නයි තිබුනෙ. නමුත් යමෙක් ඒ අවවාදය පරිදි මෙසේ ගිනි අඟුරු ගිලල මියගියොත් ඒ මහා දුක් සහගත අපාගතවීම වැලකිලා අල්ප දුකකටයි වැටෙන්නෙ. මොකද මේ නිසා මහා අකුසල් නැවත නැවත ඉපදවීම නවතින නිසා මේ මරණයෙන් ඒ අයට අයහපතක් නොව යහපතක්මයි වෙන්නෙ. ඒ නිසා මේ සාසනේට කරන වැරදිවලින් පව් පුරවා ගන්නවට වඩා ඒ ගිනිදැල් පොරවගෙන මියයාමෙන් සාසනේටත්, තමන්ටත් යහපතක් සිදුවන බව වටහා ගන්න පුළුවන්.

මේ දේශනාව අවසානයේ තවත් බොහෝ පිරිසක් තමන් කරමින් සිටි සාසන විරෝධී, විනය විරෝධී ක්‍රියා නිසා බයෙන් සන්ත්‍රාසයෙන් ඇළලී, තවදුරටත් සාසනයේ ඉන්න හිත හදාගන්න බැරිව සිවුරු හැර ගිය බවත් ඒ සූත්‍ර දේශනාවේ සඳහන් වෙනවා.

නමුත් හැට නමක් මියගිය කාරණයත්, බොහෝ පිරිසකට සිවුරු හැර යන්න සිදුවීමත්, බොහෝ පිරිසක් මෙයින් අරිහත්වය පූර්ණ කරගත්තා කියන මේ කාරණාවලින් කාටත් යහපත් ප්‍රතිඵලයක්ම මිසක් අයහපතක් සිද්ධ වෙලා නෑ කියන්න පුළුවන් වෙන්නෙ, මේ විදියට එහි සැඟවුන අරුත පැහැදිලි කළොත් විතරයි. මේ විදියට කාරණය පහදල ඒ පෘතජ්ජන පැනයට උත්තරයක් නොදුන්නොත් ඔවුන් නිරපරාදේ ආර්ය උපවාදයක් කරගන්නවා.

මේ අග්ගික්ඛන්ධෝපම සූත්‍රය දේශනා කිරීමෙන් පසු සිදු වූ විස්තර කතාව "මනෝ රථ පූරණී" නම් වූ අට්ට කතාවේ ඒකක නිපාත වර්ණාවේ (මනෝරථ පූරණී - 1 පොත - 54, 55 පිටු) මෙසේ සඳහන් වෙනවා.

මේ දේශනාව ඇසූ දේවතාවෝද, නොඇසූ භික්ෂූන්ටද ඇසෙන්න සලස්වමින් හැසිරුණාහ. බොහෝ භික්ෂූහු භවත්නි, බුදු සසුනෙහි දිවි ඇති තෙක් පිරිපුන් පිරිසිදු බ්‍රහ්ම චරියාව රැකීම දුෂ්කර යැයි එකෙනෙහි භික්ෂූන් දස දෙනෙක්, විසි දෙනෙක්, සැට දෙනෙක්, සිය දෙනෙක්, දහස් දෙනෙක් සිවුරු හැර ගිහි වෙත්. භාග්‍යවතුන් වහන්සේ කැමති තාක් ගම්දනව් සැරිසරා යලි දෙව්රමට අවුත් භික්ෂූන් අමතා මහණෙනි, තථාගත තෙමේ චාරිකාවෙහි හැසිරෙමින් බොහෝ කලක් බොහෝ දෙනාගෙන් ගැවසී ගන්නා (ගැවසුනා) ලදුව විසීය. මම අඩ මසක් විවේක ගැනීමට කැමැත්තෙමි. පිණ්ඩපාතය ගෙන එන්නෙකු හැර අන් කිසිවෙක් නොඑළඹිය යුත්තේ වෙමියි වදාල සේක. අඩ මසක් හුදකලාවෙහි කල් ගෙවා විවේක සුවයෙන් නැගී සිටියේ අනඳ තෙරුන් සමග විහාර චාරිකාවෙහි හැසිරෙන්නේ බැලූ බැලූ තැන්හි අඩු වූ භික්ෂූ සංඝයා දැක කරුණු දන්නේම ආනන්දය, අන් කල්හි තථාගතයන් චාරිකාවෙහි වැස (වාසය කර) දෙව්රමට ආ කළ සියලු විහාරය කසාවතින් බබලන්නේ භික් සඟණ පැහැස හමන සුළඟින් පිරිපුන් වූයේ වෙයි. දැන් වනාහි තුනී වී ගිය භික්ෂූන් දක්නට ලැබේ. භික්ෂූන් බෙහෙවින් සුදුමැලි වූවාහුය. මේ කිමෙක්දැයි ආනන්ද තෙරුන් විචාලේය.

භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අග්ගික්ඛන්ධෝපම සූත්‍රය දෙසන ලද කාලයේ සිට භික්ෂූන් සංවේගයට පැමිණියාහු වී අපි මේ ධර්මය සර්වප්‍රකාරයෙන් පුරන්න නොහැක්කෝ වෙමු. නොමනාව පවතින්නවුන්ට ජනයාගෙන් සැදැහැයෙන් දෙන ලද්ද පරිබෝග කරන්න නුසුදුසු යැයි ගිහි බවට හැරෙතැයි තෙරුන් වහන්සේ පැවසූ සේක. එකෙනෙහි භාග්‍යවතුන් වහන්සේට ධර්ම සංවේගය පහළ විය. එහෙයින් තෙරුන් වහන්සේට, මා විවේකයෙන් වසන කල්හි කිසිවෙක් මගේ පුතුන්ට එක් අස්වැසිල්ලකදු නොකීවේද? සයුරට බස්නා තොටුපලවල් මෙන් මේ සසුනෙහි අස්වැසීමට කරුණු බොහෝ වෙයි. ආනන්දය යන්න ගඳ කිලි පිරිවෙනෙහි බුද්ධ සාසනය පනවා භික්ෂූ සංඝයා රැස්කර වන්නැයි වදාල සේක. තෙරහු එසේ කළහ. සාස්තෘන් වහන්සේ උතුම් බුද්ධ ආසන ගත වූ සේක් භික්ෂූන් අමතා මහණෙනි, මෛත්‍රියේ සියල්ලෙන් මුල් කොටස අර්පනාවද (ධ්‍යානය) නොව උපචාරයද නොව සත්ත්වයන්ට හිතවත්තාවය පැතිරීම පමණියි වදාරා මේ අර්ථෝත්පත්තියෙහි මේ <u>චුල්ලච්චරා සංඝාත සූත්‍රය</u> වදාළ සේක. (සිවුරු හැරීමට ප්‍රතිකර්ම ලෙස)

අච්චරා සංඝාත මත්තං කියන්නේ අසුරු සැනක්. (ඇඟිලි පොලන මොහොතක්) මෙවන් මොහොතක් වඩන භාවනා 182 ක් අං.නි. (1) 80 පිටුවේ පටන් පෙන්වා තියෙනවා.

එය අර්ථ කතාව අනුව මෙන්ම ධර්මානුකූලව විමසා බලන විට

1. කාම මෛථුන ස්ත්‍රී සේවනය
2. දඬුවමට තරම් හේතු වන හොරකම (ප්‍රදේශය හා කාලය අනුව වෙනස් වේ)
3. මිනිස් ප්‍රාණියකුගේ දිවි තොර කිරීම හා කරවීම
4. නැති උත්තරී මනුෂ්‍ය ධර්ම (ධ්‍යාන මාර්ගඵල ආදිය) ඇතැයි කපටිකමට ලාභ බලාපොරොත්තුවෙන් හැඟවීම

**යන සතර පාරාජිකාවට (පරාජයට) පත්වීම උපසම්පදා භික්ෂුත්වය අහිමි වන බුද්ධ ආඥාවක්. එබඳු අයට පවා සිවුරු හැර ගිහිවෙලා ගිහි පිළිවෙතින්**

**සෝතාපන්න, සකෘදගාමී, අනාගාමී ඵල ලබන්න පුළුවන් බවයි ධර්ම කරුණු ලෙස සඳහන් වෙන්නේ. ඒ නිසා එබඳු අයටත් ඒකාන්ත අපායගාමීන් ලෙස හංවඩු ගැසීම සුදුසු නෑ. ගිහි වේවා, පැවිදි වේවා, එසේ ඒකාන්ත අපාගත වන්නේ පංචානන්තරීය පාප කර්ම කරපු අයයි.**

මහා කාරුණික වූ තථාගතයන් වහන්සේ භික්ෂූන්ගේ අස්ථාන බිය දුරු කරමින් පහත සඳහන් පිළිවෙත් භාවනා ක්‍රම විශාල ප්‍රමාණයක් පෙන්වා දෙමින්, අසුරු සැනක් මේ භාවනා වඩන භික්ෂුව නොහල (අත් නොහැරිය) දැහැන් ඇතිව සාස්තෘන් වහන්සේගේ අවවාද පිලිපදින්නෙක්ව, රට වැසියා දෙන පිණ්ඩපාතය නොසිස්ව (හිස් අතින් නොවී) ණය නැතිව වළඳන පිරිසක් බව පෙන්වා, ඉන් වැඩිමනත් ඔවුන් වඩන්නේ නම් කවර කතා දැයි භික්ෂූන් අස්වසා වදාළා. මේ විස්තර නොදත් සමහරු, අරිහත් වූ තෙරුන් වහන්සේලාගේ චර්යාවන් සියළු භික්ෂූන් වහන්සේලාගෙන් බලාපොරොත්තු වෙලා, සංඝයාට පහර ගහන අරමුණෙන් අග්ගික්ඛන්ධෝපම සූත්‍රය විස්තර කරන්න හෝ කරවන්න බලනවා. **ධර්මය දැනගත යුත්තේ හික්මෙන්න මිසක් අනිකෙකුට පහර ගහන්න නෙවෙයි.** එසේ නොවුනොත් සියුම් දූෂ්‍යතාවයක් මතුවෙලා, එබඳු පුද්ගල පිරිස් විශාල විනාශයකටත් පත්වෙලා, පන්දහසක් කල් නාම මාත්‍ර වශයෙන් හෝ පවතින සඟ සසුන දැන්මම අතුරුදහන් කරන්න කටයුතු කරන පිරිසක් වේවි. එහෙම වුණොත් බුදු වදන අනුව ඒ කාලයට සාංඝික දානයක් දෙන්න භික්ෂු නාමයක්වත් හොයාගන්න බැරි වේවි.

ඒ නිසා සතර පාරාජිකාවට පත් නොවී හැකි තරම් උත්සාහයෙන් වැරදිවලින්, පව් වැඩවලින් වෙන්වෙමින් බුදු රජුන් වදාල මේ භාවනාව වඩනවනම්, බුදු සසුන බබලන්න පටන් ගන්නවා. ඒ සඳහා මේ අච්චරා සංඝාත සූත්‍ර ක්‍රමය දේශනා කර ඇති ආකාරය ත්‍රිපිටක ධර්මය අනුව මෙසේ දැනගත යුතුයි.

මහණෙනි, ඉදින් මහණ ඇඟිලි පොලන තරම් කාලය කුදු ප්‍රථමධ්‍යානය වඩන්නේ නම් ඒ මහණ, නොහළ දැහැන් ඇතිව වසතියි කියනු ලැබේ. සාස්තෘ සාසනය කරන්නේ අවවාද පිළිපදින්නේ රට වැසියාගේ නොසිස් පිණ්ඩපාතය වළඳිතියි කියනු ලැබේ. යම් කෙනෙක් එය බහුල වශයෙන් කරන්නේ නම් කවර කතාද?

මේ සූත්‍රයේ කියපු ආකාරයෙන් මේ සෑම සූත්‍රයක්ම තේරුම් ගත යුතුයි. **මින් එක ක්‍රමයක් නමුත් අනුගමනය කරන භික්ෂුවකට යමෙක් ගැරහුවොත්, ඔහුට ආර්ය උපවාදය සිදුවිය හැකි නිසා සඟ ගුණ කෙරෙහි පැහැදීම, නිතර පුහුණුකර ගැනීම ඉතා යහපත්.**

ඉහ කී සූත්‍රානුසාරයෙන් 1. ප්‍රථම ධ්‍යානය වඩානම් යන ස්ථානයට 2. ද්විතීය ධ්‍යානය වඩා නම් 3. තෘතීය ධ්‍යානය වඩා නම් 4. චතුර්ථ ධ්‍යානය වඩානම් 5. මෙත්තා චේතෝ විමුක්තිය වඩානම් 6. කරුණාඥතා විමුක්තිය වඩා නම් 7. මුදුතා චේතෝ විමුක්තිය වඩානම් 8. උපේක්ෂා චේතෝ විමුක්තිය වඩානම් 9. සතිපට්ඨාන සූත්‍රයේ පෙන්වා වදාළ 18 වැදෑරුම් කායානු පස්සනාව එකක් එකක් සේ ගෙන වඩානම්, නව විධ වේදනානු පස්සනාව වඩානම්, හෝ දස විධි චිත්තානු පස්සනාව වඩානම්, පංචනීවරන ආදී ධම්මානු පස්සනාව වඩානම්, සතර සම්‍යක් ප්‍රධානයන්ට අයත් සතර ආකාර වෙන වෙනම වඩානම්, සතර සෘද්ධි පාදවලට අයත් චන්ද වඩානම්, චිත්ත වඩානම්, විරිය වඩානම්, විමංසා වඩානම්, පංචේන්ද්‍රියට අයත් ශ්‍රද්ධා ඉන්ද්‍රිය වඩානම්, වීර්ය ඉන්ද්‍රිය වඩානම්, සතින්ද්‍රිය වඩානම්, සමාධි ඉන්ද්‍රිය වඩානම්, පඤ්ඤා ඉන්ද්‍රිය වඩානම්, ශ්‍රද්ධා බල වඩානම්, වීර්ය බල වඩානම්, සති බල වඩානම්, සමාධි බල වඩානම්, ප්‍රඥා බල වඩානම්, සප්ත භොජ්ජංගවලට අයත් සති සම්භොජ්ජංගය වඩානම්, ධම්ම විචය වඩානම්, ප්‍රීති වඩානම්, පස්සද්දි වඩානම්, විරිය වඩානම්, සමාධි වඩානම්, උපේක්ෂා වඩානම්, සම්මා දිට්ඨි වඩානම්, සම්මා සම්කප්පය වඩානම්, සම්මා වාචා වඩානම්, සම්මා කම්මන්ත වඩානම්, සම්මා ආජීව වඩානම්, සම්මා වායාම වඩානම්, සම්මා සති වඩානම්, සම්මා සමාධි වඩානම්, සප්ත අභිඥා වඩානම්, වෙන වෙනම දස කසින වඩානම්, දස අසුභ වෙන වෙනම වඩානම්, ආහාරයේ පටික්කූල සංඥා වඩානම්, දස සංඥා වෙන වෙනම වඩානම්, දස අනුස්සති වෙන වෙනම වඩානම්, ඒ ඒ ධ්‍යාන සහගත වූ සද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා යන ඉන්ද්‍රිය ධර්ම වෙන වෙනම වඩානම්, සතර බ්‍රහ්ම විහරණ සහිත පංචේන්ද්‍රිය, පංච බල වෙන වෙනම වඩානම්, මේවා එක එකක් පමණක් අසුරු සැනක් ගහන මොහොතක් වඩන භික්ෂුව බුදුරදුන්ගේ සාස්තෘ සාසනය කරන්නෙකි, අවවාද පිලිපදින්නෙකි, ණය නොවී රට වැසියා දෙන සිව්පසය වලඳන්නෙකියි බුදුපියාණන් වහන්සේ වදාරා, වැඩිමනත් කරන්නේ නම් කවර කතා දැයි භික්ෂූන් අස්වසා වදාරා තියෙනවා.

මෙසේ අච්චරා සංඝ වර්ගයට අයත් සුළු සූත්‍ර සංඛ්‍යාව නිසි පරිදි සුදුසු සූත්‍ර කැටි කරගත් ක්‍රම 182 ක් බව සඳහන් වෙනවා. මුලදී පෙන්වූ ආකාරයට අධි දූෂ්‍යතාවයන්ට පත් නොවී භික්ෂූන් ලඟ ඉහත කී ගුණ මාත්‍රයක් තිබේදැයි විමසා බැලීම වටිනවා. හැකි උපරිම අයුරින් සාසන ගුණ වැඩීමට උනන්දු වීම බුදු සසුන, සඟ සසුන නිරුපද්‍රිතව බොහෝ කලක් පවතින්න හේතු වෙනවා.

මෙහි නිසි තතු නොදැන අග්ගික්ඛන්දෝපම සූත්‍රය තමන්ගේ අදහස් පරිදි විග්‍රහ කර, සංඝ සමාජයටම බොහෝවිට දෝෂාරෝපන එල්ල කරන්න හිතන අය ඉන්නවනම්, ඒක ශාසන දියුණුවට නෙවෙයි, නොකල්හි ශාසනය අන්තර්ධාන කරවන්නට අනුබල දෙන කටයුත්තක් තමන්ගේ නොදැනුවත්කම නිසා කරගත්තා විය හැකිවා පමණක් නෙවෙයි, ඒ දෘෂ්ඨි ගතවීම තම තමන්ටත් අපාගත වෙන උපවාදයක්ද විය හැකි නිසා, මේ වගේ සූත්‍ර ප්‍රවේසමෙන් විග්‍රහ කිරීමත් නුවණට හුරුයි.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**වෑබඩ සිරිසේන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 16 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** ◆ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ. ◆ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම. ◆ සමන් සිල්වා මහතා - නාගොඩ, කළුතර. ◆ ඩී.සී.ආර් ඇක්සස් ලංකා මුද්‍රණාලයේ චන්දිම පෙරේරා මහතා ඇතුලු කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ. ◆ එස්. එම්. ජයසේකර මහතා - මාලබේ. ◆ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය. ◆ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව. ◆ වෑබඩ සිරිසේන මහතා - කඩවත ◆ ඒ. එම්. ධනරත්න අල්විස් මහතා - පැපිලියාන. ◆ එරන්දි ජයකොඩි මහත්මිය - පන්නිපිටිය. ◆ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ◆ නන් අයුරින් දායක වූ පිංවතුන්

**මූල්‍යමය දායකත්වය** ◆ ජයන්ති අත්තනායක මහත්මිය ඇතුළු පවුලේ සැම - මෙල්බන් නුවර, ඕස්ට්‍රේලියාව - රු.50,000/- ◆ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල-රු.20,000/- ◆ රාජ් නිල්මිණී විජේවික්‍රම මහතා ඇතුළු පවුලේ සැම - ගොඩගම- රු.10,000/- ◆ සමන් සිල්වා මහතා - කළුතර-රු.10,000/- ◆ රංගා රත්නවීර මෙනෙවිය - එඩ්මන්ටන් ,කැනඩාව-රු.10,000/- ◆ අමිත් හඳුගොඩ මහතා -අත්තිඩිය-රු. 5,000/- ◆ ඔස්ටින් ප්‍රනාන්දු මහතා සහ සිසිර සිරිවර්ධන මහතා - පොල්ගහවෙල-රු. 5,000/- ◆ රංග ගමගේ මහතා සහ වාසනා බෙල්පගේ මහත්මිය ඇතුළු පවුලේ සැම - වීරකැටිය- රු. 4,000/- ◆ නෙළුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කැලුම් ලංකේෂ්වර මහතා ඇතුළු පවුලේ සැම-රු. 3,500/ ◆ ඉසුරිකා ගුණසිංහ මෙනෙවිය - පුස්සැල්ල-රු. 3,100/- ◆ පූජ්‍ය බුලත්සිංහල සමිත හිමි - තලගල ආරණ්‍ය සේනාසනය-රු. 3,000/-බිනඳ සුදුසිංහ පුතා ඇතුළු පවුලේ සැම - පානදුර-රු. 2,500/- ◆ ඉන්ද්‍රානි හෙට්ටිආරච්චි මහත්මිය - අත්තනගල්ල-රු. 2,000/- ◆ එච්.ඒ.ඩී.සී.කුමාර මහතා - ඇස්වත්ත-රු. 2,000/- ◆ කෝෂලා සිරිවර්ධන මෙනෙවිය - ගාල්ල-රු. 2,000/- ◆ ඉන්ද්‍රානි විශාඛා ජයසිංහ මහත්මිය - බොරලැස්ගමුව-රු. 2,000/- ◆ මානෙල් කටුගම්පල මහත්මිය - මහරගම-රු. 2,000/- ◆ පී.වී. පද්මසිරි මහතා - කිතුල්ගල - රු. 2,000/- ◆ බී.කේ. රත්නවතී මහත්මිය - වලස්මුල්ල-රු. 2,000/- ◆ සිරිපාල අබේවික්‍රම මහතා ඇතුළු පවුලේ සැම - මොරවක-රු. 1,500/- ◆ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල-රු. 1,500/- ◆ ජනිඳු තරංග පුතා සහ දෙව්මි තාරකා දුව - නෙළුව- රු. 1,500/- ◆ රේණුකා ගුණරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 1,200/- ◆ ඉරේෂා උදුලමාලි ඇන්ඩෲ මහත්මිය - හෝමාගම-රු. 1,000/- ◆ විනයරත්න මහතා - බෝගහවත්ත - රු. 1,000/- ◆ ප්‍රේමචන්ද්‍ර විතානගේ මහතා ඇතුළු පවුලේ සැම - හෝමාගම-රු. 1,000/- ◆ ප්‍රසන්න සිල්වා මහතා - ගල්කිස්ස-රු. 1,000/- ◆ අනුරාධි සිරිවර්ධන මහත්මිය - හොරණ-රු. 1,000/- ◆ එම්.එල්.එම්.සුමනසිරි මහතා - වේවැල්දෙණිය-රු. 1,000/- ◆ රූපවතී රුද්‍රිගු මහත්මිය - පිටිපන-රු. 1,000/- ◆ එච්.පී විජේරත්න මහතා - කිරුලපන-රු. 1,000/- ◆ විමලා සේනාරත්න මහත්මිය - හෝකන්දර - රු. 1,000/- ◆ තිලකා තිරිමාන්න මහත්මිය - බොරලැස්ගමුව-රු. 1,000/- ◆ අජිත් නෙලන්ජන් පෙරේරා මහතා - දෙහිවල-රු. 1,000/- ◆ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල-රු. 1,000/- ◆ එච්.කේ. උපුල් කරුණාතිලක මහතා - කළුතර-රු. 1,000/- ◆ ඥානා ටී. ගමගේ මහත්මිය - හක්මන-රු. 1,000/- ◆ ශශිකා කරවිට මහත්මිය - හෝමාගම-රු. 1,000/- ◆ රංජිත් වික්‍රමසිංහ මහතා - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා - කළුතර, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මත්මිය - නිට්ටඹුව, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, සුභාෂිනී අබේරත්න මහත්මිය - වත්තල රු. 8,500/- ◆ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග - රු. 169,300/- ◆ පළමු පිටපත් 7000 ක් සඳහා මුද්‍රණ වියදම - රු. 175,000/- ◆ අනෙකුත් වියදම් - රු. 4,450/- ◆ සම්පූර්ණ වියදම - රු. 179,450/- ◆ මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා!**

**එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්‍ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**
**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ,**
**අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව,**
**දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ**
**අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද**
**නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත**
**බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net www.nirvanadhamma.com mp3.hiddendhamma.net www.helabodhupiyuma.net

www.aaryadharma.org විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අ:- 071 3046895

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.




සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා පැවැත්වෙන සදහම් වැඩසටහන් මාලාව සජීවීව විකාශනය කෙරෙන අන්තර්ජාල ගුවන් විදුලි සේවාවට සවන්දීම සඳහා www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ ''දම් සහා ගුවන් හඬ''ට පිවිසෙන්න.



# ලෝ දම් අභිබවා ගිය

# මනු නීතිය

එක් වරදකට දෙවරක් දඬුවම් විඳින
යක් නීතියක් නොමනා බව ගනු හැඳින
දක්නට තියෙන දේ මස් ඇසකින් මෙදින
මක් කොරනද නොදුටුවොත් පරලොව සොඳින

මිනිසත් බවක ඇති මා හැඟි වටිනකම
දනිහොත් යමෙක් නැණසින් හැම මොහොතකම
ගිනිගත් සසර තතු දුටු හැම මිනිසෙකුම
තනිවත් හොඳයි නොකියයි පර පණ නැසුම

යහපත කරන අටියෙන් දඬුවම් දීම
පහ කළ විටදී පණ නැත එය ඉටු වීම
දහමට එකඟ නැති පර පණ සිඳ ලීම
වහ ගනු බැරි පවකි නැත ඉන් සැනසීම

මරණින් දඬුවමක් දෙන නීතියක් හදා
වරමින් හිමි දිවිය නැසුවත් පවක් වදා
පෙර පින් වෙතොත් මොන වරදක් කළත් මෙදා
හැර ඒ දොසින් දම් දුටුවොත් නිවෙත් සදා

නියකින් කැඩිය යුතු දේ පොරවෙන් කපන
තැනකින් නිමවෙනා විසඳුම් වෙයි නොමන
එතෙකින් නොවිසඳී මතුවට ඉන් හැදෙන
දොසකින් දුකම එයි ලබනා තෙක් නිවන

කම් එල ගෙනෙන දම් නියමය පසෙක තියා
සම්මත කරන් හිතු මතයට නොයෙක නියා
නම් කර සතන් පෝරකයට වරද කියා
නිම් නැති සසර ගනුදෙනුවකි ගොඩට නොයා

අංගුලිමාල මහ නිරයට යන්න සිටී
පිං තිබු නිසා මොක් සුව දෙන දහම් දුටී
මංගල කරුණු අපහට කිව නොහැකි හැටී
දං ගෙඩියට වඩා මිනිසත් බවය වටී

ඛණකින් ලෝ දහම් වටහා දුනොත් එන
පිනකින් ගොඩ දමා යහපත කරන තැන
සැනකින් වෙනස් කළ හැක ලෝ සතගෙ මන
අණකින් පලි අරන් ලබනා එලද මොන

පබැඳුම - හිසිඳු චන්දන සිරිවර්ධන

# දළඳා හාමුදුරුවනේ.....



අලි ඇත්තෙකුව උපනත් කරුමයට  අනේ
යළි පෙර සසර හුරුකම් හදවතට  දැනේ
මැළි නැත සමිඳු වැඳුමට අත් ඉහළ  වුණේ
පිළිගනු මැනවි දළඳා  හාමුදුරුවනේ

මේ සා විසල් සිරුරක බර උහුල  ගෙන
පාසා වසක් පෙරහැර කෙරුවයි  බැතින
බාසා නොදත්තත් තෙපලන්නට  වදන
දෝසා බවක් යළි නේවා දුක  හදන

මට ඇති ගරු සරුව දළඳා සමිඳු  කෙරේ
කට ඇර කියන්නද කෙලෙසක ලැබුව  වරේ
යට ගිය දවස සිටි පින්වත් පිරිස  තුරේ
නට නට මමත් ඉන්නට ඇති සසර  තෙරේ

තිරිසන් වුණත් ගරු කටයුතු සතෙක්  වෙලා
සිරිතෙන් පෙර වැඩූ කටයුතු මමත්  කළා
පිරියෙන් බෙර දවුල් හඬ මැද නොගොස්  පලා
දිරියෙන් වඳිමි සමිඳුනි මතු නිවන්  බලා

ඇති අය ලෙසට ලොකුකම කියමින් පෙර  දා
නැති බැරි අයව පහතට දමමින් වෙර  දා
ගැති කළ නොදහමේ කම් එල යළි  පරදා
බැති සිත නැගේවා තිරිසන් සිත  හැරදා

නේවා හඬ ඇසී සමිඳුන් වෙතට  එමී
පෑවා දෑත ඔසවා ගුණයටම  හිමී
නේවා යළි මෙලෙස තිරිසන් සසර  බැමී
වේවා මේ පිදුම මතු නිවනටම  නැමී

පබැඳුම - නිශිඳු චන්දන සිරිවර්ධන



නිශිඳු චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල විහාර පාරේ අංක 98/A දරණ ස්ථානයේ පිහිටි ... මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.